2023 ජූලි-දෙසැම්බර්

ISSN 2961-5003

**අධීක්ෂණය**
අයි. එම්. අයි. ඉලංගකෝන්
අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිළධාරී

**මෙහෙයවීම**
අජිත් අමරකීර්ති
අධ්‍යක්ෂ (අධ්‍යාපන හා සංවර්ධන)

**දිලීපා පියදාස**
ලේඛකාධිකාරී

**ප්‍රධාන සංස්කාරක**
ධම්මික වීරකෝන්

**සහය සංස්කාරක**
ලක්මිණි අත්තනායක
චරිත් අමරසේකර

**සෝදුපත් කියවීම**
දිනූෂ දිසානායක

**පිට කවරය**
ඉන්දික අතුරලියගේ

**පිටු සැකසීම**
අසංග ඉන්ද්‍රජිත් අහංගම

**මුද්‍රණය**
ජාතික සමුපකාර සංවර්ධන ආයතන මුද්‍රණාලය

**ප්‍රකාශනය**
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල

**දුරකථන**
+94 81 249 8679/ +94 81 249 8680/ +94 81 250 0378
**ෆැක්ස්:** +94 81 249 9741
**විද්‍යුත් තැපෑල:**
nawapivisuma.nicdmzin@gmial.com
**වෙබ් අඩවිය:**
www.ncd.edu.lk

**නෙත් විවිර..**
අසංක වීරසිංහ: සාමාන්‍යාධාකාරී, මාතර දිස්ත්‍රික් සණස සමිති සංගමය

**ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙහි පසුබිම හා තත්කාලීන අභියෝග**
ආචාර්ය ඩී.එම්.ටී. දිසානායක: ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ, විශ්‍රාමික අධ්‍යක්ෂ අධ්‍යයන හා සංවර්ධන

**An Economic Contribution of Cooperatives in Sri Lanka**
R.M.D.H Rathnayake: Assistant Registrar, NICD

**ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය සහ සමුපකාරය**
ධම්මික වීරකෝන්: ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

**A call for collective approach: Agriculture Cooperatives for bright future**
P.M.D.W.D.Pallawala: Registrar, NICD

**වසර 101 ඉක්වන ජාත්‍යන්තර සමුපකාර දින දී සමුපකාරය ආවර්ජනයට පෙරවදනක්**
සුරේන්ද්‍ර ඩී. බුලත්සිංහල: අපේ සමුපකාර ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී එකමුතුවේ, ප්‍රධාන ලේකම්

**Global Challenges in the Co-operative Movement: Overcoming Obstacles for a Sustainable Future**
Dinusha Dissanayake: Assistant researcher, NICD

**ජාත්‍යන්තර සමුපකාර සංධානය සහ ජාත්‍යන්තර සමුපකාර දිනය (ICA & Coops Day)**
චරිත් අමරසේකර: සහකාර කථිකාචාර්ය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

**සමුපකාර ග්‍රාමීය බැංකු සඳහා මහජන සම්බන්ධතා වැදගත් වන්නේ කෙසේද?**
එම්. උදිත නිලංග ගමගේ: සී/ස වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය

**සමුපකාර සමිතියක් දෙපයින් නැගී සිටිමට කොටස් ප්‍රාග්ධනය අවම වශයෙන් ප්‍රශස්ත මට්ටමින් වර්ධනය කරගත යුතුයි.**
ජයලත් දිසානායක: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, මහනුවර

**මා ලද අත්දැකීම්: අර්ධ ශත සංවත්සරයක සමුපකාර දියුණුවද මේ**
ආර්.බී. පරණගම (උපුටා ගැනීම: සමුපකාර සිසු හැගුම්: ප්‍රථම කලාපය, 1958 මැයි-අගොස්තු

# අභිමානවත් 101 වන ජාත්‍යන්තර සමුපකාර දිනය සමරමු

සියවසකට ආසන්න කාලයක් පුරා ශ්‍රී ලාංකීය ජන සමාජයේ උන්නතිය උදෙසා සුවිශේෂී ප්‍රතිපත්ති හා ආචාරධර්ම අනුව ක්‍රියාත්මක වන සමුපකාර ව්‍යාපාරය වෙළඳපොළ අභියෝග හමු වේ, තම අරමුණු ළඟා කරගැනීමට ප්‍රජාව සවිබල ගන්වමින් ඔවුන්ගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අවශ්‍යතා ඉටුකිරීමට කැප වී සිටී.

ආත්මෝපකාරය හා අන්‍යෝන්‍යාධාරය සේවයට කැපවීම සමුපකාර ක්‍රමයක ඇති වැදගත් ගුණාංග වේ. සමුපකාරයේ පරමාර්ථ වන්නේ එම සංවිධානයට සහභාගිවන සාමාජිකයන්ගේ නැතිනම් ප්‍රජාවගේ අවශ්‍යතා පිරිමසාලීමයි. නූතනයේ දී දැනුම කේන්ද්‍රීය ආර්ථික සංවර්ධන මාවතක ගමන් කරන ශ්‍රී ලංකාවේ සමුපකාර සංවර්ධනය මඟින් මානව සම්පත් සංවර්ධනය සඳහා නව තාක්ෂණය ඇතුළු දැනුම් සම්භාරයක අව්‍යශතාව විමර්ශනයට ලක් කිරීම වැදගත් වේ.

සමුපකාර සංවර්ධනය කෙරෙහි සමුපකාරික ප්‍රජාව සතු දැනුම සමුපකාරය ප්‍රජාව අතර ප්‍රචලිත කිරීමත් එහි ඇති අඩුලුහුඬුකම් පූර්ණය කිරීමක් වශයෙන් සඳහන් කළ හැකි ය. 1844 දී සමුපකාර ව්‍යාපාරය විධිමත් අයුරින් ආරම්භ වන්නේ එංගලන්තයේ රොච්ඩේල් නගරය කෙන්ද්‍ර කරගෙන පිහිටවනු ලැබූ වූ සාධරණත්වයේ පූරොගාමීන්ගේ සමාජය මගිනි. මෙම සමුපකාර ව්‍යාපාරයේ පීතෘවරයා ලෙස සලකන්නේ රොබට් ඕවන් මහතාය. 1922 එක්සත් ජාතින්ගේ සංවිධානය ජාත්‍යන්තර සමුපකාර දිනය ප්‍රකාශයට පත් කළ අතර එතැන් සිට සෑම වසරකම ජුලි මස පළමු සෙනසුරාදා දිනය ජාත්‍යන්තර සමුපකාර දිනය යෙදී තිබේ. 1922 සිට ගොලිය සමුපකාර සන්ධානය විසින් සමුපකාරය පිළිබඳ දැනුවත් කිරීම හා සමූපකාර දැනුම වර්ධනය කිරීමත් එය පදනම්ව ජාත්‍යන්තර සහයෝගිතාවය, ආර්ථික කාර්යක්ෂමතාවය, සාමානාත්වය, හා ලෝක සාමය ප්‍රවර්ධනය කිරීම අරමුණින් ජත්‍යන්තර සමුපකාර දිනය ප්‍රකාශයට පත්කර ඇත. ජත්‍යන්තර සමුපකාර දිනය ප්‍රකාශයට පත් කිරීමේ තවත් අරමුණක් වන්නේ ජත්‍යන්තර සමුපකාර ව්‍යාපාරය සමඟ බද්ධ වෙමින් ප්‍රාදේශීය, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ රාජ්‍ය සහ අනෙකුත් සංවිධාන අතර පවත්නා සම්බන්ධතාවය තවදුරටත් ශක්තිමත් කිරිමත් හා ප්‍රවර්ධනය කිරීමයි.

ඒ අනුව මෙවර 2023 දී 101 වන ජත්‍යන්තර සමුපකාර දිනය සමුපකාරය සංවර්ධකය සඳහා තිරසර සංවර්ධනය යන තේමාව යටතේ සැමරිමට කටයුතු කර ඇත. තිරසරභාවය ( sustainability ) යනු අනාගත පරම්පරාවට තම අවශ්‍යතාවයන් සපුරාලීමට කිසිදු බාධාවක් නොවන ආකාරයට වර්තමාන පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනිම සඳහා භිග සම්පත් ඵළදායි ලෙස උපයෝජනය කිරිමයි. තිරසර

සංවර්ධනය යන්න පුළුල් ලෙස අර්ථ දැක්වෙන්නේ අනාගත පරම්පරාවට තමන්ගේ අවශ්‍යතා සපුරාලීමේ හැකියාවට හානි නොවන ලෙස වර්ථමාන අවශ්‍යතා සපුරාලන සංවර්ධනය ලෙස ය. නමුත් බැලූ බැල්මට බොහෝ මිනිසුන් තිරසර සංවර්ධනය පරිසරයට සීමා කලත් , එය සමානව සමාජ සංධරණත්වය හා ආර්ථික සංවර්ධනය තුළ මුල් බැසගෙන ඇත. තිරසර සංවර්ධනය යනු පාරිසරික , සමාජීය හා ආර්ථික යන ත්‍රිත්ව මානයෙන් සුසංයෝජනය වූ දිගුකාලින තිරසර සමෘද්ධියක් ලබා ගැනිම සඳහා වූ එක්බද්ධ ප්‍රවේශයකි. ඒ අනුව මෙවර 2023 ජත්‍යන්තර සමුපකාර දින තේමාවට අනුව සමුපකාර ව්‍යාපාරය අනාගත පරම්පරාවට තමන්ගේ අවශ්‍යතා සපුරාලීමේ හැකියාවට හානි නොවන ලෙස වර්ථමාන අවශ්‍යතා සපුරාලන සංවර්ධනය ලෙස සමූපාරය ව්‍යාපාරය තිරසර ලෙස සංවර්ධනය කර ගැනිමට හැකිවේවා යැයි ප්‍රර්ථනා කරමු.


**ප්‍රධාන සංස්කාරක**

1

# නෙත් විවර...

## අසංක වීරසිංහ

සණස ව්‍යාපාරයේ හා සමුපකාරික ව්‍යාපාරයේ තිබිය යුතු "සමුපකාරික අනන්‍යතාවය" සහ ඒ තුළ අන්තර්ගතව ඇති වටිනාකම් මෙන්ම අසහාය වු ගුණාංග රැක ගන්නා තෙක් අපිට "අපි" විය හැකිය. ඉන් මිදෙන තරමට හා දුරස්වන තරමට "අපි කවුද" යන්න අපිටම අමතක වී ඇත. අමතක ද වනු ඇත.



එවන් අවස්ථාවක අපගේ මූලික හරය සොයා යාම වෙනුවට, ඉන් බැහැරව දිවෙන කරුණු පිටපසු යමින් සිටිනු ඇත. එය සමුපකාරික ව්‍යාපාරයේ දියුණුවට මහත් වු බාධාවකි. එහෙත් එය කිසියම් පාර්ශවයක / කණ්ඩායමක / පුද්ගලයෙකුගේ පෞද්ගලික ලෙස ගොඩනැගෙන දියුණුවකට යහපත් පෝෂණයක් විය හැකිය. එසේ වුවත් සමුපකාරය තුළ ඇත්තේ පෞද්ගලිකත්වය අභිබවන ලද සාමුහිකත්වයකි. ''එම අරමුණු මත - එකිනෙක ආයතනික ව්‍යුහයන්ට සම ක්‍රියා කළ හැකිද? යන ප්‍රශ්නාර්ථය පවති. එනම්, සමුපකාරික ප්‍රතිපත්ති සහ ආචාරධර්ම, සාරධර්ම රකිමින් විවිධ ක්ෂේත්‍ර

''ව්‍යාපාරික තත්වයන් මනාව හඳුනාගෙන උපාය මාර්ගික ලෙස කටයුතු කිරීම සමග ව්‍යාපාරික අචාරධර්මද රැකගත යුතුය.''

- **Bentham – 1923 -**

එකී වාක්‍යයේ හරය රැකගත හැකි ආකාරයෙන් තම සමුපකාරික කටයුතු හසුරවාලීමේ සිතුවිල්ල පෙරදැරි කර ගනිමින් මෙම ලිපි පෙළ ආරම්භයේ සිටම කියවන ලෙස අපේ පාඨක පිරිසට ගෞරවයෙන් ආරාධනා කරමු.

''නෙත් විවර" නමින් අඛණ්ඩව සම්බන්ධතාවය සහිතව ඔබ වෙත දැනුම - අවබෝධය - අත්දැකීම් බෙදා හදා ගැනීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂක ජෙනරාල් තුමියතටත්, අධ්‍යයන අධ්‍යක්ෂකතුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිළධාරී මණ්ඩලටයත්, පුස්තකාලාධිපති තුමාටත්, මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි. ''නෙත් විවර'' තේමා පාඨය නිර්මාණය කළ අප සංගමයේ සැළසුම් හා ව්‍යාපෘති නිළධාරිනියට ද ස්තුතිය පිරිනමමි.

මෙම ලිපි පෙළ තුළින් සණස සමිති ව්‍යාපාරයට මෙන්ම, සමස්ථ සමුපකාරික ව්‍යාපාරයට හා එහි නිරත නායක, සේවක, සාමාජික පාර්ශවයන්ට ධනාත්මක වූ අදහසක් සැපයීම අභිප්‍රාය වන බවද සිහිපත් කරමු.

**''අපි, අපි වෙමු''**

තුළ තම ව්‍යාපාරික හා සේවා හසුරවාලීමේ ගැටළුව ප්‍රායෝගිකව දැකිය හැකිවන බව පෙනී යයි. ඒ පිළිබඳව කිසියම් දුරකට කරුණු සාකච්ඡා කිරීමට ඉදිරි කලාපයන් හරහා අපේක්ෂා කරනු ඇත.

සංවිධානයක ප්‍රධාන සංරචක 03 ක් දැකිය හැකිවේ.

I. පුද්ගලයින් - (People)
II. අරමුණු - (Objective)
III. අන්තර් ක්‍රියා - (Interaction)

1972 අංක 5 දරන සමුපකාර පනත යටතේ ලියාපදිංචිය ලැබූ සමුපකාර සමිති වෙත නෛතික පුද්ගලභාවය ඇති බැවින්, සමිතියේ නාමය භාවිතා කරමින් ඕනෑම නීතිමය කාර්යයකට ඉදිරිපත් වීමට හැකියාව ලැබී ඇත. එම බලවත් ගුණාංගය හිමි සමුපකාර සමිතිවල ප්‍රධානතම පාර්ශවය සාමාජිකයාය. එම නිසා නෛතික විධිවිධාන යටතේ සමිති කටයුතු පවත්වාගෙන යාමට ගරු සභාපති ප්‍රමුඛ ගරු කාරක සභාවත්/ගරු අධ්‍යක්ෂක මණ්ඩලයත් වෙත භාරකාරිත්ව වගකීමක් පවරනු ලබයි. එකී වගකීම පවරන්නේ සමුපකාර සමිතියේ කටයුතු වඩාත් නිවැරදිව - විනිවිදභාවයෙන් යුතුව - අවංකව - අන්‍යයන් රැකබලා ගැනීමේ අවශ්‍යතාවය ඉටු කිරීම උදෙසා මිස තම තමන්ගේ රිසිතාවයන් හෝ සිතැගි හෝ පෞද්ගලික අපේක්ෂාවන් ක්‍රියාත්මක කිරීමට නොවේ. එකී තත්ත්වය තුළ විවිධ ක්‍රියා කලාපයන් විවිධ වූ සමුපකාර සමිති තුළින් නිරූපනය විය හැකිය. මන්ද යත් එකී කාර්ය ඉටුකිරීමට එක් එක් ගරු නායකයින් ගනු ලබන ක්‍රියාමාර්ග එකිනෙකට වෙනස් නිසාය.

ඉහත කී පොදු අරමුණු පවත්වා ගැනීමට කිසිඳු සමිතියකට කිසිදු බාධාවක් නොමැත. එහෙත්, පොදු අරමුණු බැහැර කර ගනිමින් ක්‍රියාකරන අවස්ථාවක, එවන් ආයතනයක ක්‍රියාවන් පොදුකර ගැනීමට උත්සාහ දරන්නේ නම් හෝ පොදු අරමුණක පිහිටා කටයුතු කරන බවට පෙන්නුම් කිරීම වෙනුවෙන් ආයාසයක් දරනු ලබන්නේ නම්, ඒ තුලින් සිදුවන්නේ තම අනන්‍යතාවය ගිලිහි යාමයි.

එමෙන්ම, සමූපකාරික වශයෙන් අවශ්‍ය වන්නාවූ ක්‍රියාදාමයන් මොනවාද.. නැතහොත් ගෝචරවන කාර්යපටිපාටින් මොනවාද? යන්න සම්බන්ධයෙන් විවිධ මතවාදයන් පවතී. එබැවින් අනන්‍යතාවය ගිළිහියාම වෙනුවට අනන්‍යතාවයක් හඳුනාගත නොහැකි තත්ත්වයට පත්වීම, වුවද සිදුවිය හැකිය. එබැවින්, ක්‍රියාවන් පොදු නොවීමේ ප්‍රතිඵලය ලෙස අනෙකුත් සංවිධාන වලින් වෙන්වූ ප්‍රතිරූපයක් හා අනන්‍යතාවයක් ඒ ඒ සංවිධානයනට හිමිවනු ඇත.

## ස්වාර්ථය මගින් පමණක් අරමුණු දිනාගත හැකිද..?

අප විසින් සාමුහිකත්වයේ වැදගත්කම හඳුනා ගැනීමට උත්සාහ ගතයුතුය. සැබෑ සමුපකාරික ගුණාංග ආරක්‍ෂාකර ගතහැකි වන්නේ සාමුහිකත්වය රැකගනිමින් ප්‍රජා කේන්ද්‍රීය වැඩසටහන් හසුරුවාලීම තුළ වන බව සාමාන්‍ය පොදු පිළිගැනීමයි. සංවිධානයක් ලෙස ක්‍රියා කරමින් සමිතියේ අරමුණු දිනා ගැනීමට ගන්නා උත්සායන් නිසි පරිදි කළමණාකරණය කරගත යුතු බවද අප තේරුම්ගත යුතුය.

''උත්සාහ කිරීම" යන්න පොදු ක්‍රියාවකි. එය ඕනෑම අයෙකුට සිදුකළ හැකි කාර්යයකි. එහෙත්, සංවිධානයක් ලෙස අවශ්‍ය වන්නේ **"කළමනාකරණය කළ උත්සාහයක්"** ක්‍රියාවට නැංවීමයි. එනම් "උත්සාහය" වඩාත් ඵලදායක හා කාර්‍යක්ෂම කරලීම තුලින් එය "කළමණාකරණය"


කිරීමයි. එහිදි කළමණාකරණ තොරතුරු පද්ධතිය (Management Information system – MIS) ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරන බැවින් සමිතියේ දත්ත හා තොරතුරු ලිපිලේඛන, වාර්තා, ගිණුම් ආශ්‍රිත සියලු ලේඛන, සමිති බල ප්‍රදේශ තොරතුරු, චක්‍රලේඛ තොරතුරු ආදිය හැකිතාක් නිවැරදිව රැස්කිරීම, ආරක්ෂා කිරීම, භාවිතා කිරීම යන කාර්යයන් කිරීම වැදගත්ය.

## "ව්‍යාපාර ආචාරධර්ම"

එමෙන්ම, ඕනෑම සංවිධානයක තම අරමුණු දිනා ගැනීමට ඒ සඳහා වන යහපත් පසුතලයක් තිබිය යුතුය. උදාහරණයක් ලෙස තේ කහට කෝප්පයක් සකසා ගැනීමට යාමේදී ඇල් ජලයට තේ කොළ යෙදීම නිශ්ඵලය. ඒ තුලින් සිදුවන්නේ තේ කොළ ප්‍රමාණයත්, ජලයත් යන දෙකම අපෙත් යාම පමණි. තේ කහට සාදා ගැනීමට ''උණු ජලය'' සමග '' තේ කොළ '' මිශ්‍ර කළ යුතුය. එහිදී ජලයේ ''උණු බව'' යනු ජලය සම්බන්ධව පැවැතිය යුතු යහපත් තත්වයකි. එවන් තත්වයන් ප්‍රායෝගිකව හඳුනාගෙන හා අවබෝධ කරගෙන ක්‍රියා කිරීම අතිශය වැදගත්ය.




එහිදී දිගුකාලීන ලෙස උපාය මාර්ගික ලෙස කටයුතු හසුරවාලීම අතිශය වැදගත් වන අතර, ''ව්‍යාපාර ආචාරධර්ම'' (Business Ethics) රැකගෙන එකී කාර්යයන් හසුරවාලීමට ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වේ. "සංවිධානගත ආචාරධර්ම" ඇතිවන ආකාරය පහතින් දැක්වේ.




ඒ පිළිබඳව කරුණු සාකච්ඡා කිරිමට ඉදිරි කලාපයන් හරහා අපේක්ෂා කරනු ඇත.

## "නව තාක්ෂණයට හුරුවෙමු."


ලෝකයේ තාක්ෂණික දියුණුව සමුපකාර ව්‍යාපාරයේ ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධ කර නොගතහොත් අනාගතයේ දී ඉතිරි වන්නේ සණස හා සමුපකාරික ව්‍යවසායකත්වය පිළිබඳ අතීත මතකයක් විය හැකිය.

ගෝලීය වශයෙන් වෙන්, වෙන් රටවල් සළකා බැලීමේදී, සමුපකාරික ගති ලක්ෂණ රෝපනය කිරීමට තරම් ආර්ථික සමාජීය වටපිටාවන් පෝෂණය නොවුනු සමහර රටවල්වල ද ඉතා සීඝ්‍ර දියුණුවකට පත්වන ව්‍යවසායකත්ව ක්‍රමයක් වන, සමුපකාරික ව්‍යවසායකත්වය, ශ්‍රී ලංකාව තුළ දී තරමක පසුගාමීත්වයට පත්වෙමින් පැවැතිම පිළිබඳ මුලු මහත් ශ්‍රී ලාංකික ප්‍රජාවම කණගාටු විය යුතුය.

ඔබගේ නිවසෙහි කිරිපිටි භාවිතයට ගනු ලබන්නේ නම්, සහ එය 'ඇන්කර්' කිරිපිටි වර්ගය වන්නේ නම්, ඔබ ගෝලීය සමුපකාරික අයතනයක භාණ්ඩයක් භාවිතයට ගෙන ඇත. එනම් 'ඇන්කර්' නිශ්පාදනය 'ෆොන්ටෙරා' නමැති සමුපකාරික ආයතනයේ නිපැයුමකි. ඔබ

‘ඉන්දුනිසියානු ලෙදර්’ නිපැයුමක් භාවිතයට ගන්නේ නම්, නොදැනුවත්ව හෝ සමුපකාරික ආයතනයක භාණ්ඩයක් භාවිතයට ගෙන ඇත.

එමෙන්ම, ශ්‍රී ලංකාවේ මෑත කාලීන ජනප්‍රිය මාතෘකාවක් බවට පත්වූ ‘නයිට්‍රජන් දියර පොහොර’ ලංකාවට සැපයුම් කිරීම සිදුකළේද ‘ඉෆ්කෝ’ නැමැති සමුපකාරික ආයතනයයි. එවන් උදාහරණ ඕනෑතරම් දැක්වීමට හැකියාව ඇත. එබැවින් සමුපකාරය යනු ගෝලීය වශයෙන් සහ - සම්බන්ධවන, ඉතා සීග්‍ර දියුණුවකට උරුමකම් කියන ව්‍යවසායකත්වයකි. එකී තැනට ලංකාවේ සමුපකාර ව්‍යාපාරයද පත්කිරීමට උපාය මාර්ගික වශයෙන් ක්‍රියාත්මක විම සහ ක්‍රියාත්මක කරලීම කිසිසේත්ම නොහැකි දෙයක් නොවේ.



ශ්‍රී ලංකාව තුලදි සමුපකාරික ව්‍යවසායකත්වය සාපේක්ෂව තාක්ෂණික දියුණුව දුර්වල හා පසුගාමීත්වයක් ලබා ඇත්තේ ඇයි ....? යන්න සලකා බැලීම අතිශය වැදගත් වනු ඇත. එහිදී දැනට පවතින තත්ත්වයන් මනාව අධ්‍යයනයකට ලක්කොට, හඳුනාගනු ලබන අඩුපාඩු නිවැරදි කර ගැනීම නිහතමානීව කළ යුතුය. මන්ද යත් නිවැරදිව අඩුපාඩු හදානොගෙන නිවැරදි වීමට කිසිවෙකුටත් හැකියාවක් නොමැති බැවිනි. ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යුහය දුර්වල වීමට බලපාන ලද හේතු සාධක අතරින් ඌන තාක්ෂණ භාවිතය (Lack of Technology ) යන්නට හිමිව ඇත්තේ ප්‍රධාන ස්ථානයකි.

ඕනෑම ආයතනයක් සාර්ථකත්වය කරා ගමන් කරවීම උදෙසා, සංවිධාන වෙනස, (Organizational Change) අත්‍යවශ්‍ය වේ. පෞද්ගලික ජීවිතය සාර්ථක කර ගැනීමට ද මෙම ‘වෙනස’ යන්න අත්‍යවශ්‍ය සාධකයක් වී ඇති බව හඳුනාගෙන ඇති අවස්ථාවක ආයතන ව්‍යුහයන්ට එය බැහැර කල නොහැක. එනම්, වෙනත් අයුරකින් දක්වන්නේ නම් සම්ප්‍රධාය කරපින්නාගෙන සිටිය නොහැකිව ඇත. මන්ද යත්, ව්‍යාපාරික පරිසර සාධක සෑම එකක්ම මොහොතෙන් මොහොත වෙනසට ලක් වෙමින් පවතී. බොහෝ සමුපකාරික ආයතන දක්වනු ලබන්නේ දේශපාලනික සාධක ඔවුන්ට අදාල නොවන බවයි. එහෙත් සමුපකාර ව්‍යුහයන්ට, දේශපාලනය අදාල නැතැයි කිව නොහැකිය. දේශපාලනික තීරණ, දේශපාලනික සංස්කෘතිය, දේශපාලනික දිශාව යනාදි දේශපාලනික සංචාරකයන් සෑම සංවිධානයකටම බලපවත්වනු ඇත. (උදා- සමුපකාර සමිති වලට බදු නිදහස ප්‍රධානය) ඊට අතිරේකව ආර්ථික සාධක වන උද්ධමනය, විනිමය තත්වයන් සේවා වියුක්ති හෝ නියුක්තිය, රුපියලේ අවප්‍රමානය, පොලී අනුපාතය, මූල්‍ය සාක්ෂරතාවය, ආදායම් බෙදීයාමේ විෂමතාවය, ඒක පුද්ගල ආදායම පුද්ගල ජීවන තත්වය වියදම් රටාව යනාදී සංචාරකයන් සෑම සංවිධානයකටම බලපවත්වනු ඇත.

ව්‍යාපාර කටයුතු සඳහා බලපෑම් ඇතිකරන සාධක අතරින්, ප්‍රබලතම බලපෑම ඇති කරමින් පවතින්නේ ‘තාක්ෂණයයි’. එය අනෙකුත් සෑම කරුණක් කෙරෙහි බලපෑම් ඇති කරමින් සිටින අතරම, ව්‍යාපාරික ලෝකය විසින් මෙන්ම, නූතන සමාජය විසින් වඩා වේගයෙන් තාක්ෂණික පහසුකම් ඉල්ලුම් කරමින් පවතී. එකී තත්වය තුල සමුපකාර සමිති ව්‍යාපාරයට තාක්ෂණය මගින් ඇතිකරන බලපෑම වඩාත් ඉහල මට්ටමක් ගනු

ලබන බව පැහැදිලි කරුණකි. තවදුරටත් එහි බලපෑම වැඩිවනුයේ පෞද්ගලික ව්‍යවසායකත්වය තුලින් ඇති කරන තරගකාරී පීඩනයයි.

ඉතා අඩු වටිනාකම්වලින් මූල්‍ය සේවා සපයන ඉන්දියානු සමුපකාරික ආයතන 'මොබයිල් බැන්කින්' ක්‍රමය මෙන්ම 'සුන්‍ය ශේෂ ගිණුම්' ක්‍රමය **(Zero Balance Accounting)** ක්‍රියාත්මක කරමින් පවති. එනම්, තේ ඉඩම - පොල් ඉඩම - ඉපිලි වගා භූමිය - කෙසෙල් ඉඩම - සත්ව ගොවිපල - කර්මාන්ත ශාලාව (ගොවිබිම හා වැඩබිම) යන සෑම තැනැක්ම ආවරණය වන පරිදි ජංගම සේවා ඉතුරුම් රථ ක්‍රමය තුලින් තැන්පතු ලබා ගැනීමේ අවස්ථාව, ණය දීම හා තැනපත් කිරිමේ අවස්ථාව උදාකර දීම 'මොබයිල් බැන්ක්' ක්‍රමයේ අපේක්ෂාවයි. තාක්‍ෂණික වශයෙන් හඳුන්වා දුන් කාඩ් ක්‍රමය යටතේ ක්‍රියාත්මක මෙම ක්‍රමවේදය තුළින් (ATM system) සෑම අයෙකුම තම දෙපතුල ළඟට එන බැංකුවකට (**Door-step Banking**) සාමාජිකයා / පාරිභෝගිකයා ආදරය කරන්නට පටන් ගෙන ඇත. ඒ තුලින් අදාල සමුපකාරික ආයතනය සපයන සේවාවේ වටිනාකම (value) ඉහල ගොස් ඇත.




එපමණක් නොව පවුලේ උපදින සෑම දරුවෙකු වෙතම පලමු බැංකුකරු බවට පත්ව අත්තේ සමුපකාරික බැංකුවකුවකි. දරුවා ඉපදුන මොහොතේම ශේෂය බිංදුවක් වු (Zero Balance) ගිණුමක් විවෘත කිරිමටත්, බිලිදාගේ පලමු දිනය තුළ දීම දෙමාපියන් වෙත ගිණුම් අංකය හා පොත පිළිගැන්වීමට පහසුකම් සපයාගෙන තිබීමත් ඇති අතරම, එම ගිණුම් අංකය පුද්ගල අනන්‍යතාවය (Personal identity) සහතික කරන තවත් එක් මූලාශ්‍රයක් ලෙස භාවිතා කරමින්, දියුණු වූ තාක්‍ෂණික පරිසරයක් තුලින් ලෝකයේ රටවල් සමග සමුපකාරික ව්‍යුහයන් සමාජගත කර ඇත.

ශ්‍රී ලංකාවේ සමුපකාර නිති සම්පාදනයේ දී ආදර්ශයක් ලෙස යොදාගත්, ආසන්නයේ සිටින ඉන්දියාවේ සමුපකාර අයතනයන්හි අවම තාක්‍ෂණික යොදා ගැනීම එවන් තත්වයකට පත්කර ඇත්තේ, එකී ආයතනයන්හි ආර්ථික හැකියාවන්වල ශක්තිමත්ම නිසා නොවේද... නැතහොත් වෙනත් සාධකයක් හේතු කරගෙනද.. යන්න වෙනමමම සළකා බැලිය යුතු කරුණකි.

ගෝලිය අවශ්‍යතාවයන් හා පෞද්ලික යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය සමග තරගකාරිත්වයේ යෙදෙමින් තම පැවැත්ම සහතික කර ගැනීම උදෙසා එකී අයුරින් ක්‍රියා නොකල හොත්, පෞද්ගලික යාන්ත්‍රනය විසින් අනාගතයේ දී 'සමුපකාරය' ගිල ගැනීමෙන් වලක්වාගත නොහැකි වනු ඇත. එය වර්ථමාන පරම්පරාව තුළ දීම සිදු නොවුවත්, අනාගත පරම්පරාවන් තුළ සිදුවන නියත ධර්මයක් වනු ඇත. එනමුත්, පොදු පිළිගැනීම අනුව දිළිඳුකම පවතින තාක්කල්, මූල්‍ය සේවා සමුපකාර ක්‍රමය නොනැසි පවත්වා ගෙන යාමේ හැකියාව පවතින බවද පිළිගැනීමට සිදුවේ.

ශ්‍රී ලංකාවේ 'කඩදාසි රහිත බැංකු' (Paperless Baking) සංකල්පය ක්‍රියාත්මක වෙමන් පවතී. අද වනවිට සංවර්ධිත මට්ටමේ රටවල්, මුදල් රහිත ආර්ථිකයක්, ගොඩනැංවීම උදෙසා Digitalization සංකල්පය හදුන්වා දීමට අවශ්‍යකරන මූලික සාකච්ඡා පවත්වමින් පවති. එවන් වටපිටාවක් තුළ පෞද්ගලික යාන්ත්‍රනය




වේගවත්ව දියුණු වීම වැලැක්විය නොහැකි අතර, එමගින් සැලෙසන පහසුකම් තාක්ෂණික මෙවලම් ඔස්සේ ග්‍රාමීය මට්ටම කරා ගලායාමද වලක්වාලිය නොහැකිවනු ඇත. එය ඉතා අකමැත්තෙන් වුවද පිළිගැනීමට සිදුවූ සත්‍යයක් වනු ඇත. එනිසා අප අද සිටම සූදානම් විම සහ එකී වෙනසට හුරුවීම අත්‍යවශ්‍ය කරුණක් වන බව තේරුම්ගත යුතුව ඇත.

ආයතනගත ක්‍රියාවලිය මෙන්ම එකී පද්ධතිය පිළිබඳ සිතුවිලි (ගරු නායකත්වයේ හා කාර්ය මණ්ඩලයේ) එකවර කනපිට පෙරලිය නොහැකිය. එබැවින් ටිකෙන් ටික ආයතනයක ක්‍රියාවලිය මෙන්ම, අපේක්ෂිත සිතුවිලි වෙනස් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම අතිශය වැදගත් වනුයේ අදට නොව අනාගතයටයි. එබැවින් සියලුම සමුපකාරික සමිති නායකත්වයට හා සේවක මණ්ඩලයට මෙකී වෙනස කරා පියමං කිරීමට ආරාධනා කරමු. එහිදී 'වෙනස' යන්න ධනාත්මක හා ව්‍යාපාරික සංවර්ධනයට අවශ්‍ය වන වෙනසක් මිස පෞද්ගලිකත්වයන්ට නැඹුරු වූ සිතුවිලි වැඩි දියුණු කරන හෝ සාමූහිකත්වයන් බැහැර වන වාණිජවාදී වෙනසක් නොවන බවද අවධාරණය කරමු.

Reference;-

I. "Coop system in India" By Dr. Rajesh

II. "Principles of Management" By Shaman Udayanga

III. Newspapers in Sri Lanka

https://www.slideshare.net/Ramesh132787/paperless-banking

2

# ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙහි පසුබිම හා තත්කාලීන අභියෝග

ආචාර්ය ඩී.එම්.ටී. දිසානායක

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජයීය අර්බුද රාශියක් පැවති වකවානුවේ එකී ගැටළු විසඳා ගැනීම සඳහා එක් උපාය මාර්ගයක් වශයෙන් ඉංග්‍රීසින් විසින් මෙරටට සමුපකාර ව්‍යාපාරය හඳුන්වා දෙන ලදි. ඒ වර්ෂ 1911 දීය. එතැන් සිට මෙරට ක්‍රමයෙන් ගොඩනැගුන සමුපකාර ව්‍යාපාරයට අවශ්‍ය උපදේශනය හා මඟපෙන්වීම ලබාදීම සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට සමුපකාර සංවර්ධන නිලධාරීන් බඳවාගත් අතර පළමු කොට ඔවුන් ඉන්දියාවට යවා පුහුණු කරවා ගෙන්වා ගනු ලැබීය. එය දීර්ඝ වශයෙන් හා වඩාත් ඵලදායි අයුරින් සිදු කිරීමට පැවති අපහසුතායන්ට පිළියමක් වශයෙන් සමුපකාර සංවර්ධන නිලධාරීන් මෙරට තුළ ම පුහුණු කිරීම සඳහා සමුපකාර විද්‍යාලයක් මහනුවර කටුගස්තොට වත්තේගම මාර්ගයේ පොල්ගොල්ලේ දී පිහිටු විය. ඒ 1942 දීය. ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය නමින් හැඳින් වූ මෙම ආයතනය කැනේඩියානු රජයේ ආධාර උපකාර ඇතිව සංවර්ධනය කර 1945 දී එහි සේවය දීප ව්‍යාප්තව ආරම්භ කරන ලදි. මෙම විද්‍යාලය ස්ථාපිත වූ භූමියේ පිහිටි ස්වාභාවිකත්වයට හා පරිසර විද්‍යාත්මක වාතාරවරණයට බාධාවක් නොවන ලෙස එහි කාර්යාල සංකීර්ණය, දේශන ශාලා, විද්‍යාගාර, පුස්තකාල, නේවාසිකාගාර, නිලධාරි නිවසන, මුළුතැන්ගෙය, භෝජනාගාර, ආගමික මධ්‍යස්ථාන, විවේකාර ඇතුළු නේවාසික පුහුණුලාභීන්ගේ "පුහුණුව හා සංවර්ධනය" උපරිම වශයෙන් සාර්ථකව සිදු කළ හැකි ආකාරයට අවශ්‍ය වූ භෞතික පරිසරය නිර්මාණය කර සමුපකාර විද්‍යාලයේ කාර්යභාරය ආරම්භ කර ඇත. මුල් කාලවකවානුවේදී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට බඳවා ගත් සමුපකාර සංවර්ධන නිලධාරීන් පමණක් පුහුණු කිරීම සමුපකාර විද්‍යාලයේදී සිදු කළ අතර පසුකාලීනව මෙරට සමුපකාර ව්‍යාපාරයට සම්බන්ධ සමුපකාර සාමාජිකයින්, සමුපකාර සේවකයින්, සමුපකාර නායකයින් විභව සමුපකාරිකයින් සහ සමුපකාර ව්‍යාපාරයට සම්බන්ධිතව ඍජුව හා වක්‍රව දායකත්වය දක්වන රාජ්‍ය නිලධරයන් යනාදි සුවිශාල පුහුණුලාභීන් සංඛ්‍යාවක් පුහුණු කෙරෙන මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය ශ්‍රී ලංකාව තුල ප්‍රසිද්ධියක් ඉසලීය.

ලෝක සමුපකාර ව්‍යාපාරය 1844 දී මහා බ්‍රිතාන්‍යයෙන් ආරම්භ විය. මානව ශිෂ්ටාචාරයෙහි පැවැත්ම හා සංවර්ධනයට මෙම ව්‍යාපාරය පසුබිම් කරගත් දර්ශණය හා ඊට පාදක වූ සංකල්පීය ව්‍යුහය අතිශය වශයෙන් යෝග්‍ය වූ නිසාම බ්‍රිතාන්‍යවාසීන් පමණක් නොව යුරෝපය, ආසියාව, අප්‍රිකාව, ඇමරිකාව යන මහද්වීප සියල්ලටත් ඉතා කෙටි කාලයකදී සමුපකාර ව්‍යාපාරය ස්ථිරසාර ජීවන ක්‍රමයක් ලෙස ව්‍යාප්ත වන්නට විය. සමුපකාර දර්ශණය හා එහි ව්‍යවහාරය ලොව ජනගත කිරීමේ අභිලාෂයක් වශයෙන් 1895 දී ලෝක සමුපකාර නායකයින් එක්ව ජාත්‍යන්තර සමුපකාර සංධානය එංගලන්තයේ දී ආරම්භ කෙරුණි.

ජාත්‍යන්තර සමුපකාර සංවිධානයෙහි සාමාජිකත්වය ලබාගත් ලාංකීය සමුපකාර සංවිධාන කීපය අතර "ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය" ප්‍රමුඛ තත්වයක පැවතුනි. එනිසාම ලොව බොහෝ රටවල සමුපකාරිකයින් ඔවුන්ගේ පෙරදිග සංචාරයන්හි දී ශ්‍රී ලංකාවට පැමිණීමත්, අත්දැකීම් හුවමාරුව හා පුහුණුව මෙන්ම සුව පහසු සුන්දර මධ්‍යස්ථානයක දින කීපයක් ගත කරයාමට මෙම ආයතනයට පැමිණීමත් නිරන්තරයෙන්ම සිදු වූවක් විය.

1950 දශකයේ සිට 2000 දශකය දක්වා මෙරට රාජ්‍ය තන්ත්‍රය මෙහෙය වූ සෑම රජයක් විසින්ම ලාංකීය සමුපකාර ව්‍යාපාරයේ අභිවෘද්ධිය පිණිස සමුපකාර විද්‍යාලයේ සේවාවන් සාර්ථකව ඉටු කිරීමට එම භූමි භාගය තුළට තවදුරටත් අවශ්‍ය යටිතල පහසුකම් සපුරාලීම සඳහා අවධානය යොමුකර ඇත. ගොඩනැගිලි, භෞතික සම්පත්, යන්ත්‍ර සූත්‍ර, පරිගණක හා තොරතුරු තාක්ෂණික මෙවලම්, පුස්තකාල පහසුකම්, යාන වාහන පමණක් නොව විදේශීය සමුපකාරික රටවල් සමඟ ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වාගනෙ යාමට අවශ්‍ය පහසුකම් ජනනය කිරීම වැනි කටයුතු වලට මෙරට ජාතික ධනය යොදවා අවශ්‍ය ප්‍රවර්ධනයන් සිදු කර ඇත. සමුපකාර විද්‍යාලය අනවශ්‍ය රාජ්‍ය බැඳියාවන්ගෙන් ඉවත් වී ස්වෛරී හා ස්වාධීන ආයතනයක් වශයෙන් සමුපකාර අනන්‍යතාවය ප්‍රවර්ධනය කරමින් දේශය තුළ සමුපකාර ව්‍යාපාරයට ජාතික සංවර්ධනය සඳහා පුළුල් දායකත්වයක් සපුරාලීමේ දිගු අපේක්ෂාව ඇතිව 2002 වර්ෂයේ දී ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය ජාතික සමුපකාර සංවර්ධන ආයතනය නමින් ප්‍රතිව්‍යුහ ගත විය. මෙම පරිවර්තනය සිදු වූ එම අවස්ථාවේදි ද මෙරට සමුපකාරිකයින් ඒ සඳහා බොහෝ විවේචන ඉදිරිපත් කලේ ද එකී ප්‍රතිව්‍යුහගතකරණය මඟින් මෙරට සුවහසක් සමුපකාරිකයින්ට හා සමුපකාර සංවිධානවලට අපේක්ෂිත සේවාවන් ඉටු කිරීමට එම ප්‍රතිව්‍යුහගතකරණය මඟින් බාධා පැමිණේද යන බිය සැක නිසාවෙනි.

කෙසේ වුවද ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය 2002 වර්ෂයේ ප්‍රතිව්‍යුහගතකරණයට පත් වූ පසු "ජාතික සමුපකාර සංවර්ධන ආයතනය" යන නාමයෙන් සමුපකාර ව්‍යාපාරයේ අභිවෘද්ධියට නව ප්‍රවේශයක් නිර්මාණය කරමින් නවලොවට ගැලපෙන විද්‍යාව තාක්ෂණය හා නව්‍යකරණයන්ට ප්‍රවේශ වූ සමුපකාර ව්‍යාපාරයක් මෙරට ගොඩනැංවීමට හැකි වන පරිදි ඊට අදාළ "පුහුණුව හා සංවර්ධනය" සඳහා ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ කාර්යභාරය සැලසුම් සහිතව දියත් කරන ලදි. 2002 වර්ෂයේ සිට වර්තමාන කාලපරිච්ඡේදය දක්වා ජාතික සමුපකාර සංවර්ධන ආයතනය මෙරට සමුපකාර ව්‍යාපාරයේ අභිවෘද්ධිය උදෙසා සුවිශාල සේවාවක නිරත වී ඇතැයි යන්න සඳහන් කිරීම අතිශයෝක්තියක් නොවේ. මෙරට සමුපකාර ව්‍යාපාරයට ජාත්‍යන්තර සම්බන්ධතා හඳුන්වා දෙමින් ඒවායෙන් ලද උපදේශනයන් සමුපකාර අධ්‍යාපනයට කාන්දු කරවමින් ලාංකීය සමුපකාර ව්‍යාපාරයට පුහුණුව සංවර්ධනය සහ උපදේශකත්වයෙහි භූමිකාව මැනවින් ඉටුකිරීමේ කාර්යභාරය ජාතික සමුපකාර සංවර්ධන ආයතනය තවදුරටත් ඉතා විශිෂ්ඨ ලෙස ඉටුකරමින් සිටින බැව් සඳහන් කල යුතුය.

ශ්‍රී ලංකාවේ වර්තමානයෙහි උදා වී ඇති ආර්ථික අවපාතයට පිළියම් වශයෙන් විදේශීය මුල්‍ය ආයතන වෙතින් ණය ආධාර ලබා ඔවුන් ඉදිරිපත් කරන කොන්දේසි සපුරාලමින් කටයුතු කිරීමේදී මෙරට ඇතැම් ආයතන, සංවිධාන, සේවා මධ්‍යස්ථාන සංවිධාන පද්ධතීන් නව ප්‍රතිව්‍යුහගතකරණයකට යෝජනා වී ඇති බව සමාජයේ බොහෝ දෙනෙකුගේ අවධානයට

යොමු වී ඇති කරුණකි. යෝජිත ප්‍රතිව්‍යුහගතකරණයන් මගින් ඇතැම් ආයතන මගින් ඉටු කල කාර්යයන්වලට අපහසුතාවයක් අසාධාරණයක් බාධාවක් හෝ ඒවායේ අනන්‍යතාගත ක්‍රියාවලියට ඍණාත්මක බලපෑම් උදාවීමක් සිදු වෙතැයි යන්න වර්තමානයේ මෙරට මහා සමාජය තුල කතාබහට ලක්වූවක් වී ඇති බව රහසක් නොවේ.

මෙරට සමස්ථ සමුපකාර ව්‍යාපාරයට උපදේශණය, මගපෙන්වීම, පුහුණුව හා සංවර්ධනය ලබාදීම තම භූමිකාව කරගත් ජාතික සමුපකාර සංවර්ධන ආයතනයද උක්ත ප්‍රතිව්‍යුහගතකරණයට යෝජනා වී ඇති ආයතනයක් ලෙස හඳුනාගෙන ඇතැයි මෙරට සමුපකාරිකයින් තුල කසුකුසුවක් පැවතේ. එපමණක් නොව මෙරට සමුපකාර ව්‍යාපාරයෙහි දිස්ත්‍රික් හා පළාත් සමුපකාර සංවිධානවල යෝජිත කරුණ පිළිබඳ අදහස්, උදහස්, ආකල්ප, විකල්ප, යෝජනා, චෝදනා, සහ විවිධ මතවාද කියැවෙන අවස්ථා නිරන්තරව සංනිවේදනය වනු ඇත. එහෙයින් සමුපකාර අනන්‍යතාවය සහ ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ස්ථාපිත අනන්‍යතාවයට හානියක්, අපහසුතාවයක්, බාධාවක් උදාකෙරෙන ආකාරයට මෙම ආයතනය නව ප්‍රතිව්‍යුහගතකරණයකට පත්වීම සිදු නොවිය යුතුය යන්න ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ අතීත සේවකයෙකු ලෙස තරයේම සඳහන් කරන අතර එකී අදහස තහවුරු කෙරෙන ප්‍රබල සාධක කීපයක් හඳුන්වාදීමට කැමැත්තෙමි.

1. මෙරට සමුපකාර ව්‍යාපාරය දැවන්තය. එය නිෂ්පාදන, සේවා බෙදාහැරීම් සිදුකරන 14000 කට ආසන්න සමුපකාර සංවිධාන ගණනාවකින් යුක්තය. ශ්‍රී ලංකාවේ සමුපකාර සංවිධාන වලට උපදේශනය, මගපෙන්වීම, පුහුණුව හා සංවර්ධනය සපයන විවිධ රාජ්‍ය නිලධාරීන්ගේ සංඛ්‍යාව දස දහසකට අධිකය. මෙරට සමුපකාර සාමාජිකත්වය දළ වශයෙන් ලක්ෂ 90 කට ආසන්නය. මෙරට සමුපකාර සංවිධානවල නිරත සේවා නියුක්තිකයින් ගේ සංඛ්‍යාව 60 දහසකට ආසන්නය. වක්‍රව සමුපකාර සංවිධානවලට සේවා සපයන විවිධ ගනුදෙනුකරුවන්ගේ සංඛ්‍යාව අසීමිතය. අප්‍රමාණිකය. සාමාජික හා සාමාජික නොවන ගනුදෙනුකරුවන්ට මූල්‍ය සේවා සපයන සුළු, මධ්‍ය, මහා පරිමාන සමුපකාර මූල්‍ය ඒකක සංඛ්‍යාව (මූල්‍ය ආයතන) තුන්දහසක් පමණ වන අතර ඒවායේ සේවා නියුක්තිකයින්ගේ සංඛ්‍යාව දස දහසකට ආසන්නය.

   උක්ත සියලු සමුපකාර සංවිධාන, ආයතන හා ඒවායේ නියුක්තව ඇති ඉහතින් දැක් වූ වෘත්තිකයින් පුහුණු කිරීමේ වගකීම දරන එකම ජාතික පුහුණු ආයතනය ජාතික සමුපකාර සංවර්ධන ආයතනය වේ. එම ආයතනයේ නිල පැවරුම්ගත කාර්යභාරය හකුලා දැමුවහොත් එය මෙරට සමුපකාර ව්‍යාපාරයටත් ජාතික සංවර්ධනයටත් ඍණාත්මක බලපෑම් සිදුවිය හැකි කරුණක් වන බව සඳහන් කල යුතුමය.

2. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය රජය මගින් කළමනාකරණය හා පරිපාලනය කෙරෙන ජාතික පුහුණු ආයතනයකි. එයට වෙනත් ආදේශක හා විකල්ප ආයතන කිසිවක් නැත. මෙරට විශ්ව විද්‍යාල ආයතන මෙන් සමුපකාරික විශ්ව දැනුම සමාජයට ලබාදෙන මෙම ආයතනය සමුපකාර ක්ෂේත්‍රයට ශ්‍රී ලංකාව තුල ඇති එකම ජාතික ආයතනයයි. එය කෘෂිකර්ම අභ්‍යාස විද්‍යාලය, පොලිස් අභ්‍යාස විද්‍යාලය, මහජන සෞඛ්‍ය සේවා අභ්‍යාස විද්‍යාලය වැනි ජාතික තලයේ ක්‍රියාත්මක කෙරෙන වෘත්තියමය අධ්‍යාපනික ආයතනයකි. එහි සේවය අදාළ ක්ෂේත්‍රයට

ඉටුකරමින් යුගයේ අවශ්‍යතාවන්ට අනුරූපව සමුපකාර සංවර්ධනය උදෙසා මෙරට සමුපකාර සමිති, සංගම්, සංවිධාන වලට සේවය සැලසීමේ පරිශ්‍රමයෙහි අඛන්ඩව නිරත විය යුතුය.

3. ජාතික සංවර්ධනයට, දළ දේශීය නිෂ්පාදනයට, සේවා නියුක්තියට හා මහජන සුභ සාධනයට ඍජුව හා වක්‍රව දායකත්වය සපයන මෙරට තෙවන පාර්ශවය සමුපකාර අංශයයි. සමුපකාර අංශයේ මානව සම්පත් සංවර්ධනය උදෙසා පුහුණුව හා සංවර්ධනය සපයන, මෙරට ජාතික ආයතනය ජාතික සමුපකාර සංවර්ධන ආයතනයයි. එය ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරයට සිය සේවාව සපයමින් අවිච්ඡින්නව පැවතිය යුතු, සංවර්ධනය විය යුතු ආයතනයක් ලෙස අතීතයේ දී නෛතික කෙටුම්පත් මඟින් තහවුරු වී ඇති අවස්ථා බොහෝය. එහෙයින් ජාතික සමුපකාර සංවර්ධන ආයතනය මෙරට සමුපකාර ව්‍යාපාරයට තම පරිපූර්ණ සේවාව ඉටු කරමින් යුග ගණනාවක් ඉදිරියට ද අඛණ්ඩව පැවතිය යුතු බව එමගින් ගම්‍යමාන කරුණක් වන බව සඳහන් කළ යුතුය.

4. ලොව දියුණු හා දියුණු වෙමින් පවතින රටවල් 115 ක පමණ දායකත්වයෙන් යුක්තව අන්තර්ජාතික සමුපකාර සංවිධානය වූ "ජාත්‍යන්තර සමුපකාර සංධානය" (International Co-operative Alienation) ක්‍රියාත්මක වේ. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය එහි ශ්‍රී ලංකාව නියෝජනය කරන සාමාජික සංවිධානයකි. ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ කාර්යයන් බොහෝමයකට ජාත්‍යන්තර සමුපකාර සංධානය උපකාරයන් සිදු කර තිබේ. අනාගතයේදීද මෙරට සමුපකාර ව්‍යාපාරයට එමගින් ලබා ගත හැකි උපකාරයන් බොහොමයකි. ජාත්‍යන්තර කීර්තියට හා එහි අවධානයට බඳුන් වී ඇති ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙහි ව්‍යුහය එහි අනන්‍යතාවයට ගැටලුකාරී වන ලෙස ප්‍රතිව්‍යුහගතකරණය වීම සමස්ථ ශ්‍රී ලංකාවටම සිදු වන අවාසියකි. එමෙන්ම ලොව සමුපකාර දර්ශණය වැළඳගෙන එම සංකල්පය මත ජීවන ක්‍රමය ගොඩනගාගත් සියළු රටවල සමුපකාර සංවර්ධනය සඳහා ජාතික පුහුණු ආයතන ක්‍රියාත්මකව පවතී. එකී රටවල සමුපකාර පුහුණු ආයතන ගණනාවක් සමග ජාතික සමුපකාර සංවර්ධන ආයතනය අවබෝධතා ගිවිසුම් වලට එළඹ ඒවාට අනුකූලව කටයුතු කරමින් ලාංකීය සමුපකාර ව්‍යාපාරයට ලබා දෙන ශක්තිය, ධෛර්ය හා සංවර්ධනයේ දායකත්වය අතිශයින්ම වැදගත්ය. එය මෙරට සමුපකාර ව්‍යාපාරයට මෙන්ම ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර කීර්තියට ද අදාළ වන්නා වූ අතිශය වැදගත් ශුභදායක කරුණකි. එහෙයින් ජාතික සමුපකාර සංවර්ධන ආයතනය එහි ජන්මය ලැබූ නිල පැවරුම්ගත අනන්‍යතාවයට හානියක් වන ලෙස ප්‍රතිව්‍යුහගතකරණයට ලක්වීම ඉතාමත් අයෝග්‍ය කෘත්‍යයක් ලෙස සඳහන් කළ යුතුය. එමගින් මෙරට ජාතික සංවර්ධනයට ජාත්‍යන්තරයෙන් ලැබිය හැකි බොහෝ වාසි ප්‍රයෝජන හකුලා ගැනීමක් සිදුවිය හැකි බව සඳහන් කල යුතුය.

5. වර්තමානයේ ශ්‍රී ලංකාවේ සමාජයීය වාතාවරණය තුල සිදුවන ඇතැම් සිදුවීම් මුරුගසන් වර්ෂාවෙන් තෙමී උණුනොවුන් මරාගන්නා අවදියක සිදුවන ඛේදනීය තත්වයන්ට සමාන වූ භයංකාර ස්වභාවයකට සේන්දු වී ඇත. මෙරට ජීවත්වන සෑම ජන කොටසකටම සාරධර්ම, ආචාරධර්ම, ආධ්‍යාත්මික ගුණධර්ම සහ සදාචාරාත්මක

වටිනාකම්වලින් යුත් ප්‍රතිපත්තිගරුක සමාජයක් නිර්මාණය කිරීමට දායක විය යුතු ආකාරය ඉතා උත්සුකව අවබෝධකර දීම අත්‍යාවශ්‍ය වී තිබේ. ඒ සඳහා මෙරට ඇපකැප වෙමින් එකී කාර්යභාරය ඉතා නිවැරදිව ඉටු කරන ආයතන අතර ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ඉදිරියෙන්ම සඳහන් කළ හැකි ආයතනයකි. මෙරට සමාජ සංවර්ධනය හා එහි අභිවෘද්ධිය උදෙසා ජාතික සමුපකාර සංවර්ධන ආයතනයට තම කාර්යභාරය පුළුල්ව සිදු කරගෙන යාමට අවශ්‍ය පරිසරය සකසා ඊට ධෛර්යයමත් කරවීම අත්‍යවශ්‍ය වී තිබේ. නමුත් ඊට බාධාකාරි ප්‍රතිව්‍යුහකරණයන් මෙම කාලවකවානුවෙහි සිදු නොවිය යුතුය යන්න මෙරට සංවර්ධනයට ආශිර්වාද කරනු ලබන ඕනෑම අයෙකුගේ ප්‍රාර්ථනය වන බවද සඳහන් කළ යුතුය.

6. අතීතයේදී ශ්‍රී ලංකාවට උදා වූ දැඩි අර්බුධකාරී බොහෝ අවස්ථාවන්හි මෙරට සමුපකාර ව්‍යාපාරය එම අර්බුධකාරි තත්ත්වයන්ගෙන් අත්මිදීමට පිහිට වී ඇත්තේ ඉතිහාසගත ආකාරයෙනි. ආර්ථික සමාජ හා සංස්කෘතික ගැටළු අර්බුධ හා අභියෝග උත්සන්න වී ඇති මෙම කාලවකවානුවෙහි ඒවා ස්ථිරසාර ලෙස සමනය කිරීමට උපයෝගි කරගත හැකි එකම විකල්ප ක්‍රියාවලිය සමස්ථ මහා සමාජයම සමුපකාර ක්‍රමයට අවතීර්ණය කරවීමයි. යාබද ආසියානු රටවල් හා ලොව අර්බුධකාරි තත්ත්වයන්ට පත් වූ බොහෝ රටවල මෙම සිද්ධාන්තය අනුගමනය කිරීමේ උදාහරණ කොතෙකුත් දැක්විය හැක. මෙම විකල්පය ක්‍රියාත්මක කරවීමේ දැවැන්ත ක්‍රියාවලිය තුළ ජාතික සමුකාර සංවර්ධන ආයතනයට හිමිවන්නේ පෙරටුගාමී දැවැන්ත කාර්යභාරයකි. ඒ සඳහා ජාතික සැලසුම්කරුවන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු කලවකවානුව වර්තමානයෙහි උදා වී ඇත.

7. දකුණු ආසියාතික රටවල වර්තමානයෙහි සිදුවෙමින් පවතින ආර්ථික හා සමාජයීය චල්‍යතාවයන් මැනවින් විශ්ලේෂණය කර බැලීමේදි ධනේශ්වර අර්ථක්‍රම, මිශ්‍ර අර්ථ ක්‍රම, නව ලිබරල්වාදී අර්ථ ක්‍රමය ප්‍රතික්ෂේප වී සමුපකාර අර්ථ ක්‍රමයට අවතීර්ණය වූ රටවල් හා රාජ්‍යයන් ගණනාවක්ම දැක්විය හැක. ගත වූ දශක පහක වැනි කාලජේදය තුලදී ශ්‍රී ලංකාවේ ආර්ථික හා දේශපාලනික චල්‍යතාවයන් මගින් වර්තමානයේ උදා වී ඇති අනර්ථ ප්‍රතිඵලයන් කෙරෙහි අවධානය යොමු කිරීමේදි ශ්‍රී ලංකාව නුදුරු කාලවකවානුවකදිම සමුපකාර අර්ථ ක්‍රමයට අවතීර්ණ වනු ඇතැයි අපේක්ෂා කළ හැක. එබඳු පරිවර්තනයකදී මෙරට සමුපකාර අධ්‍යාපනයෙහි මහගෙදර වනුයේ ජාතික සමුපකාර සංවර්ධන ආයතනයයි. නුදුරු අනාගත කාලපරිච්ජේදයක දී ජාතික සමුපකාර සංවර්ධන ආයතනයට එවන් තත්වයක භූමිකාව ඉටු කිරීමට හැකි වන පසුබිම තත්කාලයේදී විකෘතියකට මග පෑදීම කිසිසේත් සිදුවිය යුත්තක් නොවේ.

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙහි කාර්යභාරය එහි අනන්‍යතාවයට අදාළ වන පරිදි යුගයෙන් යුගයට ප්‍රතිසංස්කරණය වීම ගැටළුවක් නොවේ. එහි පරිපාලනය, කළමනාකරණය හා කාර්යභාරයෙහි නව උපාය මාර්ග, උපක්‍රම සහ ආයතන ක්‍රියාවලියෙහි නව්‍යකරණයන් හා නව තාක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම සිදු විය යුතුය. එමෙන්ම මෙරට සමුපකාර ව්‍යාපාරයෙහි නියුතු මානව සම්පත් යෙදවුම් සියල්ලට කාලීන පුහුණුව හා සංවර්ධනය ගලා යන ආකාරයට මෙම ආයතනයේ භූමිකාව හරවත් ලෙස විසරණය වී

සංවර්ධනය විය යුතු බව නිර්ව්‍යාජ ලෙස පිළිගත යුතුය. එය ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙහි සංවර්ධනයේ අපේක්ෂාවයි.

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය සමුපකාර ක්ෂේත්‍රයට අවශ්‍ය ඥාන දායකත්වය මැනවින් ලබාදී සමුපකාර ව්‍යාපාරයට අවශ්‍ය වෘත්තිකයින් බිහි කරමින් අතීතය හා වර්තමානයෙහි දී මෙන් අනාගතයේදීත් තම නිල පැවරුම්ගත කාර්ය භාරය සාර්ථකව හා සඵලවත් ලෙස ඉටුකළ හැකි පසුබිම නිර්මාණය කිරීම යුගයේ අවශ්‍යතාවයකි. සමුපකාර ව්‍යාපාරයට අවශ්‍ය විවිධ වෘතිකයින් නිර්මාණය කිරීමට අමතරව කෘතහස්ත ජනාධිපතිවරුන්, අගමැතිවරුන්, මන්ත්‍රිවරුන් මෙන්ම මෙරට විශිෂ්ඨ ගණයේ වූ ශ්‍රී ලංකා පරිපාලන ක්ෂේත්‍රයේ නිලධාරීන්, වියතුන්, උගතුන්, බුද්ධිමතුන් සහ නෛතික, කලා, සාහිත්‍ය, වැනි ක්ෂේත්‍ර බොහෝමයක විශිෂ්ඨයින් බිහිකිරීමටද දායක වී ඇති ජාතික සමුපකාර සංවර්ධන ආයතනයට එවන් අද්විතීය මෙහෙවරක යෙදිය හැකි වුයේ අතීතයේදී හා වර්තමානයේදී මෙම ආයතනයේ නිල පැවරුම්ගත කාර්යභාරය විශ්වීය වශයෙන් සිය අනන්‍යතාවයට අනුකූලව සිදුකළහැකි පරිසරයක් හා වාතාවරණයක් පැවතී නිසාය.

එහෙයින් එකී තත්වයන් සියල්ල ලඝුකර වර්තමානයෙහි පොදුවේ සිදු වෙමින් පවතින ප්‍රතිව්‍යුහගතකරණයකට ජාතික සමුපකාර සංවර්ධන ආයතනය බඳුන්ගත නොවිය යුතුය යන්නත්, ආයතනික පැවරුම්ගත කාර්යභාරයට හානියක් සිදුවන ආකාරයට මෙම ආයතනය ප්‍රතිව්‍යුහගතකරණය වුවහොත් එයින් උදාවන්නේ මෙරටට අවාසිදායක අසාධාරණයන් රැසක එකතුවක් යයි තවදුරටත් සඳහන් කළ යුතුය. එහෙයින් පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනය මෙම කාල වකවානුවේදී නුසුදුසු, අයෝග්‍ය, අවැඩදායි පොදු ප්‍රතිව්‍යුහගතකරණයකට පත් නොවිය යුතු යැයි තර්කානුකූල හේතු ඇතිව සඳහන් කරමි.

3

# An Economic Contribution of Cooperatives in Sri Lanka

**R.M.D.H Rathnayake**

Sri Lanka has a relatively small economy, with a Gross Domestic Product (GDP) of approximately $81 billion as of 2021(Annual Report 2021, Central Bank of Sri Lanka). The Economy is characterized by a various range of sectors. The services sector is the largest contributor to GDP, followed by industry and agriculture. Important sectors include tourism, manufacturing, construction, telecommunications, finance, and agriculture. Sri Lanka faces several challenges in its economic development. These include high public debt, fiscal deficits, trade imbalances, and unemployment. Additionally, the country has been grappling with natural disasters, political instability, and social issues. The COVID-19 pandemic has also had a significant impact on the economy, affecting various sectors such as tourism, manufacturing, and services. At present, Sri Lanka's cooperative sector is playing an essential role in promoting rural development, job creation, women empowerment, and poverty reduction. However, the sustainability of the co-operatives has been challenged due to the competition coming from the private sector.

There is no universal definition of cooperatives. According to the International Cooperative Alliance (ICA,1995), a cooperative can be defined as an autonomous association of persons united voluntarily to meet their common economic, social, and cultural needs and aspirations through a jointly – owned and democratically-controlled enterprise. Cooperatives are observed as an important vessel for community development tools because they utilize and mobilize local resources into a critical mass and their structure allows them to be more community-oriented (Fairbairn et al.1991; Wilkinson and Quarter 1996). Sri Lanka has a diverse range of cooperatives that operate in sectors such as agriculture, fisheries, consumer goods, credit and finance, housing, handicrafts, and tourism. These cooperatives are often organized as registered societies or companies under the Cooperative Societies Act or the Companies Act. Cooperatives are based on the principle of voluntary membership, with individuals or organizations choosing to become members and participate in the cooperative's activities. Members typically have equal voting rights in the decision-making processes of the cooperative, regardless of their level of investment or contribution. Cooperatives make a significant economic contribution to Sri Lanka. They promote income generation,

employment, and entrepreneurship, particularly in rural areas. Cooperatives help small-scale producers access resources, markets, and credit, enhancing their productivity the cooperative sector in Sri Lanka makes a substantial contribution to production across various sectors, including agriculture, industry, services, and trade. By providing support to small-scale producers, adding value to products, facilitating market access, and generating employment opportunities, cooperatives play a pivotal role in driving production growth, economic inclusivity, and sustainable development. The continued promotion and strengthening of the cooperative sector are essential for harnessing its full potential in driving production and income levels. They also contribute to value addition, market linkages, and the development of sustainable economic activities.

## Types of Cooperatives in Sri Lanka

Primary cooperatives are present in the following sectors:

| Types of cooperatives | Number of Cooperatives |
|---|---|
| Thrift and credit | 8400 |
| Rural banks | 1703 |
| Fisheries | 544 |
| Multipurpose | 306 |
| Industrial | 182 |
| Marketing | 130 |
| Healthcare | 95 |
| Others | 90 |

**Table 1:** *Cooperative statistics per sector in Sri Lanka (2019) (Data received from NCCSL for 2019)*

**Percentage of cooperatives per sector**





**Figure 1:** *Cooperative statistics per sector in Sri Lanka (2019) (Data received from NCCSL for 2019)*

Cooperatives play a significant role in the economy of Sri Lanka, contributing to various sectors and providing benefits to their members. Cooperatives in Sri Lanka contribute to employment generation, particularly in rural areas. They provide opportunities for self-employment and income generation to individuals and communities who might otherwise have limited access to formal job opportunities. Also, Agricultural and fisheries cooperatives have a prominent presence in Sri Lanka. These cooperatives assist farmers and fishermen in accessing resources, including credit, inputs, and market linkages. By pooling resources and collective action, cooperatives help small-scale farmers and fishermen improve productivity, reduce costs, and obtain fair prices for their produce.

Consumer cooperatives play a vital role in the retail sector by providing affordable goods and services to their members. These cooperatives often establish cooperative stores where members can purchase essential commodities at reasonable prices. By

eliminating intermediaries, consumer cooperatives help reduce costs and improve the purchasing power of their members. Cooperatives in Sri Lanka also provide financial services, including savings and credit facilities, to their members. Credit cooperatives, also known as thrift and credit societies, enable members to save money, access credit, and promote a culture of financial discipline and savings. Housing cooperatives are involved in the construction and provision of affordable housing to their members. These cooperatives pool resources, negotiate with builders and develop housing projects that meet the specific needs of their members. By leveraging economies of scale, housing cooperatives contribute to addressing housing challenges in Sri Lanka. Sri Lanka has various handicraft and small-scale industrial cooperatives that promote traditional crafts and provide a platform for artisans to market their products. These cooperatives help preserve cultural heritage, generate employment in rural areas, and promote sustainable livelihoods. Cooperative enterprises also operate in the tourism and hospitality sectors in Sri Lanka. These cooperatives offer accommodation, transportation, and other services, contributing to the growth and development of the tourism industry.

They contribute to various sectors and provide numerous benefits to their members. Here are some key points highlighting their importance:

Cooperatives provide a platform for small-scale producers, such as farmers, fishermen, and artisans, to come together and collectively address their challenges. By pooling resources and working cooperatively, these producers can access inputs, technology, and markets that would be difficult to obtain individually. Cooperatives empower them to enhance their productivity, improve market access, and strengthen their bargaining power. Cooperatives help small-scale producers overcome resource constraints by providing access to essential resources. This includes access to credit facilities, inputs such as seeds, fertilizers, and equipment, and technical assistance. By pooling resources and negotiating as a collective, cooperatives enable small-scale producers to access resources that might be otherwise challenging to obtain individually. One of the significant challenges faced by small-scale producers is accessing markets and securing fair prices for their products. Cooperatives act as intermediaries, aggregating the produce of their members and facilitating market linkages. By consolidating the production of multiple small-scale producers, cooperatives can negotiate better prices, reduce transaction costs, and access larger markets. This empowers small-scale producers to reach a broader customer base and ensures fair remuneration for their products.

Cooperatives invest in capacity building and training programs for their members. These initiatives aim to enhance the skills and knowledge of small-scale producers, enabling

them to improve their productivity, adopt modern farming techniques, and adhere to quality standards. Capacity-building programs cover various areas such as crop management, post-harvest handling, marketing strategies, financial management, and sustainable farming practices. By improving the capabilities of small-scale producers, cooperatives empower them to compete effectively in the market. One of the key advantages of cooperatives is their ability to strengthen the bargaining power of small-scale producers. By coming together and forming cooperatives, small-scale producers can collectively negotiate with buyers, suppliers, and other stakeholders in the value chain. This collective bargaining power helps secure better prices for their products, obtain favorable terms for input procurement, and access value-added services such as processing and packaging.

Many cooperatives in Sri Lanka prioritize sustainable practices and environmental conservation. For example, agricultural cooperatives may promote organic farming methods, sustainable resource management, and environmentally friendly production processes. By adopting sustainable approaches, cooperatives contribute to environmental preservation, resource conservation, and the long-term sustainability of livelihoods. Beyond their economic contributions, cooperatives in Sri Lanka have a positive social impact. They promote community development, social cohesion, and inclusiveness by providing a platform for members to collectively address their needs and challenges. Cooperatives often invest in education and training programs, environmental sustainability, and social welfare initiatives, benefiting both their members and the broader community.

Sri Lanka has a large rural population, and cooperatives contribute to rural development by fostering economic activities in these areas. Agricultural cooperatives, in particular, support farmers by providing them with technical assistance, training, and access to markets. This leads to increased agricultural productivity, income generation, and improved living standards in rural communities. Cooperatives play a crucial role in providing financial services to their members, especially those who have limited access to formal banking institutions. Credit cooperatives, savings and credit societies, and cooperative banks offer savings facilities, loans, and other financial products tailored to the needs of their members. By promoting financial inclusion, cooperatives empower individuals and communities to manage their finances, invest in income-generating activities, and improve their economic well-being. Cooperatives facilitate market linkages for their members, helping them access domestic and international markets. By aggregating products, cooperatives can negotiate better prices, reduce transaction costs, and add value to the products through processing and packaging. This enables small-scale producers to reach wider markets and capture a larger share of the value chain,

thereby improving their income and economic stability.

Cooperatives create employment opportunities, particularly in sectors such as agriculture, handicrafts, and small-scale industries. By promoting entrepreneurship and providing support to micro and small enterprises, cooperatives contribute to job creation, especially in rural areas. This helps reduce unemployment, alleviate poverty, and stimulate local economic growth. Cooperatives foster social cohesion, community participation, and inclusiveness. They provide a platform for members to actively participate in decision-making processes and collectively address common challenges. Cooperatives promote democratic governance, equity, and shared benefits among their members, which strengthens social capital and contributes to overall community development.

It's important to note that the economic contribution of cooperatives can vary over time and is influenced by factors such as government policies, market conditions, and the overall economic environment. To obtain the most accurate and up-to-date information on the current economic contribution of cooperatives in Sri Lanka, it would be advisable to refer to recent reports and studies published by government agencies, cooperative federations, or other relevant institutions. Overall, cooperatives in Sri Lanka are vital economic and social organizations that empower individuals, drive economic development, and foster community well-being. They provide a collaborative and inclusive model of business that prioritizes the interests and needs of their members and contributes to the overall socio-economic progress of the country.

**References**

1. "*Annual Report 2021*". cbsl.gov.lk. Central Bank of Sri Lanka.
2. Fairbairn, B., J. Bold, M. Fulton, L. Hammond Ketilson and D. Ish. (1991). *Co-operatives and Community Development: Economics in Social Perspective. Saskatoon.* University of Saskatchewan.
3. ICA-AP (2020). Sri Lanka country snapshot
4. "Sri Lanka inflation reaches 4.2-pct in 2020 December". Economy Next. Retrieved 2 January 2021.
5. "Sri Lanka downgraded to World Bank lower middle-income country as per capita income falls". EconomyNext. Retrieved 28 November 2020.
6. "*World Economic Outlook Database, April 2019".* IMF.org. International Monetary Fund. Retrieved 29 September 2019.

http://www.coops4dev.coop/

4

# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය සහ සමුපකාරය

ධම්මික වීරකෝන්

## හැඳින්වීම

මනුෂයෙකුට නොමැරී ජීවත් වීමට අවශ්‍ය ආහාර ඖෂධ ඇඳුම් පැළඳුම් ආදිය මූලික අවශ්‍යතාවයන් නොලැබෙන තත්වයන් දරිද්‍රතාවය නම් වේ. එක් පුද්ගලයෙකු මාසිකව ජීවත් වීම පිණිස අවශ්‍ය අවම මුදල උපයා ගත නොහැකි නම් එම පුද්ගයින් දුප්පතුන් ලෙස සලකයි. උද්ගතවූ ආර්ථික අර්බුදය හමුවේ රටේ උද්ධමනය සීඝ්‍ර ලෙස ඉහළ ගියේය. දුප්පත්කම, දිලිඳුකම නැතහොත් දරිද්‍රතාවය යන්න ආර්ථික සංවර්ධන කෙරෙහිද සෘජුවම බලපාන සාධකයකි.

ස්වභාවධර්මයෙන් මිනිසාට පනවා ඇති සීමාවන් ජය ගැනීම සංවර්ධනයයි. එනමුත් මෙය ලබා ගත හැක්කේ මානව ප්‍රජාව ගෙන් සුළු කොටසකට පමණි. ජය ගැනිමට නොහැකි කොටස දුප්පතුන් ලෙස වර්ග කෙරේ. දිලිඳු බව යනු එක් රටකට පමණක් සීමා වූවක් නොවේ. වත්මන් ලෝකයේ බොහෝ රටවල් මුහුණදෙන ප්‍රධාන ගැටලුව ප්‍රමාණවත් ආහාර නොතිබීම, ඉහළ ළදරු මරණ අනුපාතය, අඩු ජීවිත අපේක්ෂාව, අඩු අධ්‍යාපන අවස්ථා , පිරිසිදු පානීය ජලය නොතිබීම, සෞඛ්‍ය පහසුකම් මදකම, අයහපත් නිවාස, තීරණ ගැනිමේ ක්‍රියාවලියේ සක්‍රීය සහභාගිත්වය නොමැතිකම ආදිය දරිද්‍රතාවයේ අන්තර්ගත ලක්ෂණ වේ.

19 වන ශත වර්ෂයේ සිට දුගීකම පිළිබඳ අවධානය වඩාත් යොමු වී ඇත. පර්යේෂකයන් විසින් එම සංකල්පය වටහා ගැනීම සඳහා විවිධ දර්ශකයන් ඉදිරිපත් කරමින් සමාජයක දුගී බව වටහා දීමට උත්සහ ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ මුළු පවුල් සංඛ්‍යාව ලක්ෂ 57 කි. ඒ අතරින් ඉහළ ආදායම් ලබන හෙවත් ධනවත් පවුල් සියයට 20 රටේ සමස්ථ ආදායමෙන් හෙවත් දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 51.3 පරිභෝජනය කරයි. සියයට 20 අයිති පවුල් සංඛ්‍යාව ලක්ෂ 11 කි. රටේ දුප්පත් පවුල් සියයට 20 හෙවත් පවුල් ලක්ෂ 11 භුක්ති විඳිමට ලැබෙන්නේ රටේ සමස්ථ ආදායමෙන් සියයට 4.6 කි. මෙම තත්වය ආදායම් බේදීයාමේ විෂම තත්ත්වය මැනවින් පැහැදිලි වෙයි.

සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව වාර්තා කරන ආකාරයට 2021 දී ශ්‍රී ලංකාවේ දුප්පත් පවුල් සංඛ්‍යාව 7,84,000 කී. එය 2023 දී ලක්ෂ 15 දක්වා වර්ධනය වෙමින් පවතී. උද්ධමනය ඉහළ යාමත් සමඟ අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා මිල ඉහළ යාමෙන් තවත් වටයකින් දුප්පතුන් සංඛ්‍යාව ඉහළ යයි. රටේ පවතින්නේ ආදායම් අඩුවෙමින්, වියදම් වැඩි වන තත්වයකි. දුප්පතුන් සංඛ්‍යාව වැඩි වන්නේ එමගිනි. පවුල් පිටින් දුප්පතුන් ගොඩට වැටීමෙන් ඔවුන්ට ඇතිවන මානසික පීඩනය බැහැර කල නොහැකි සාධකයකි.

ශ්‍රී ලංකාවේ දුප්පත්කම ඉහළ යාමත් සමඟ ජනතාවගෙන් සියයට 68 පමණ ආහාර අනුභව කරන ආහාර ප්‍රමාණය අඩුකර තිබෙන බව ලෝක බැංකුව සඳහන් කරයි. දුප්පත්කම නිසා ඔවුන්ට

තම වියදම් අඩු කිරීමට සිදුවෙයි. දැනට මස් ,මාළු බිත්තර පරිභෝජනය කළ අයට ඒවා අතහැර සෝයා මීට් කෑමට සිදු වෙයි. දරුවන්ගේ අධ්‍යාපනය සඳහා කරන වියදම් ද ලෙඩ රෝග සඳහා දරණ වියදම් ද අවම කිරීමට සිදුවෙයි.

## ආර්ථික සංවර්ධනය

දුප්පත්කම , දිළිඳුකම නැතහොත් දරිද්‍රතාවය යන්න ආර්ථික සංවර්ධනය කෙරෙහි ඍජුවම බලපාන සාධකයකි. දරිද්‍රතාවය, අවම ආර්ථික වර්ධනය, විරැකියාව හා ආර්ථික විෂමතාවය යන්න සංවර්ධනය වෙමින් පවතින රටවල් ගෝලීය වශයෙන් මුහුණදෙන ගැටළුවකි..

උද්ධමනය යනු භාණ්ඩ හා සේවා වල මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහළ යාමයි. 2023 මැයි මස ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කර ඇති උද්ධමන අනුපාතයට අනුව සියයට 35.3 සිට 25.2 දක්වා උද්ධමනය පහත වැටී ඇත. ආහාර උද්ධමනය සියයට 30.6 සිට 21.5 දක්වාද ආහාර නොවන උද්ධමනය සියයට 37.6 සිට 27.0 දක්වාද පහත වැටී ඇත. ශ්‍රීලංකා මහ බැංකුව 2023 වසර මුලදී ප්‍රකාශ කර සිටියේ උද්ධමන අනුපාතිකය තනි අංකයක් බවට පත් කිරීමට 2024 මුල්භාගයේදී ඉඩ ලැබෙණු ඇති බවයි.

උද්ධමන අනුපාතය වෙනස්වීම රටේ ආර්ථිකය සම්බන්ධයෙන් සුභදායක තත්වයකි. එයට හේතු වන්නේ 2022 සැප්තැම්බර් මාසයේදී සියයට 73.7 දක්වා ඉහළ අනුපාත වු බැවිණි. කෙසේ වුවත් රටක සංවර්ධන, සැලසුම්, හා ප්‍රතිපත්ති සකස් කිරීම ව්‍යාපෘති ක්‍රියාවට නැන්වීම හා මහජනතාව රැකබලා ගැනීම ආණ්ඩුවකට පමණක් තනිව කළ නොහැකි බව නවීන ආර්ථිකයක් පවතින රටවල් හඳුනාගෙන ඇත.

## ජනසවිය

ආර්ථික අර්බුදය හමුවේ අප රට තවදුරටත් දුප්පත් වෙමින් පවති. දිළින්දන් ඇති හැකි අය බවට පත්කරන බව කාලයක් තිස්සේ ප්‍රකාශ වන්නකී. ලෝක බැංකුවේ වාර්තා අනුව ලංකාවේ දිළිඳුකම 2022 වසර වනවිට සියයට 25 කී. එම තත්වය ඉතා ඉහළ අගයකි. දුප්පත්කම තුරන් කීරීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක වු අතර දුගිබව තුරන් කිරිම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග අතර ජනසවිය වැඩ සටහනට වැදගත් ස්ථානය හිමිවන අතර, 1989 අංක 04 දරණ ජනසවිය පනත මගින් එතෙක් ක්‍රියාත්මක වු ආහාර මුද්දර ක්‍රමය වෙනුවට ජනසවිය වැඩ සටහන ක්‍රියත්මක විය. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ප්‍රථම ඉලක්කගත වැඩ සටහන වශයෙන් ජනසවිය වැඩ සටහන් හැඳින්විය හැකිය. මෙම වැඩ සටහනේ මුලික අරමුණු වූයේ ජනතාව පදනම් කරගත් සංවර්ධන ක්‍රියාවලියක් මගින් දුගීබව තුරන් කිරීම, දුගී බවෙන් පෙලෙන ජන කොටස්වල සේවා වියුක්ති ප්‍රශ්ණය විසඳා ගැනීම, ජනතාවගේ මන්ද පෝෂණය ඉවත් කිරීම තුළින් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කීරීම , දුගී ජනතාවගේ ආර්ථික නිදහස ආර්ථික ශක්තිය සහ ආර්ථික ආරක්ෂාව තහවුරු කරමින් ආර්ථික ස්ථාවරත්වය වර්ධනය කිරීම ආදිය වේ.

## සමෘද්ධිය

1977 න් පසුව දිළිඳුකම පිටු දැකීම සඳහාත් අඩු ආදායම්ලාභි ජන කොටස්වල ආදායම් උපයා ගැනීමේ හැකියාව වැඩි කිරීම සඳහාත් සේවා වියුක්ති ප්‍රශ්ණ විසඳා ගැනීම සඳහාත් සමාජ හා ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා අඩු ආදායම්ලාභි ජන කොටස් සම්බන්ධ කර ගනිමින් ආර්ථික වර්ධනය හා සංවර්ධනය වේගවත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධානතම යෝජණා අතරින් සමෘද්ධි ව්‍යාපාරයට වැදගත් ස්ථානයක් හිමි වේ. 1995 ජනි මස ජන සවිය වැඩ

සටහන අත්හිටුවා සමෘද්ධි වැඩ සටහන ආරම්භ කර ඇත. මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමෙන් බලාපොරොත්තු වන්නේ ද දිළිඳුකම තුරන් කිරීම, අඩු ආදායම් ලබන ජන කොටස්වල තරුණ තරුණියන් සහ කාන්තාවන් සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම , අඩු ආදායම්ලාභින්ගේ ආදායම් උපයා ගැනිමේ හැකියාව වර්ධනය කිරීම , සේවා නියුක්ති අවස්ථාවන් වර්ධනය කිරිමතුලින් සේවා වියුක්ති ප්‍රශ්ණ විසඳා ගැනිම, ජනතාව තුළ ඉතිරිකිරීමේ හැකියාව වර්ධනය කිරිම ආදිය වේ. මෙම අරමුණු පදනම් කර ගැනිම තුළින් පැහැදිලි වනුයේ සමෘද්ධි ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානතම අරමුණ වූයේ ගම සහ ජනතාව පදනම් කොටගත් සංවර්ධන ක්‍රමෝපායන් මගින් දිළිඳුකම තුරන් කිරීම මගින් සංවර්ධනය අත්පත්කර ගැනීමයි. එනමුත් අදටත් සමෘද්ධි වැඩ සටහන් රජය මගින් ක්‍රියාත්මක කරයි. දුප්පත්කම තුරන් කිරීම සඳහා ක්‍රියාත්මක වැඩ සටහන් පිළිබඳව අපට මෙතෙක් සැහීමකට පත්විමට හැකිද යන්න ගැටලුවකි.

## දරිද්‍රතාවයේ ප්‍රතිඵල

ශ්‍රී ලංකාව් දරිද්‍රතාවය පිටු දැකීම සඳහා මූලික ප්‍රතිපත්ති සකස් වන්නේ යටත්විජිත පාලන කාලයේදීය. බ්‍රිතාන්‍ය පාලන කාලය තුළදී හඳුන්වාදුන් සහනාධාර ක්‍රමය අදටත් ක්‍රියාත්මකවීම දැකගත හැකිය. 1948 නිදහසින් පසුව දිළිඳුකම පිටුදැකීමේ පුනරුදයක් දැකිය හැකිවිය. මෙතෙක් බලයට පත් වූ සෑම රජයක්ම දරිද්‍රතාවය පිටු දැකිම සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත.

1977 දී විවෘත ආර්ථික ප්‍රතිපත්ති රට තුල ක්‍රියාත්මක කිරීමත් සමග එතෙක් ක්‍රියාත්මක වූ සමාජවාදී ආර්ථික මොඩලය වෙනුවට නිදහස් වෙළඳපල ආර්ථික රටාව හෙවත් ලිබරල් ආර්ථිකයකට පදනම වැටිණි. පැවැති වෙළඳපොල බාධක ඉවත්ව වෙළඳපොල නිදහස්කරණයත් සමඟ ආර්ථික වෘද්ධි උපාය මාර්ග තුළින් පමණක් දරිද්‍රතාවය අවම කිරීමට අපේක්ෂා කළත් එම සාක්ෂාත් කර ගැනීම ද අපහසුවී ඇත.

රටක දරිද්‍රතාවය පිළිබඳව සාකච්ඡා කිරීමේදි මානව සම්පත ප්‍රබල සාධකයකී. මානව සම්පත් සංවර්ධනය පහළ ගොස් ශ්‍රම බලකායේ ගුණාත්මක බව පහළ යාමත් අහිතකරය. ශ්‍රී ලංකාවට විදේශ ආයෝජන පැමිණීමට රටේ ශ්‍රම බලකායේ නිපුණතාවය හේතුවිය. ශ්‍රම බලකායේ උගත්කම, තේරුම් ගැනීමේ හැකියාව, නිර්මාණශීලී හැකියාව , නිර්මාණශීලිබව, ව්‍යවහාර ඥාණය, නවෝත්පාදන හැකියාව, සෞඛ්‍ය සම්පන්න බව කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය යනාදිය පහළ වැටුණහොත් ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායට ලොව පුරා තිබෙන පිළිගැනීම නැතිවිය හැකිය.

ශ්‍රී ලංකාව කෘෂි කාර්මික රටක් ලෙස හඳුනාගත යුතුය. රටේ සමස්ථ වගාකල හැකි බිම් ප්‍රමාණය වතුකරය ඇතුළුව හෙක්ටයාර් 284000 කි. මෙරට ගොවීහු ලක්ෂ 28 ක් සිටිති. ඒ අනුව හෙක්ටයාරයකට ගොවියෝ නව දෙනෙක් සිටිති. අක්කරයකට සිටින ගොවීන් ගණන හතරකි. ඒ අනුව අක්කර කාලක් එක් ගොවියෙකුට හිමිවේ. අක්කර කාලක් වැඩ කිරීමෙන් ගොවියෙකුට ජීවත්වීම පිළිබඳ ගැටළු ඇත.

සංවර්ධනය කරා යාමේදී බලපා තිබෙන ප්‍රධානතම ගැටලුව නම් ජනතාව තුළ පවතින ආකල්පමය ගැටලුවයි. තවමත් යැපුම් මානසිකත්වය බහුතර ජනතාව තුළ දක්නට ලැබෙන බව පැහැදිලි කරුණකි. ස්ව ශක්තියෙන් නැගී සිටීමට ජනතාව තුළ පවතින මැළිකම මෙන්ම විකල්ප සංවර්ධන ක්‍රමවේද වලට අනුගත වීමට දක්වන අකමැත්ත මෙම සංවර්ධයේ

මාවතට අභියෝගයකි. ජනතාව දරිද්‍රතාවයෙන් මුදවා ගැනීම සඳහා දේශපාලනිකව බැලීමේ චින්තනයෙන් මිදී සංවර්ධනය දෙස ජාතියක් ලෙස දකිනතාක් මෙම ගැටලුව නිමාවක් දැකිය නොහැකිවනු ඇත.

## දුප්පත්කම තුරන් කිරීම

දුප්පත්කම තුරන් කිරීම සඳහා අප සතුව ශක්තීන් ඇත. කුඩා රටක් වුවත් සම්පත් බහුලය .ජලය ඛනිජ සම්පත් මෙන්ම විශාල සාගර කලාපයක්, ස්වභාවික සම්පත් ඇත. ලෝකයේ මානව සංවර්ධන දර්ශකයේ ඉහළ තැනක ශ්‍රී ලංකාව පසුවේ. ශ්‍රී ලංකාව දියුණු රටක් බවට පත් කර ගැනීමට නම් අපට කළයුතු කාර්යයන් කිහිපයක් ඇත. ඉන් ප්‍රධාන වන්නේ ඒක පුද්ගල ආදායම දෙගුණයක් දක්වා වැඩිකර ගැනීමයි. එය කිරීමට නම් අපේ සංවර්ධන ආකෘතියක් ගොඩනගා ගත යුතුය. ඒ සඳහා බලපාන ප්‍රධාන සාධක කීහිපයක් ඇත.

දරිද්‍රතාවයේ හෙට දවස තීරණය වන්නේ රටක් අනාගතය වෙනුවෙන් වර්ථමානයේ ගන්නා තිරණ සහ ආයෝජන පදනම් කරගෙනය. රටේ ඵලදායි ආර්ථික තීරණ ගැනීම ප්‍රතිපත්ති සම්පාදකයන්ට මෙන්ම දේශපාලකයින් මෙන්ම සිවිල් සමාජ ක්‍රියාකරීන්ට නොතිබුණහොත් ඒ මගින් නාස්තිය දූෂණය ඉහළ ගොස් සංවර්ධන අපේක්ෂාවන් අත්පත් කරගත නොහැකිව සදාකල්ම දරිද්‍රතාවය රජයන දේශයක් බවට පත්වීම නියතය.

ශ්‍රී ලංකාව දරිද්‍රතාවයෙන් ගලවා ගැනීම සඳහා ආර්ථික කළමනාකරණය පිළිබඳ දැනුම අවශ්‍ය වේ. එසේම ඒ පිළබඳව ප්‍රවීණයන්ගේ දායකත්වය, ප්‍රතිපත්ති සම්පාදනයේදී ඒවා ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ. දේශපාලන තීරණ ආර්ථිකයේ තිරසාරත්වය කෙරෙහි සෘජුවම බලපාන අතර නිවැරැදි ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධනය කරා මෙහෙවයි. දුප්පත්කම තුරන් කිරීමේ ප්‍රතිපත්ති ව්‍යාපෘති වුවත් දේශපාලනීකරණයෙන් තොරව, නිශ්චිත පිරිස ඉලක්ක කර ගනිමින් මෙහෙය වුවහොත් අදාළ යහපත් ප්‍රතිඵල ලබාගත හැකිය.

## සමුපකාර ව්‍යාපාරය

1977 ශ්‍රී ලංකාවේ ඇතිවූ ආණ්ඩු පෙරළියත් සමග දේශපාලන හා ආර්ථික ප්‍රතිපත්ති හා ඉදිරි ගමන් මග වෙනස් කළ සංධිස්ථානයකි. 1948 නිදහස ලැබීමෙන් අනතුරුව 1972 ඇතිවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පසුව 1970 - 1977 රාජ්‍ය සමයේ පවත්වාගෙන ගිය මධ්‍යගත සැළසුම් ආර්ථිකය වෙනුවට විවෘත හා නිදහස් වෙළඳපල ආර්ථිකයක් ගොඩනැගීම රජයේ ප්‍රතිපත්තිය විය.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳ තිබුණු රජයේ ග්‍රහණය ලිහිල් වීමෙන් මෙහෙයුම් ප්‍රතිපත්තිවල විප්ලවීය වෙනස්කම් රැසක් ක්‍රියාත්මක විය. මෙහිදී භාණ්ඩ හා සේවාවල මිල පාලනය අහෝසිවීම, විදේශ විනිමය පිළිබඳ පැවැති පාලනය ලිහිල්වීම, කර්මාන්ත හා වෙළඳපල පිළිබඳව රෙගුලාසි හා සීමා ඉවත් කිරීම, දේශීය හා විදේශීය අයෝජකයන් උනන්දු කිරීම සඳහා රෙගුලාසි ලිහිල් කිරීම හා බදු සහන ලබාදීම, සමාජ සහන සීමා කිරීම ආදිය වෙනස්කම් සිදු කරන ලදි.

මෙම ව්‍යුහාත්මක වෙනස්වීම් මගින් රජය අපේක්ෂා කළේ රටේ ජනතාවගේ දෛනික පාරිභෝගික භාණ්ඩ හා සේවාවල මිල පහත වැටිමෙන් හා නව ආදායම් මාර්ග ඇතිවීමෙන් ජනතාවට වඩා හොඳ ජීවන තත්වයක් ඇතිවේ යැයි යන්නයි.

කෙසේ වෙතත් රටේ පුරවැසියන්ගේ ජීවන රටාව වෙනසක් ඇති වී ඇති අතර පුද්ගලවාදය ,තරඟය හා ඇති නැති පරතරය පුළුල්වීම වැනි සමාජ දුර්විපාක

ද ඇති විය. සමාජ සමතුලිතතාවය පළුදු වූ අතර රජය විසින් එම අර්බුද අවම කිරීම පිණිස ඇතැම් ක්‍රියාමාර්ග ගන්නා ලදි. එනම් දිළිඳුබව අවම කිරීම සඳහා ඇතැම් ක්‍රියා මාර්ග ගැනීම, යන්ත්‍ර සූත්‍ර නිසා රැකියා අහිමිවුවන්ට තාක්ෂකික කුසලතා ලබාදීම හා ස්වයං රැකියා සහන ණය ක්‍රම හඳුන්වාදීම, සමාජ ආරක්ෂන ක්‍රම ක්‍රියාත්මක කිරීම (ජන සවිය, සමෘද්ධිය) ආදියයි.

1977 දක්වා සමූපකාර ව්‍යාපාරය බොහෝ භාණ්ඩ හා සේවා සැපයීමේදී වාසියක් ඇති කරගෙන තිබුණි. නව ආර්ථික ප්‍රතිපත්තියත් සමඟ සමූපකාර ඒකාධිකාරය අහෝසි කරන ලදී. සමූපාකර සමිති හදිසි කම්පනයකට නතුවූ අතර ජාතික ආර්ථිකය තුළ සමුපකාර භූමිකාව ව්‍යාකුල හා අපැහැදිලි තත්වයකට පත්විය.

1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය සමඟ සමූපකාර විෂය පළාත් සභාවල විෂයක් ලෙස මධ්‍යගත විය. මේ අනුව පළාත් කිහිපයක් තම සමුපකාර පිළිබඳ ප්‍රඥප්තිය සම්මත කරගෙන ඇත.

1977 න් පසුව ද ලංකවේ දරිද්‍රතාවය අවම කිරීමේ වැඩ සටහන් සඳහා රජය සමඟ ඒකාබද්ධ සෘජු දායකත්වයක් සැපියිමට සමුපකාර ව්‍යාපාරය ක්‍රියාකර ඇත. අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම, ගොවි ණය ක්‍රමය යටතේ ණය ලබාදීම, ආහාර මුද්දර ක්‍රමය යටතේ ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම, ආහාර ආනයයනය කිරිම, ජනසවිය වැඩ සටහන යටතේ ද්‍රව්‍ය එම පවුල් අතර බෙදාහැරීම, පාසල් දරුවන් සඳහා දිවා ආහාර මුද්දර ක්‍රමය ක්‍රියාත්මක කිරීම සමෘද්ධි වැඩ සටහන යටතේ විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ,ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ මළු ලබාදීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, ආදි වැඩ සටහන්ය.

Policy Brief

5

# A call for collective approach: Agriculture Cooperatives for bright future

**P.M.D.W.D.Pallawala**

Farmers have been a major group of the population of Sri Lanka over the history. Agriculture sector employs 25.5% of the Sri Lankan population, but only contributes 7% of the Gross Domestic Product of Sri Lanka. Although various subsidy programs (fertilizer, debt relief etc) have introduced in post-independence era living standards of farmers has not been uplifted drastically. According to Bandara, et al. (2016-2018) almost all the crop-growing farmers has always pointed out the issues with marketing of their products. Therefore, it is vital to find a solution to identify market mechanism to sell agro products.

It is found that farmers have sold their products mainly to private dealers (so called village collectors) and to economic centers. As a result, farmers are unable to get direct profit. Surveys expose that the major issue is pest attacks and diseases. Second major issue faced by low country vegetable farmers is marketing. It also reveals that the price farmers received was not adequate to cover the input cost and cost of living especially during the harvesting time.

It was evident by the news reports that paddy, other field crops, vegetable, fruit farmers grieve for low price they obtain for products specially in Anuradhapura, Matale, Nuwaraeliya and Monaragala districts. Most of them destroy unsellable products or put it to wild elephants. The farmers blame the drastic difference between wholesale and retail price where intermediate parties gain the profit and farmers always lose profit in farming.The affected farmers may discouraged to re-engage in Agriculture leading to decrease in agro products. Additionally, farmers do not re-invest in agriculture, as they do not get profit. Subsequently farmer community remain in poor living standard.

JAICA Inc. (2013) in their report says that private sector takes major role in agricultural marketing operation except for indispensable government intervention. In the present policy framework of Sri Lanka, systems of pre-contracts among direct producer, export companies, packaging firms, and wholesalers will be promoted.

In order to achieve above objective, two alternative policies are suggested to overcome market issues of farmers. They are, contract farming with supermarket/agri business chains and agriculture cooperative system. Since the super market chain is still not strong in Sri Lanka it is suggested to establish government steered cooperative establishment dedicated to agro farmers. The farmers, auxiliary agriculture service

providers will be the shareholders of the cooperative and the elected executive committee from the farming community will be in charge of making links and come into agreements with buyers and in charge of selling products. The cooperative holding may also acquire capital assets for the benefit of farmers and supply financial services to the farmers including crop insurance. The elected members should have good management capacity for decision-making and execution. Nevertheless, farmers will have to depend on the decisions of the executive committee. Since the cooperative holding is able to self-finance farmers will be able to share transport and other services, share agro mechanical equipment. Farmers as a group will be able to negotiate with purchaser and therefore get fair price for their products.

Responsibility of monitoring and evaluation of the objectives can be given to Ministry of Trade, Department of Cooperative Development, and Ministry of Agriculture.

6

# වසර 101 ඉක්වන ජාත්‍යන්තර සමුපකාර දින දී සමුපකාරය ආවර්ජනයට පෙරවදනක්

සුරේන්ද්‍ර ඩී. බුලත්සිංහල

අපි මෙතෙක් කර ඇත්තේ සමුපකාරයේ ඉතිහාසය හැදෑරීමෙන් සමුපකාර භාවිතාවන් මතුකර ගැනීමය. එකී භාවිතාවන්ගේ හැදෑරීම 1515 දී තෝමස් මෝ රචිත උතෝපියා ග්‍රන්ථයේ සිට මෙන්ම 1922 ජූලි මස පළමු සෙනසුරාදා ගෝලීය සමුපකාරිකයින්ගේ දිනය වශයෙන් වෙන්කර දා සිට මේ දක්වාම කර ඇත. මෙම හැදෑරීමේදී සමුපකාරිකයා දාර්ශනිකයෙක්, මගපෙන්වන්නෙක් හා මිත්‍රයෙක් වශයෙන් උගන්වා ඇත. අප ඊට තවත් කරුණු හතරක් එක්කර ඇත. එනම් සමූකාරිකයා සමුපකාර සංවර්ධන සන්නිවේදකයෙක්, සමාජ ව්‍යවසායකයෙකි, ආර්ථික ව්‍යවසායකයෙකි, අධ්‍යාත්මික ව්‍යවසායකයෙකි යන කරුණු හතරවේ.

මෙම කරුණු හතෙන් පළමු කරුණ කෙරෙහි පළමුව අවධානය යොමු කරමින් ආවර්ජන ක්‍රියාවට පිවිසෙමු. සමුපකාරිකයා දාර්ශනිකයෙකු වන්නේ කුමණ අර්ථ යෙන්ද යන්න විමසා බලමු. එහිදී පෙර අපරදිග දර්ශනිකයන් කෙරෙහි අවධානය යොමු කරමින් ආරම්භ කරමු. අපර දිග ග්‍රීසියෙන් මතුවූ විද්‍යාවේ දාර්ශනිකයා වන ප්ලේටෝ කියන්නේ කුමක්ද? දාර්ශනිකයා එක්කෝ පාලනයකු විය යුතුය. නැත්නම් පාලකයා දාර්ශනිකයකු විය යුතුය. එයින් කියන්නේ දර්ශන යයනු කුමක්ද? නොව දාර්ශනිකයා වන දේශපාලන පාලකය ගැනය. මෙය සමුපකාර පාලකයන් සියළු දෙනා අවධාරණය කළයුතු ප්‍රකාශනයකි.

එම ගුරු කුලයේම කාල්මාක්ස් කියනනේ කුමක්ද? මෙතෙක් සියළුම දාර්ශනිකයන් කර ඇත්තේ ඉතිහාසය විස්තර කිරීමකි. එහෙත් දාර්ශනිකයාගේ කාර්ය විය යුත්තේ ඉතිහාසය වෙනස් කිරීමය. එයින් කියන්නේද, දර්ශනය යනු කුමක්ද? නොව දාර්ශනිකයාගේ කාර්ය ගැනය. එය වූ කලී අපරදිග දාර්ශනික සම්ප්‍රදායන් දෙකක කතාවකි. ප්ලේටෝ විඥානවාදයත් මාක්ස් භෞතිකවාදයටත් අයත් වී ඇත්තේ එම නිසාය. මෙයද සමුපකාර පාලකයන් සියළු දෙනා අවධාරණය කළයුතු ප්‍රකාශනයක් නොවේද?.

පෙරදිග දර්ශනවාදය තුළ දාර්ශනික සම්ප්‍රදා ලෙස වෛදික, උපනිෂද්, ජෛන හා බෞද්ධ යන දර්ශනවාද හතරක් හමුවේ. මේ දාර්ශනික සම්ප්‍රධායන් හතරින් විද්‍යාවේ දර්ශනය බෞද්ධ අපෝහක විද්‍යාවේ දර්ශනවාදය තුළ ඇත. එම නිසා ලෝකයේ සියළුම විද්‍යාර්ථයින් ගැඹුරින් හැදෑරිය යුතුය. එහිදී සිද්ධාර්ථ ගෞතමයාණන් දාර්ශනිකයෙකු වන්නේ කුමණ අර්ථයෙන්ද? යන්න සොයා බලා දර්ශනය යනු කුමක්ද? දාර්ශනිකයාගේ කාර්ය කුමක්ද? යන්න කාලාම සූත්‍රයත් වාසෙට්ඨ සූත්‍රයත් පාදක කරගෙන ගැඹුරින් විශ්ලේෂණය හා සංස්ලේෂණය කලයුතුය. එවිට අකාලික ගුනය ඇති ද්විත්ව විභේදනය දයලෙක්තිකය අන්තර් විනිවිධ ගිය විද්‍යාවේ දර්ශනය මතු කරගෙන ඇත්තේ කවුද? යන්න අවබෝධවේ. 101 වන සමුපකාර දිනය සමරන මෙහොතේ මෙකී ආවර්ජනයන් වැදගත් වන්නේ ඇයි? යන ප්‍රශ්න විමසන විට තිරසාර

සංවර්ධනය යනු දිගින් දිගටම මොහොතෙන් මොහොතම වැඩ වලින් වැඩ වලට මෙන්ම මිනිසාගෙන් මිනිසාටත් ව්‍යවසායක මාදිලීන්ගේ ව්‍යවසායක මාදිලීවලටත් සොබාදහමේ සහ සමාජීය අපෝහකට ක්‍රියාදාමයක් වන නිසා අපෝහකවම සොයා බැලිය යුතුය.

අපර දිග භෞතිකවාදියා, අපෝහක දර්ශනිකයා, මගපෙන්වන්නා, මිත්‍රයා, සමාජවාදී සංවර්ධන සන්වේදකයා, සමාජ ව්‍යවසායකයා, ආර්ථික ව්‍යවසායකයා හා අධ්‍යාත්මික ව්‍යවසායකයා වූයේ කාල්මාක්ස්ය. පෙරදිගින් මතුවූ ද්විත්ව විභේදන දයලෙක්තිකය විනිවිද ගිය අපෝහක දර්ශනිකයා මගපෙන්වන්නා, මිත්‍රයා, සමුපකාර සමාජවාදී සංවර්ධන සන්නිවේදකයා, සමාජ ව්‍යවසායකයා, ආර්ථික ව්‍යවසායකයා හා අධ්‍යාත්මික ව්‍යවසායකයාවූයේ සිද්ධාර්ථ ගෞතමයාණන්ය. මෙකී අපෝහක දර්ශනිකයන් දෙදෙනාගේ නියමයන්ගෙන් සමුපකාර අපෝහක දර්ශනවාදය පෝෂණය වේ. එහිදී බෞද්ධ අපෝහක විද්‍යාවේ දර්ශනය ප්‍රථමික වන අතර මාක්ස්වාදී අපෝහක විද්‍යාවේ දර්ශනය ද්විතීකවේ. ඒ අනුව සමුපකාරිකයා දර්ශනිකයකු වන්නේම අපෝහක විද්‍යාවේ දර්ශනය සමුපකාර නිෂ්පාදන මාදිලිය වෙත ගෙන යෑමත් සමුපකාර නිෂ්පාදන මාදිලිය වෙත අපෝහක විද්‍යාවේ දර්ශනය ගෙනයෑමත් ත්‍රීමාන භාවිතාවන් තුලින්ය. දැනුමේ පදනම, පරමාර්ථය හා අරමුණ භාවිතාව බව දන්නා ඕනෑම කෙනෙක අප මේ කියන දේ දන්නා අයවෙති. එම භාවිතාවන් ආරම්භ කරන්ම සමුපකාරයේ ඉතිහාසය හැදීරීමෙන් නොව ඉතිහාසයේ සමුපකාරය හැදීරීමෙන්ය. එය සමුපකාර භෞතිකවාදී ප්‍රවේශයද වේ. ඉතිහාසයේ සමුපකාරය සමුපකාරයේ අනාගතය කරන ප්‍රවේශය එයමවේ. කිසි දිනක ඉතිහාසයේ සමුපකාරය, සමුපකාරයේ අනාගතය කළ නොහැකිය. පැවති, පවතින හා පැවතිය යුතු සමුපකාර මාදිලින් සොයාගත යුතුව ඇත. එම සොයා ගැනීමට හැකියාව ඇත්තේ සමුපකාර අපෝහක පර්යේෂණ විද්‍යාවේ දර්ශනයෙන්ය. ඊට පදනම අරියපර්යේෂණ සූත්‍රය ලබා දෙයි. අනාර්ය පර්යේෂණ වලින් ලැබෙන්නේම නැත. මෙය ඉහතකී ත්‍රීමාන භාවිතාවේ පළමු වැන්නයි. දෙවැන්න සමුපකාරය නිෂ්පාදන මාදිලියක් කිරීමටම සමුපකාරය භාවිතාවවේ. තුන් වැන්න සමාජීය හා අධ්‍යාත්මික විරෝධයන් හා ප්‍රතිවිරෝධනයන් නිෂේධ කිරීමට සමුපකාරය භාවිතාවවේ. මේ භාවිතාවන් තුන නැතිතැන සැබෑ සමුපකාරය නිෂ්පාදන මාදිලිය කිසිසේත් මතුනොවේ.

මේ දිනවල අපර දිග මාක්වාදය කරට ගත් අය කියන්නේ රික්තයක් ඇති බවය. මෙම රික්තය කිසිම මාක්ස්වාදීපක්ෂයක් භාවිතාවට ගෙන රික්තය පිරවීමට ක්‍රියා කරන්නේ නැති බවය. රික්තය යනු හිඩසකි. කිසිවක්නැත යන අර්ථය යෙදුමකි. ලෝකයේ කිසිවක් රික්තයකින් මතුවී නැත. මතුවන්නේද නැත. හිස්තැනකින් ප්‍රභවයවූ දෙයක් තිබේද? නැත. ඕනෑම දෙයක් මතුවන්නේ ඊට පසුබිමක් හා පෙළඹවීමක් ඇත්නම් පමණි. ධනසංහත සමාගම් ව්‍යවසායකත්වයට එක්සත් සහකාර සමාගම් ව්‍යවසායකත්වය මතුවන්නේම එකී පසුබිම තුල ඊට අයත් පෙළඹවීමක් ඇත්නම් පමණි. එය එක් අයකුට හෝ එක් තැනක කරන පෙළඹවීමෙන් කළ නොහැකිය. පැරිස් කොමියුනයද, නිව් හාම්නී ජනපදනයද, 1917 සිට පැවති සමාජවාදය 1990 දී බිඳ වැටෙන්- නේද එක්සත් සහකාර සමාගම් ව්‍යවසායකත්වය නිෂ්පාදන මාදිලියක් බවට පත්කිරීමට පෙළඹමක් නොමැති වීමෙන්ය. එය අදත් නැත. අද ඇත්තේද කම්කරු පාලනය වෙනුවට සේවක පාලනය ගැන දේශනයක්ය. මෙය හරියට 1970 දශකයේදී ගෝලීය අර්බුදයට විසඳුමක් ලෙස එදා සමුපකාරය තුල භාවිතාවට ගත සලාක පතට භූමිතෙල්

බෙදාහැරීම කලාක් මෙන් අද කිවු ආර් (Q R)කෝඩ් එකට භූමිතෙල් පමණක් නොව සියල්ල බෙදාහරින ක්‍රියාවට සමානය. 1957 සිට වත්මන් අගමැති තුමාගේ පියා වන සමසමාජ නායක පිලිප් ගුණවර්ධන මහතා ආහාර, කෘෂිකර්ම හා සමුපකාර විෂය භාර ඇමති වරයා සමුපකාරය දේශපාලනික භාවිතාවට ගත් ආකාරයත් 1970 සිට 1975 දක්වා සමසමාජ නායකයින් සමුපකාරය දේශපාලනික භාවිතාවට ගත් ආකාරයත් සොයා බලන්නේනම් අද සමසමාජවාදයෙන් මතුකරන ඊනියා සහයෝගීතාවය තෝමස් මෝ ගේ උතෝපියා වක් නොවේද? වමේ දකුණේ කිසිම කෙනෙකු මෙම සමුපකාර භාවිතාවන් කතා කරන්නේ නැත. සමුපකාර විද්‍යාල යෙන් උපන් අය සමුපකාර විද්‍යාය ජාතික සමුපකාර සංවර්ධන ආයතනක් වී සමුපකාර විශ්ව විද්‍යාලයක් බවට පත්කර ප්‍රාග්ධනයේ කුලී කරුවන් බිහිකරන තරුණ ව්‍යවසායකත්වය වැඩ පිළිවල සමුපකාර භාවිතාවේ ත්‍රීමාන භාවිතයන්ට පරිනාමය කර ගැනීමට කතා නොකිරීම ඒ ඒ අයගේ සමුපකාර භාවිතාවන් ප්‍රශ්ණ කල යුතු නොවේ ද?

යටත් විජිත රජයේ සිට රජය සමුපකාරය භාවිතාවට ගෙන ඇත්තේ රට සංවර්ධනය කිරීමට නම් නොවේ. ඒ බව කියවෙන්නේ 1957 සමසමාජ නායක පිලිප් ගුණවර්ධන මහතා සමුපකාර සංවර්ධන බැංකු පනත ගෙන ආවිට මතුවූ අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන් නිෂේධ කිරීමට ලබා දී ඇති පිළිතුරු කතාව අධ්‍යයනය කරන විටය. 1957 වන තෙක් පැවති යටත් විජිත හා නව යටත් විජිත ආණ්ඩු සියල්ල සමුපකාරය භාවිතා කර ඇත්තේ විපතක් ඇති වූවිට ආධාර බෙදීමේ කෙමණක් වශයෙන්ය. 1977 පසු එම කෙමණ ඉලගොට්ටවී ඇත. 1977 පසු බිහූ සියළුම ඉලගොටු ආණ්ඩු මෙයට වගකිය යුතුය. එමපමණක් නොවේ ඊට කපුරු කට්ටකුමංජල් ඇල්ලා පාවඩ එළා ඇති සියළුම සමුපකාර සාමාජිකයන්, නායයන්, සේවකයන්, නිලධරයන්, සමුපකාර ගුරුවරු, උපදේශකලා සියල්ල වගකිය යුතුය. ගස් ගල් වගේ සිටි මිනිසුන් වැල් කෝටු බවට පත්කර ඇති මේ පිරිස සමුපකාර සමායතන වලින් සාංගමික ප්‍රජාතන්ත්‍රවාදය හා ගිවිසුම්ගත ප්‍රජාතන්ත්‍රවාදය සාමාජික පාලනයට හා පරිපාලනයට එක්කර නියාමනය කළයුතුය. මෙය 1957 දී පිලිප් ගුණවර්ධන මහතා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන තුරු බලා නොසිට සමුපකාර අතුරු ව්‍යවස්ථාව වෙනස් කර ඉටුකර ඇති කාර්ය එතුමාගේ පුත් අගමැති වූ මොහොතේ කළයුතු කාර්යයකි. සමුපකාර ආයතන සියල්ල බේරා ගැනීම එතනින් ආරම්භ කරමු. එය පළමු අරගලය කර ගනිමු. රොච්ඩෙල් පුරෝගාමීන් 1918 සිට එංගලන්ත සමුපකාර පක්ෂය වටා එක්ව අදත් ක්‍රියාකරන ආකාරය දේශපාලනිකව අධ්‍යයනය කරන්න. දේශපාලන ආධාර නැතිව කිසිම කිසි සමායතනයක් පැවතිය නොහැකිය.

පෙර අපර දිග අපෝහක දර්ශනවාදය අතර සිද්ධාර් ගෞතමයාණන් ප්‍රථමික දර්ශනවාදියා ලෙසත් කාල් මාක්ස් ද්වීතීක දර්ශනවාදියා ලෙසත් අප පලමුව තෝරා බේරා වෙන්කර ගත්තේ ඇයිද? යන ප්‍රශ්ණය විසඳාගත යුතුව ඇත්තේ මෙකී කරුනු නිසාමය. මෙම අපෝහක දර්ශනික සම්ප්‍රදායන් දෙකම සමාජ, ආර්ථික, අධ්‍යාත්මික ව්‍යවසායකත්වය ගැන කතා කරයි. ක්‍රියා කරයි. එහිදී පවතින සමාජය තුල මිනිසා නැමැති සත්වයාගේ ව්‍යවසායක ක්‍රියා සිද්ධාර්ථ ගෞතමයාණන් පවතින සමාජය තුලින් වෙනස් කිරීම ආරම්භ කරන්නේ අධ්‍යාත්මක ප්‍රාග්ධනය ප්‍රථමිකදේ බවට පත්කරමින්ය. කාල්මාක්ස් ද්විතීකදේ බවට පත්කර මින්ය. මෙහිදී තෘෂ්නාව ඉවත්කර මානව විමුක්තියත් සමාජ විමුක්තියත්, ජාතික විමුක්තියත්, අන්තර් ජාතික විමුක්තියත්, අත්පත් කර දීම සිද්ධාර්ථ ගෞතමයානණ් දර්ශනියාවී ඇත. මාක්ස් සමාජ ව්‍යවසායකයා

වශයෙන් සමාජය වෙනස් කර මිනිසා ගේ විමුක්තිය ගැන කතා කර ඇත. එනම් නිවන් දැකීමෙන් පසු තෘෂ්ණාව ඉවත් කිරීමය. එය අද ණයට හෙට මුදළට යන්න වෙළඳාමේ පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීමට භාවිතාකරන කාරක නියෝග වලට සමානවේ.

එසේ අප කියන්නේ ඇයි? මෙම දෙදෙනාම කාමසුකල්ලිකාණු ජීවන ක්‍රමය හෙවත් ධනවාදී ජීවන ක්‍රමය බැහැර කර ඇත. ඒ අතින් දෙදෙනාම සමානය. එහෙත් ප්‍රතිවිරෝධයක් ඇත. එනම් තෘෂ්ණාව නිෂේධ කර නිවන හෙවත් මානව විමුක්තිය ලබා ගැනීම සහ නිවන හෙවත් මානව විමුක්තිය ලබා ගැනීමෙන් පසු තෘෂ්ණාව නිෂේධ කර ගැනීමවේ. මෙය තවදුරටත් පැහැදිලි කරන්නේ නම් සිද්ධාර්ථ ගෞතමයාණන් පවතින සමාජය වෙනස් කිරීමට පෙර එකී පවතින සමාජය තුල ජීවත්වන මිනිසා වෙනස් කරමින් සමාජය වෙනස් කරයි. මාක්ස් එය ඊට ප්‍රතිවිරුද්ධව පවතින සමාජය වෙනස් කළ පසු එසේ වෙනස් වූ සමාජය තුල මිනිසාගේ විමුක්තිය ගැන කතා කරයි. ක්‍රියා කරයි. ඕනෑම මිනිසකු වෙනස් වන්නේ භාවිතාවන් වෙනස් කිරීමෙන්ය. වෙනස් වූ පසු භාවිතාව වෙනස් කිරීම යනු අද මුදලට හෙට ණයට යන ප්‍රතිපදාව මත තම භාවිතාව ගෙන යෑමය.

පවතින්ගේ ධනපති සමාජයකි. එම සමාජය නිර්මාණය වන්නේ සම්භාව්‍ය මාක්ස්වාදය තුළ උගන්වා ඇති ලියා ඇති පවුල, පෞද්ගලික දේපල ක්‍රමය හා රාජ්‍ය ඇති වූ හැටි නම් කෘතියේ කියන කතාවත් සිද්ධාර්ථ ගෞතමයාණන් අග්ගඤ්ඤ සූත්‍ර දේශනයෙන් එකී ත්‍රිත්වයම ඇති වූ හැටි කියන කතාවත් අතර ඇති අපෝහක ඒකත්වය, වෙනස හා ප්‍රතිවිරෝධයත් ඒ අතර ඇති අපෝහක සම්බන්ධතාවයන්ද සොයා බැලීමෙන්ය. එවිට අප තේරුම් ගතයුතු විමුක්ති මාර්ගය ඇත්තේ කොතනද? යන්න 101 වන සමුපකාර දිනදීවත් සොයා බැලිය යුතුව ඇත. සමුපකාර ආවර්ජනය එයයි.

සමුපකාර දාර්ශනිකයා සමුපකාරයේ ඉතිහාසය සමුපකාර භාවිතයට එකතු කරන්නේ නැත. ඉතිහාසයේ සමුපකාරය සමුපකාර භාවිතයට එකතු කරයි. දාර්ශනිකයා ඉතිහාසය වෙනස් කරන්නා බවට පත්වන්නේ එවිටය. එහිදී සමාජ පරිනාමය සිදුවන්නේ කාල්මාක්ස් සූත්‍රගත කර ඇති ප්‍රාග් කොමියුනිස් සමාජයේ සිට විද්‍යාත්මක කොමියුනිස් සමාජ දක්වා පරිනාමය වීමෙන් නොව ප්‍රාග් ගෝලීය සමුපකාර ප්‍රජාතන්ත්‍රවාදී කොමියුනිස් සමාජයේ සිට විද්‍යාත්මක සමුපකාර ප්‍රජාතන්ත්‍රවාදී කොමියුනිස් සමාජ දක්වා පරිනාය වීමෙන් බව තහවරුවේ. එය තහවරු කිරීමට සමුපකාර අපෝහක විද්‍යාව හා දර්ශනය, සමුපකාර භෞතික විද්‍යාව හා දර්ශනය, සමුපකාර සමාජ විද්‍යාව හා දර්ශනය, සමුපකාර දේශපාලන විද්‍යාව හා දර්ශනය, සමුපකාර මනෝ විද්‍යාව හා දර්ශනය, සමුපකාර නීති විද්‍යාව හා දර්ශනය, සමුපකාර කළමනාකරණ විද්‍යාව හා දර්ශනය, සමුපකාර ගිණුම්කරණ විද්‍යාව හා දර්ශනය, සමුපකාර පර්යේෂණ විද්‍යාව හා දර්ශනය,......ආදී විද්‍යාවන්ගේ දර්ශනය උගන්වමින් සමුපකාර ව්‍යවසායක ක්‍රමය භාවිතයට ගනිමින් සමුපකාර සාමාජිකයා, සේවකයා, නායකයා, නිලධරයා උසිගන්වන්නේ නැතිව බල ගැන්වීම සිදු කරමින්ය. එහිදී සමුපකාරිකයා දාර්ශනිකයා වන්නේ අනුගාමීත්වය තුළින් නායකයකු වීමෙන් නොව, මිනිසුන් මිනිසුන් විසින් මිනිසුන් සමග "එකා සැමටත් සැම එකාටත්" යන නියමය පරිදි දර්ශනය නායකයා බවට පත්කර ගනිමින් සමුපකාර විද්‍යාවේ මූලිකාංග පදනම් කරගත් සාමාජයක් බිහිවීමෙන්ය. එහිදී සැම සමුපකාරිකයෙකුගේම නායකයා සමුපකාර ප්‍රතිපත්ය හා සමුපකාර අපෝහක දර්ශනයවේ.

සමුපකාර සමායතනයක කවුරු නායකත්වයට පත්වුවත් ඔහු ගේ සමූපකාර නායකයින් වන්නේම සමුපකාර ප්‍රතිපත්ති හා සමුපකාර අපෝහක දර්ශනවේ. එකී ප්‍රතිපත්ති හා දර්ශනය නායකයා බවට පත්කර ගන්නේ නැති නම් සමාජිකයා ඔහුව කැඳවා ගැනීම කළයුත්තේ වෙස්සන්තර ජාතකයෙන් උගන්වා ඇති භවිතාව භාවිතයට ගැනීමෙන්ය. නැතිනම් ඊට අයත් කාරක නියෝග භාවිතයට ගැනීමෙන්ය.

ඒ අර්ථයෙන් දාර්නිකයකු ලෙස ලෝකයට පළමු ආදර්ශය දී ඇත්තේ සිද්ධාර්ථ ගෞතමයාණන්ය. ඒ බව තවහරුවන්නේ සම්මුති මරණය සිදුවන අවස්ථාවේදී එහි පැමිණි භික්ෂුවක් තමන් වහන්සේගෙන් පසු මෙම සංඝ සාමාජයට පවත්වාගෙන යෑමට සුදුසු නායකයකු පත්කරන්නේ නැද්ද? කියා විමසූ පසු ලබා දුන් පිළිතුර සොයා බලන්න. මාගෙන් පසු නොව මාගේද නායකයා වූයේ සොබාදහමේද, සමාජයේද **දයලෙත්තික** විද්‍යාවේ දර්ශනය බව කියා ඇති බව අපගේ විචාරයත්මක ප්‍රවේශය තුලින් සොයා ගෙන ඇති නිගමනයවේ. ප්‍රතිපත්ති වලට හා දර්ශනයට නායකත්වය දී කටයුතු කරන්න. ආමිසයෙන් ප්‍රතිපත්ති පූජාවට මාරුවන්න. සම්මුති සතයයනේ පරමාර්ථ සත්‍යය වෙත ගොස් සමුපකාර චතුරාර්ය සත්‍යය මතුකර ගන්න. ඒ අනුව දාර්ශනිකයා එක්කෝ පාලකයෙක් විය යුතුය. නැතිනම් පාලකයා දාර්ශනික යකු විය යුතුය යන්න සොයා බලන විටත් දාර්ශනිකයාගේ කාර්ය සමුපකාර විස්තර කිරීම නොව සමුපකාර වෙනස් කිරීම බව කියන විටත් නායකයා වන්නේ පුද්ගලයෙක්, පංතියක්, ජාතියක් නොව සචේතනික මිනිසා සහ එකී මිනිස් පවුලවේ.

පවුල, පෞද්ගලික දේපල ක්‍රමය හා රාජ්‍ය ඇති වූ ආකාරය ගැන කතා කල දෙදෙනාගේම ප්‍රාථමික දේ වූයේ පවුල නොවේද? එසේ නම් ගමක්, නගරයක්, රටක්, ලෝකයක් සංවර්ධනය වන්නේ මිනිසා සහ පවුල මුල්කරගත් සමාජ සජීවීකරණ ක්‍රියාවක් මත සිවිල් සාමාජ සාමාජිකයන් බලගන්න සාමූහික ක්‍රියාවකින් පමණමය. එහිදී සමුපකාර සමාජ සංකල්පයේ මූලික හෙවත් ප්‍රථමික සංකල්පය වන්නේ කුමක්ද? මේ ගැන මහාචාර්ය කෝගන් මිශූනෝ බෞද්ධ අපෝහක විද්‍යාවේ දර්ශනය මතුකර මින් එහි අන්තර්ගත පෙන්වා දෙයි. එනම්, එක් අයකු නම් හැම දෙනාම ය. හැම දෙනාම නම් එක් අයකු ය. එක් අයකුගේ ක්‍රියාවක් සමස්ථ ප්‍රජාවගේම හොඳට හෝ නරකට බලපායි. එහෙයින් අප වටා ඇති ලොවත් සමාජයත් එකම සමාජයකි. යනුවෙන් බව පෙන්වා දෙයි. එසේ නම් පාලකයකු විසින් රැකවරණය දිය යුත්තේ පංතියකට නොව සමාජය ගැන සලකන විට මානව සංගතියටද පමණක් නොව සිළුම සත්ව වර්ගයාටත් ගහකොල ආදීයත් ඇතුළු මුළු විශ්වයේ පැවැත්ම සඳහාම වේ.

මෙයින් කියන්නේ කුමක්ද? මාක්ස් කියන පංතිය මුල් කරගෙන නොව සමුපකාර ව්‍යවසායකත්වය තුළ මිනිසා හා මිනිස් පවුල් මුල්කරගෙන අප වටා ඇති ලොවත් සමාජයත් සංර්ධනය කිරීමට ප්‍රවේශවිය යුතු බවය. මිනිසා හා පවුල සාමාජිකයා කරගත් ලොවම එකට ගෙන ඇති එකම සමාජ දේශපාලන ව්‍යාපාරය සමුපකාර ව්‍යාපාරය වේ. ඒ අනුව විවෘත හා ස්වේච්ඡා සමාජිකත්වය යටතේ ඒ ඒ කාර්යයන් සඳහා බිහිකරන සමුපකාර සමායතනයේ නිත්‍ය සාමාජිකත්වයට ඇතුලත් කරගත යුත්තේ කවුද? ආශ්‍රිත සාමාජිකත්වයට ඇතුලත් විය යුත්තේ කවුද? යන්න සාමාජිකයන් ඇතුලත් කර ගැනීමේදීම අතුරු ව්‍යවස්ථාවට ඇතුලත් කර ගත යුතුව ඇත. මෙලෙස අතුරු ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරන විට අතුරු ව්‍යවස්ථාවේ ආකෘතිය හා අන්තර්ගතය සඳහා මග පෙන්වන නියමයන් හතර පළමුව සමුපකාර පරීක්ෂක වරයා

තේරුම් ගත යුතුය. එහිදී පරීක්ෂක වරයා දාර්ශනිකයකු වන්නේ කුමණ අර්ථයෙන්ද යන්න අවබෝධකර ගෙන නැතිනම් මහා සංඝ රත්නයට ඇතුල්වී අය අතර බෞද්ධ අපෝහක දර්ශනය අවබෝධ කරගෙන නොමැතිව ධර්ම සන්නිවේදනයේ යෙදෙන අයට සමානවනු ඇත.

ඒ අනුව අතුරු ව්‍යවස්ථාවක් අධ්‍යයනය කිරීම, අවබෝධකර ගැනීම, අවබෝධකර දීම, කෙටුම්පත් කරදීම යන සමුපකාර පරීක්ෂක වරයාගේ දර්ශනික ක්‍රියාව වන්නේ ව්‍යවස්ථාවක ඇති නෛසර්ගික නියමයන් කුමක්ද? හරයාත්මක නියමයන් කුමක්ද? අපෝහක/ දයලෙත්තික/ ද්විසටනාත්මක නියමයන් කුමක්ද? නෛතික නියමයන් කුමක්ද? යන්න අවබෝධ කරගෙනම සියළුම සමුපකාර භාවිතාවට අයත් කාර්ය කළයුතුව ඇත. මෙය ආවර්ජනය කර ගැනීම සියළුම සමුපකාර නිලධරයන්ගේ පළමු විභාගයේදී කාර්ය විය යුතුය.

මේ සියල්ල තුළ සමුපකාරයේ දාර්ශනිකයා වශයෙන් අපර දිගින් මතුව ඇත්තේ (ක්‍රි.ව.1771-1858) රෙබට් ඕවන්ය. ඔහුගේ ඉගැන්වීම් ඕවන් වාදය වශයෙන් අපර දිගින් මතුවන්නේ සමුපකාර සමාජවාදය ලෙසය. එය (ක්‍රි.ව.1818-1883) කාල් මාක්ස්ගේ මාක්ස්වාදී සමාජවාදයෙන් වෙනස් විය. එහෙත් ප්‍රතිවිරෝධී නොවීය. එකී සම්භාව්‍ය මාක්ස්වාදය තුළ ඕවන්වාදයෙන් මතුවූ සමුපකාර සමාජවාදය මනෝරාජිත සමාජවාදය ලෙස නම් කර ඔවුන් විසින් විද්‍යාත්මක සමාජවාදය ගොඩනගා ඇත. එහෙත් 1917 සිට 1990 දක්වා පැවති සමාජවාදය තුළින් මාක්ස්වාදයට විද්‍යාවේ දර්ශනයත්, විද්‍යාවේ දර්ශනයට මාක්ස්වාදයත් ඇතුල් කිරීමට නොහැකිවීමෙන් විද්‍යාත්මක මාක්ස්වාදය විඥානවාදී මාක්ස්වාදී දර්ශනවාදය වෙත ගමන් කර ඇත. එමගින් මාක්ස්වාදී භෞතිකවාදය මාක්ස්වාදී විඥානවාදයක් වූයේ කෙසේද? යන්න සොයාබැලිය යුතුවද ඇත. එයට ඇති එකම පිළිතුරු ද්විත්ව විභේදන අපෝහක/ දයලෙත්තික/ ද්විසටනාත්මක නියමයන් ගෙන් එහා ගෙන යෑමට පශ්චාත් මාක්ස්වාදීන්ට හැකියා ලැබී නැති නිසාය. එයටත් හේතුවක් ඇත. එය වෙන කිසිවක් නොව අපර දිග සමාජය තුළ එකී දර්ශනවාද ගොඩනැගෙන විට ග්‍රීසිය විඥානවාදී අපෝහක/ දයලෙත්තික/ ද්විසටනාත්මක නියමයන් තුළ හිරවී තිබීමය. මාක්ස් 1818 උපදින ලැබුවේ විඥානවාදයට හිරව තිබූ අපර දිග සාමාජයකය. එම නිසා මාක්ස්ගේ කාර්ය වූයේ එකී විඥානවාදයෙන් භෞතිකවාදය වෙත සිය දර්ශනය ඔසවා තැබීමය.

එහෙත් ක්‍රි. පූ. 563 දී සිද්ධාර්ථ කුමරු උපත ලබන විට පෙර දිග සමාජය වූ මහා භාරත එකී දර්ශනවාද දෙකට හිරවී තිබුණි. සිද්ධාර්ථ ගෞතමයාණන්ගේ කාර්ය වූයේ එකී ද්විත්ව විභේදන අපෝහක/දයලෙත්තික/ ද්විසටනාත්මක නියමයන් නිෂේධ කර අපෝහක/ දයලෙත්තික/ද්විසටනාත්මක නියමයන් සොයා ගෙන ඒකී නියමයන් අනුව පංතිය හෝ ජාතිය හෝ පුද්ගලයා නොව පවුල හා පවුලේ සාමාජිකයා වූ සචේතනික මිනිසා මුල් කරගෙන සමාජය ප්‍රතිනිර්මාණය කිරීමය. සමුපකාර භාවිතාවට අයත් වන්නේ ද්විත්ව විභේදනයෙන් එහා ගිය අපෝහක දර්ශනය මුල්කරගත් සමුපකාර පරීක්ෂක වරුන්ගෙන් යුත් සමුපකාර නිෂ්පාදන බලවේග සහ සමුපකාර නිෂ්පාදන සම්බන්ධතා ගොඩ නගන සමුපකාර භාවිතාවන් තුල ක්‍රියා කරන ආර්. ඩී. වෛද්‍යරත්ලාගේ ගුරුකුලයේ අය වීමටය. එහිදී රට ගිය වාර ගණන අනුව පරීක්ෂක සේවයෙන් කොමසාරිස්වරු බිහිකිරීම අනුව නොව සමුපකාර අපෝහක දර්ශනවවාදය සිතටගත් කයටගත් වචනයටගත් රාජගුරු, ලියනගේ වැනි කොමසාරිස්වරු නිර්මාණය කරන සමුපකාර පරීක්ෂක සේවයක් 101 න් පසු 102 වන

විට පත්කරගැනීමට ආවර්ජනය කරගනිමු.

මෙහිදී මහාචාර්ය ප්‍රැන්සිස් ෂකුයාමා 1990 සෝවියට් දේශය බිඳවැටීමෙන් කියන කරුනු මෙන්ම මහාචාර්ය සැමුවෙල් හටින්ටන් කියන ශිෂ්ටාචාරයන්ගේ මහා ගැටුමද පදනම් කරග ගෙන නම් නොවේ. රොබට් ඕවන්ගේ නිව් හාමනී ජනපදය ගැන සම්භාව්‍ය මාක්ස්වාදීන් කියන කතාව මූලික දේ කරගෙන ආවර්ජනය ආරම්භකල යුතුය. ඕවන්ගේ ක්‍රියාව අසාර්ථක වූයේ ඇයි? නොනවතින සමුපකාර අපෝහක න්‍යාය හා භාවිතාව එහි නොතිබුණ නිසාමය. එනම් එක් ජනපදයක් බිහිකිරීමෙන් පමණක් කිසිම මාදිලිය සාර්ථක වන්නේ නැත. මෙය එක් ධනසංහත සමාගමක් පමණක් බිහිවූයේ නම් පවතින ධනවාදී මාලිය ගෝලීයකරණය වෙයිද? කිසි සේත් තනැත. එය රිත්තකයින් ඇතිවූවක් නොවේ. ධනවාදයට අවශ්‍ය පසුබිමත් පෙළඹවීමත් තෘෂ්නාවෙන් ඇතිවන දෙකි. මේ ගැන කාල්මාක්ස් 1948 දී කොමියුනිස් පක්ෂයේ ප්‍රකාශනයෙන් විද්‍යාත්මකව පැහැදිලි කර ඇත.

පැහැදිලි කිරීම විද්‍යාත්මක වුවත් භාවිතාව විද්‍යාත්මක වූයේ නැත. සමාජවාදය තුලින් මතුවූ සමුපකාරය 1990 සිට බිඳවැටෙන විට ධනවාදය තුලින් මතුවූ සැබෑ සමුපකාරය 1918 දී සමුපකාර පක්ෂයක් බිහිකර ක්‍රියාත්මක වීම ආරම්භ කර ඇත. එය සමුපකාර ජාත්‍යන්තරය බිහිවීමට වසර 4 පෙරය. මේ සියල්ල තිබියදී වසර 125 පමණ භාවිතාකල සමුපකාර ධජය සමසිසි ධජය බවට පත්වන්නේ ඇයි? යන ප්‍රශ්ණයට ඇසිය යුතුව ඇත.

රොච්ඩෙල් පුරෝගාමීන් 1844 දී බිහිකල සමුපකාර මාදිලිය කාර්මික කම්කරුවන්ගෙන් පමණක් බිහිකර එකී කාර්මාන්ත ශාලාවටම පමණක් සීමා වූවානම් සමුපකාර සංගමය බිහිකර ගැනීමට හැකියාව ලැබෙන්නේ නැත. සමුපකාරය ගෝලීයකරණවන්නේ එක් ගමක එක් රටක පමණක් සමුපකාර මාදිලිය සංස්ථාපනය වීමෙන් නම් නොවේ. එය ලංකාවේ සඳලංකා සමුපකාර මාදිලිය හෝ පාළුගම සමුපකා මාදිලිය හෝ අධ්‍යයනගය කරන විටත් 1957 විවිධ සේවා සමුපකාර මාදිලිය අධ්‍යනය කරන විටත් අවබෝධ කරගත යුත්තේ ගමින් ගමට සංස්ථාපනය වී ජාතික හා ජාත්‍යන්තර සංවර්ධන මාදිලියක් බවට පත්වී ඇත්තේ කෙසේද? යන්න සොයා බැලීමෙන් අවබෝධවේ. තවද මෙවැනි සොයා බැලීම් ලාංකික සමුපකාර ප්‍රජව කර තිබේද? අපට නම් හමුව නැත.

කම්කරුවන්ගෙන් සමුපකාරය ලංකාවේ ආරම්භය 1927 දී පස්සර වතුයායෙන් මතුව ඇත්තේ එයයි. හාල් පොතෙන් ගමින් ගමට යන්නේ 1942 දී යුද්ධය තුලින් සමුපකාර භාවිතාවය. 1957 බිහිවූ විවිධ සේවා සමුපකාර මාදිලිය අධ්‍යයය කරන්න. ආරම්භය ගමකට සීමා විය. විකාශනය 1970 දී කුඩා කුඩා විවිධ සේවා සමුපකාර රාශියක් එකක් බවට පත් වීමෙන් විශාල සමුපකාර සමායතයක් බිහිවීමෙන්ය. මෙය බිහිවන්නේ 1969 නිකුත් වූ ලේඩ්ලෝ සමුපකාර කොමිෂමේ නිර්ණායක මත නොවීය. එසේ නොවූනා නම් විවිධ සේවා සමුපකාර මාදිලිය මේ වන විට ගෝලීයකරණය වීමට යම් ඇරඹුමක් ගත හැකිව තිබුණි. එය එසේ වන්නට දැන්වත් ජාතික විවිධ සේවා සමුපකාර සංගමයක් බිහි වී එය අන්තර් ජාතික විවිධ සේවා සමුපකාර මාදිලියක් දක්වා ගමන් කලයුතුය. එහිදී සමුපකාර අතර සමුපකාරය යන ප්‍රතිප්තිය අන්තර් ජාතික වශයෙන් බිහිවී විය යුතුය.

එය ආරම්භයක් වශයෙන් බ්‍රික්ස් මාදිලියට සමගාමීව ආසියාවේ සමුපකාර සමායතන සමග සමුපකාරය අතර සමුපකාරය යන ප්‍රතිපදාව මත

එක් විය යුතුය ඇත. ද්විත්ව විභේදන අපෝහක විද්‍යාවෙන් හා දර්ශනයෙන් එහා ගිය විද්‍යාවේ දර්ශනය තුලට එය රැගෙන යෑම කළ යුතුය. එහිදී සමුපකාර පරීක්ෂක වරයා දාර්ශනිකයකු වන්නේ සමුපකාර ආපෝහක විද්‍යාවේ දර්ශනය සමුපකාර ව්‍යවසායකත්වයට ඇතුල් කිරීමට එකී අපෝහක දර්ශනය අවබෝධකර ගැනීමෙන් පමණි. ඒ බව සනාථ වන්නේ ක්‍රි. පූ. 528 දී සිද්ධාර්ථ ගෞතමයාණන් පළමු සන්නිවේදන කණ්ඩායමේ සාමාජිකයන් අමතා කීවේ කුමක්ද? යන්න සොයා බැලීමෙන්ය. නුඹලා දැන් දුක යනු කුමක්ද? දුකට හේතුව කුමක්ද? එම හේතු නැති කරන්නේ කෙසේද? නැති කරන මග කුමක්ද? කියා අවබෝධකර ගෙන ඇත. එකී අවබෝධය අවිඥානක, සවිඥානක මිනිසාට අවබෝධකර දීමෙන් සචේතනික මිනිසකු බවට පත්කර ගතයුතුවේ.

මෙයින් අදහස් වන්නේ සමුපකාර පරීක්ෂක වරයා සමුපකාර විද්‍යාලයෙන් පළමු විභාගය සමත් වන විට දුප්පත් කම යනු කුමක්ද? එය ඇති වීමට හේතු මොනවාද? එය නැති කරන්නේ කෙසේද? නැති කරන මග කුමක්ද? යන සමුපකාර චතුරාර්ය සත්‍යය දර්ශනය අවබෝධ කරගෙන ඇති බවය. එසේ අවබෝධකර ගැනීමෙන් ඔහු සමුපකාර නිෂ්පාදන මාදිලිය ගොඩනැගීමට සමුපකාර සමාජිකයන් බලවන්තයකු බවට පත් කරන ක්‍රියාවත් සමාජ ප්‍රතිවිරෝධතා නිෂේධනය කිරීමටත්, 47 පරීක්ෂණ නොව සමාජ පරීක්ෂණ කරන සචේතනික මිනිසා බවට පත්වී සමුපකාරයේ ඉතිහාසයෙන් නොව ඉතිහාසයේ සමුපකාරයෙන් සමුපකාර භාවිතාවන් ක්‍රියාවට නගන දාර්ශනිකයෙක්, මිත්‍රයෙක්, මග පෙන්වන්නෙක්, සමුපකාර සංවර්ධන සන්නිවේදකයෙක්, සමාජ ව්‍යවසායකයෙක්, ආර්ථික ව්‍යවසායකයෙක්, අධ්‍යාත්මික ව්‍යවසායකයෙක්, බවට පත්වී ත්‍රීමාන වත්කම් ඇති මිනිසා බවට පත්වේ. මෙහිදී ත්‍රීමාන වත්පොහොසත් කම යනු කුමක්ද? යන්න අවබෝධ කරගත යුතුය. එනම් නැණ වත්කම, ගුන වත්කම හා සිල් වත්කමයි. එවිට වෙඩි කන වැඩ නොකරන පරීක්ෂක වරයෙන් වනු ඇත. මෙකී ත්‍රීමාන වත්කම් රැස්කර ගෙන ඇති අය පරීක්ෂක සේවයට අවැඩක් කරන අයකු නොවනු ඇත.

දැන්වත් මේ සියල්ල ආවර්ජනය කර සමුපකාර ව්‍යවසායක ක්‍රියාව අවබෝධ කරගැනීමට ප්‍රවේශ වෙමු. එහිදී බෞද්ධ දේශපාලන ආර්ථික විද්‍යාවේ දර්ශනය අනුව මිනිසාට ජීවත් වීම සඳහා මූලිකව ඇති අවශ්‍යතා 4 ගැන කර ඇති කතාවෙන් ආරම්භ කරමු. එය වූකලී චීවර හෙවත් ඇඳුම් පැළඳුම්. පිණ්ඩපාත හෙවත් ආහාර පාන, සේනාසන හෙවත් වාසස්ථාන. ගිලානප්‍රත්‍ය හෙවත් බෙහෙත් හේතු වේ. ඇඩම් ස්මිත්ගේ දේශපාලන ආර්ථික විද්‍යවේ දර්ශනයට ගිලානප්‍රත්‍ය එක්වන්නේ 1962 දීය. සමුපකාර දේශපාලන ආර්ථික විද්‍යාවේ දර්ශනය තුල එකී හතරට තවත් එක් අවශ්‍යතාවයක් එක් කර ඇත. එය වූ කලී ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම හා ඉගෙන ගැනීමවේ. එය ඉගෙනගත හැක්කේම සමුපකාර ත්‍රීමාන භාවිතා වෙන්මය. ත්‍රීමාන භාවිතාව නැති කිසිවකු දාර්ශනිකයකු වන්නේම නැත. ඔහු සමුපකාරය විස්තර කරන්නෙකු නොව කියවන්නෙකු හා පාඩම් කරන්නෙකු වේ.

මෙම අවශ්‍යතාවලින් පාවහන් පැළඳීම, ගැනීම හෙවත්, පරිභෝජනයට ගැනීම ගැන අධ්‍යයනය කරමු. මිනිසා පරිභෝජනය කරන සෑම භාණ්ඩයක්ම එසේ පරිභෝජනය කිරීමට නම් ඊට පෙර ඒවා නිෂ්පාදනය කල යුතුමය. නිෂ්පාදනය නොකල කිසිවක් පරිභෝජනය කල නොහැකි බව එයින් ගම්‍යවේ. එපමණක් නොවේ විකිනීමටද නොහැකිය. බෙදාහැරීමටද නොහැකිය. එසේ නම් අපි පාවහන් නිෂ්පාදනය ගැන සොයා බලමු.

එහිදී පළමුව පාවහන් නිපදවීමට අවශ්‍ය මොනවාද? කියා සොයා බලමු. පාවහන් නිපදවීමට අවශ්‍ය ප්‍රඥාව ප්‍රධානවේ. එය පාවහන් නිපදවීමේ අධ්‍යාපනය, පුහුණුව හා තොරතුරු පදනම් කරගෙන ක්‍රියාත්මකවේ. එමගින් නිෂ්පාදන සාධකයක් වූ ශ්‍රමිකයා බිහිවේ. මෙම ශ්‍රමිකයාට ඊට පසු පාවහන් නිපදවීමට අවශ්‍ය දේ මොවාද? ඒ සඳහා ගන්නා සියළුම අමු ද්‍රව්‍ය, තාක්ෂණය, ශ්‍රම උපකරණ, පාවහන් නිපදවන වැඩ පලක්, නැතිනම් කර්මාන්ත ශාලාවක් ඇතුළු කාර්යාලයක් ද, ඊට ආවේනිකවූ ව්‍යවසායක සංවිධාන ක්‍රමය හා මිනිසුන් අයත්ය.

නිපදවන පාවහන් වර්ගය අප රබර් සෙරෙප්පු කියා සිතුවොත් ඊට අදාළ පදම් කල රබර් හම් අවශ්‍යවේ. ඊට පසු ඊට එක්කරන රබර් පටිය අවශ්‍යවේ. සෙරෙප්පුව සකස් කිරීමේදී පරිභෝජනය කරන යන්ත්‍ර සූත්‍ර අවශ්‍යවේ. බලශක්තිය අවශ්‍යවේ. සෙරෙප්පු නිපදවන කම්හල ඉදිකිරීමට භූමියත් එම භූමියේ එකී කර්මාන්ත ශාලාව ඉදිකිරීමත් අවශ්‍යවේ. වාතය, හිරු එළිය හා ජලය අවශ්‍යවේ. පුහුණු ශ්‍රමිකයන් අවශ්‍යවේ. මේ ආකාරයට ඕනෑම වර්ගයක පාහන් නිපදවීමේදී ඊට අවශ්‍ය මූර්තදේ මෙන්ම අමූතනයන්ද එක්කර ගෙන මෙම නිපදවීම කළයුතුය. එසේ නිපදවීම කරන විට ඊට අයත් දේශපාලන ආර්ථික විද්‍යාව හා දර්ශනය කුමක්ද? මනෝ විද්‍යාව හා දර්ශනය කුමක්ද? කළමනාකරණ විද්‍යාව හා දර්ශනය කුමක්ද? ගිණුම්කරණ හා විගණන විද්‍යාව හා දර්ශනය කුමක්ද? ආදී වශයෙන් වූ විද්‍යාවන්ගේ දර්ශනය අවශ්‍යවේ.

එහිදී එකී විද්‍යාවේ දර්ශනයෙන් ඕනෑම ව්‍යවසායක හා ව්‍යාපාරික ක්‍රියාවක ව්‍යවසායේ අයිතිය, පාලනය, ප්‍රතිලාභ හා අවධාන පදනම් කරගෙන සංවර්ධනය ප්‍රවේශවේ. එකී ප්‍රවේශය පෞද්ගලික දේපල ක්‍රමය හා ඊට අයත් ශ්‍රම විභාජනය මුල්කරගත් ධනවාදී විද්‍යාවේ දර්ශනය පාදක කරගත් ප්‍රතිපත්ති. පෞද්ගලික දේපල ක්‍රමය හා ඊට අයත් ශ්‍රම විභාජනය මුල්කරගත් ෆැසිස්ට්වාදී විද්‍යාවේ දර්ශනය පදක කරගත් ප්‍රතිපත්ති. මාක්ස්වාදී සමාජවාදී දේපල ක්‍රමය හා ඊට අයත් ශ්‍රම විභාජනය මුල්කරගත් මාක්ස්වාදී විද්‍යාවේ දර්ශනය පදක කරගත් ප්‍රතිපත්ති හා සමුපකාර දේපල ක්‍රමය හා ඊට අයත් ශ්‍රම විභාජනය මුල්කරගත් සමුපකාර විද්‍යාවේ දර්ශනය පදක කරගත් ප්‍රතිපත්ති. වශයෙන් ප්‍රතිපදාවන් හතරක් ඇත.

පාවහන් නිපදවීම ඉහත කී ප්‍රතිපත්ති හතරින් එකක් තෝරාගත යුතුව ඇත. කිසිම ව්‍යවසායකයකුට මේ හතරම එකවර භාවිතය ගත නොහැකිය. එමෙන්ම මාක්ස්වාදී ප්‍රතිපත්ති ධනවාදී සමාජයේ භාවිතාවට ගෙන පාවහන් නිපදවිය නොහැකිය යන නිගමය මාක්ස්වාදී තුළ ඇති නිසාම මාක්ස්වාදීන් පාවහන් නිපදවන්නට තෝරාගත යුත්තේ කුමණ ප්‍රතිපත්තියද? යන්න සොයා බැලිය යුතුවද ඇත. ධනවාදී සමාජයක පාවහන් නිපදවන මාක්ස්වාදීන් එම නිපදවීම සඳහා තෝරාගෙන ඇත්තේම ධනවාදී ප්‍රතිපත්තිවේ. එසේ නොවන මාක්ස්වාදියෙකු සොයා ගත නොහැකිය. පාවහන් පමණක් නොවේ ධනවාදයට බැන බැන ඔවුන්ගේ නිපදවීම් කරන්නේම ධනවාදී ප්‍රතිපත්ති මතමය. ඊට හේතුව කුමක්ද? ඒ ගැන සොයා බලන විට රොබට් ඕවන්ගේ නිව් හාමනී ගම්මානය ගැන කියා ඇති දේ තේරුම් ගත යුතුව ඇත. එක්තරා නිශ්චිත නිෂ්පාදන මාදිලියක කොන්දේසි තුළ කෘතීම වෙනත් ආකාරයේ කොටු හෝ ගුහා සෑදිය නොහැකිය යන්න එමගින් තීරණය කර ඇත. නොනවතින සමුපකාර සංවර්ධන න්‍යාය හා භාවිතාවන් ඔවුන් දන්නේම නැති නිසා මෙම නිගමනයට බැස ඇති බව නැවතත් කිවයුතුය.

මෙම න්‍යාය උඩ මාක්ස්වාදීන් ධනවාදී සමාජය තුළ ධනවාදී ප්‍රතිපත්ති මත තම සියළුම ව්‍යාපාර හා ව්‍යසායක කටයුතු සිදු කරයි. එයින් කියන්නේ නිවන් දැකීමෙන් පසු තෘෂ්ණාව ඉවත් කරන බව නොවේද? මාක්ස්වාදී ධනවාදය කැගසමින් ධනවාදයට අනුගතව ක්‍රියා කිරීමෙන් නිදාගන්නේ එකතැනකට ගොරවන්නේ තවත් තැනකට යන්න පෙන්වා දී ඇත. ලංකාවේ සෑම මාක්ස්වාදී පක්ෂයකම සිටින ආයතනික ගත රැකියා කරන අයත් ආයතනික රැකියා නොකර සියළුම දෙනාගේත් ජීවනෝපාය මාදිලිය වන්නේම ධනවාදී මාදිලිය නම් ඒ අයව සමුපකාර ව්‍යවසායක ආයතනයට කැඳවා ගැනීමත් රඳවා ගැනීමත් කිසි දින සමුපකාරය නිෂ්පාදන බලවේගයක් බවට පත්කිරීමට ඉඩදෙන්නේම නැති බව මෙයින් තහවුරුවේ. එපමණක් නොවේ. ඒ අය බිහිකල සමාජවාදී සමාජයේද සමුපකාර ව්‍යවසායකත්වයට එකී ඉඩකඩ දී නැත

ෆැසිස්ට්වාදී ප්‍රතිපත්තිද සීමිත කලක් ක්‍රියාත්මක වී ඇත. එයද ධනවාදී ආකෘතියේ ඒකාධිකාරී හා ඒකාධිපති මාදිලියකි. සමාජවාදය නමින් කැගසා ජනතාව උසිගන්වා බලය ගත් හිට්ලර් හා මුසෝලනීගෙන් ක්‍රියාවන් තුළින් ඒබව තහවුරුවේ.

මාක්වාදීන්ගේ න්‍යාය වන්නේ අයිතිය පැහැරගත් එවුන්ගේ අයිතිය පැහැරගැනීමේ න්‍යාය තුළ දේශපාලන බලය ගෙන සමාජවාදී ජනසතු කරණය තුළින් කම්කරු පාලනය හෝ සේවක පාලනය හෝ කියා පාවහන් නිපදවීම් පමණක් නොව සියළුම වර්ගයේ නිපදවීම් කරන ධනවාදී හෝ සමුපකාර මාදිලීන් රජයට පවරා ගැනීමය. කම්කරුවා පාලකයා වී පාලකයා නිර්ධනයෙක් වනවාද? අපෝහක විද්‍යාවේ දර්ශනය තුල මේගැන ප්‍රශ්ණ කළයුතුව ඇත. එම සංවර්ධ ප්‍රවේශය පංති මුල්කරගත් එකකි. පවුල මුල්කරගත් එකක් නොවේ. සාමාජිකයා මුල්කරගත් එකක් නොවේ. සචේතනික මිනිසා වන රාගයෙන් විරාගයටත් ද්වේශයෙන් අද්වේශයටත්, මොහයෙන් අමොහයටත් පත්වන මිනිසා මුල්කරගෙන නොවේ. එවැන් මිනිසකු බිහිකරන්නේද නැත. ස්ටාලින්ලා ලෙනින්ගෙන් පසු බිහිවීමෙන් ඒ බව සනාතවේ. සචේතනික මිනිසා වැදගත් වන්නේ මෙම නිසාය.

එසේ නම් මෙකී ප්‍රතිපත්ති තුනෙන්ම කිසිම ප්‍රශ්ණයක් තිරසාරව විසදිය නොහැකිය. මාක්ස් කියන සියළුම පංති සටන් වලින් බිහිවූ නව සමාජය තුලත් දුප්පත් කම, සූරා කෑම, ලිංගික වෙළඳාම, දුරාචාරය, සොරකම, වංචාව, බොරුව අයන මේ සියල්ල පැවති බව පෙනේ. මිනිසාගේ ස්වභාවය එකකි. ස්වරූපය තවත් එකකි. සමාජයකද ස්වභාවය ඒකත්වයන් යුත්තය. ස්වරූපය විවිධත්වයෙන් යුත්තය. පංති සටන් තුලින් වෙනස් කර ඇත්තේ සමාජයේ ස්වරූපය පමණි. එහෙත් වෙනස් කල යුත්තේ ස්වභාවත් ස්වරූපයත් යන දෙකම එකටය. එය මාක්ස් වාදයට කල නොහැකිය. මාක්ස්වාදය අවශ්‍ය වන්නේ ශ්‍රමයේ අතිරික්ත වටිනාකම ගණනය කිරීමටය. එම වටිනාකම සහභාගීත්ව අනුව ප්‍රතිදාන බෙදීමේ ක්‍රමයට බෙදාහැරිය හැක්කේ සමුපකාර මාදිලිය තුළින් පමණි.

ක්‍රි. පූ. 28 දී අදින්නාදානා වේරමණී යන සිල්පදය ඊට පෙර සිට පැවතිමම අනුමත කිරීම තුලින් අනාවරණය කල සොරකම් සියල්ල අදත් එසේම ඇත. එහෙත් වැඩි වී ඇත්තේ සොරා ගන්නා භාණ්ඩ අතරට රථවාහන සොරකම් එක්ව තිබීමය. එය එක් වන්නේ රථ වහාහන නිපදවීම බෙදාහැරීම, හුවමාරුව හා පරිභෝනය යන ක්‍රියා කාරකම් සමුපකාර විද්‍යාවේ දර්ශනවාදය තුල නොකරන නිසාය. වත්මන් දවස දක්නට ඇති සියළුම සොරකම්, වංචාවන්, අල්ලස් ගැනීම්, මත්ද්‍රව්‍ය නිපදවීමේ සිට වෙළඳාම දක්වා සියල්ලද

සිදුවන්නේ අවංක පාලකයකු නැති නිසා කියන මතවාදය සමාජගත වී ඇත. එයින් කියන්නේ කුමක්ද? සැබෑ හේතුව යටකර දීමීමේ දේශපාලන පංති වුවමනාවකි. මේ සියල්ල නැති කල හැක්කේ ධනවාදී ප්‍රතිපත්තිය, මාක්ස්වාදී සමාජවාදී ප්‍රතිපත්තිය, ෆැසිස්ට්වාදී ප්‍රතිපත්තිය, භාවිතාවෙන් නොව සමුපකාර සමාජවාදී ප්‍රතිපත්ති භාවිතාවෙන්මය. මෙම ප්‍රතිපත්ති භාවිතාවට ධනවාදීන් මෙන්ම මාක්ස්වාදීන්ද ලෝකයේ මෙතෙක් ඉඩදී නැත.

දැන්වත් ඉඩදෙන්නේ නම් රාජ්‍ය ව්‍යාපාරය පෞද්ගලික කරණයෙන් බේරාගෙන සාංගමික ප්‍රජාතන්ත්‍රවාදය හා ගිවිසම්ගත ප්‍රජාතන්ත්‍රවාදය පනදනම් කරගෙන ත්‍රිමාන නිලධාරීවාදයෙන් තොර අනාගතය හිමි නිෂ්පාදන මාදිලිය මතු කරගත හැකිය. 101 වන සමුපකාර දින සමරන විට මේ සියල්ල සමුපකාරිකයන් තේරුම් ගන්නේ නම් සේවක පාලනය සමුපකාර වෙළඳාම බාර නොදී සාමාජික පාලනයට බාර දිහ හැකිය. කිසිම සමාජිකයෙකු සමාජිකයන් උසිගන්වා බලය ගෙන සමාජිකයා බලගන්වා සාංගමික හා ගිවිසුම්ගත ප්‍රජාතන්ත්‍රවාදය මත සමුපකාර පාලනය හා පරිපාලනය ගොඩනැගීමට ඉඩදී නැත. එසේත් නැතිනම් අප මේ කියන කරුන ගැන කිසිවකු තවමත් දන්නේ නැත. මෙම ලිපිය කිවීමෙන් පසුවත් අවබෝධ කරගන්නේ නම් සමුපකාරය නිවරදි කරගැනීම මග විවර වනු ඇත.

එසේ නම් අප උදාහරණයක් ලෙස ගත් පාහන් නිපදවීම ධනවාදී, මාක්ස්වාදී හා ෆැසිස්ට්වාදී ප්‍රතිපත්ති බැහැර කොට සමුපකාර සමාජවාදී ප්‍රතිපත්ති මත සිදුකරන්නේ කෙසේද? යන්න සොයා බලමු. පාහන් නිපදවන සමුපකාර සමායතනයේ අයිතිය, පාලනය, ප්‍රතිලාභ හා අවධානම එම සමායතනයේ පාහන් නිපදවන සියළුම ශ්‍රමිකයන්ද, එම සමායතනයේ පරිපාලන කටයුතු කරන සියළුම ශ්‍රමිකයන්ද, පාවහන් නිපදවීම් කළ පසු බෙදාහැරීමේදී, හුවමාරු කිරීමේදී, පරිභෝජනය කිරීමේදී ඊට එක්වන සියළු ශ්‍රමිකයන්ද, විවෘත හා ස්වේච්ඡා සමාජිකත්වය යටතේ ඒ ඒ වර්ගයන්ට අනුව සාමාජිකත්වය ඇතුලත් කර ගනී. සමුපකාර ව්‍යාපසායේ පාලනය ඍජු, වක්‍ර හෝ මධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදය සංගමික ප්‍රජාතන්ත්‍රවාදය හා ගිවිසුම්ගත ප්‍රජාතන්ත්‍රවාදය පදනම් කරගන ඒ ඒ සමාජිකයින්ගේ ඡන්ද හිමි නාමලේඛණ අනුව එකී අයිතිය මත පාලනය හා පරිපාලනයට ඇතුල්වේ. සමුපකාර ව්‍යවසායේ අයිතිය හා පාලනය එසේ වන විට ශ්‍රමයේ ඵලය වන මාක්ස්ගේ අතිරික්ත ශ්‍රම වටිනාකම නියමය අනුව ගණන් බලා සාංගමික ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වභාවය නොව ස්වරූපයන් පදනම් කරගෙන සහභාගීත්ව ප්‍රතිධාන මත ගෙවනු ලැබේ. මෙම සමුපකාර ව්‍යවසායක ක්‍රමය භාණ්ඩ නිපවීමට පමණක් නොව සේවා නිපදවීමේදී ද භාවිතා කරනු ලැබේ. මෙහි පදනම වන්නේ සමුපකාර දේපල ක්‍රමය හා සමුපකාර ශ්‍රම විභජනය හා සමුපකාර ශ්‍රම සහයෝගීතාවයවේ.

ඔබ පාවහන් නිපදවන ව්‍යවසායකුනම් එම ව්‍යවසායක ආයතතනයේ සොරකම් වංචා දූෂණ සිදුවන්නේම සමුපකාර විද්‍යාවේ මූලිකාංග මත එකී කාර්ය කරන්නේ නැති නිසාය. සමුපකාරයද පාවහන් නිපදවන්නේ ධනවාදී මුල ධර්ම මතමය. එය සමුපකාරය මාදිලියක් නොවේ. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඒ ඒ සමුපකාර සමායතන ගැන සොයාබලන විට ඇත්තේ සමුපකාර විද්‍යවේ මූලිකාංග මත ගෙන යන ව්‍යාපාර නොවේ. අපගේ සේවා කාලය තුළ සමුපකාර විද්‍යවේ මූලිකාංග මත ගෙන යන ව්‍යාපාර හමුවී නැත. එය බිහිකල හැකිය. බිහිකල යුතුය. මේ සඳහා අවශ්‍ය වන්නේ සමාගම් අධ්‍යක්ෂ ජනරාල් වරයා ළග නිදාගන්නා සමුපකාර අධ්‍යක්ෂ ජනරාල් වරයා ළග ගොරවන සමුපකාර සාමාජිකයින්, සේවයකින්, නායකයින්

හා නිලධරයන් නොවේ. සමුපකාර අධ්‍යක්ෂ ජනරල් වරයා ළඟ නිදාගනිමින් ගොරවමින් සමුපකාර ත්‍රීමාන අරගලයේ නිරත සමුපකාර සාමාජිකයින්, සේවයකින්, නායකයින් හා නිලධරයන්වේ. සාමාජිකයන් බඳවා ගැනීමේදී කර ඇති වරද දැන්වත් නතර කරමු.

එපමණක් නොවේ. සමුපකාර සාමාජිකයන්ද, සේවයකන්ද, නායකයන්ද, නිලධරයන්ද, සමුපකාර අධ්‍යාපනය, පුහුණුව හා තොරතුරු යන ප්‍රතිපත්තිය ඉහකී සමුපකාර සමාජීය විද්‍යාවන් පදනම් කරගන ඉගැන්වීම් කර නැත. පාවහන් නිපදවන වීමට පුහුණුව ලබා දුන් පසු ඊට සහතියක් දී පිටත් කර හැරීමෙන් ඔහු ව්‍යවසායකයකු වන්නේ නැත. පාවහන් නිපදවන ධන සංහත සමාගමක කුලී කරුවකු බවට පත්වේ. එය ඔහුට පමණක් ලොව අප බලයට ආවොත් සියළුම දෙනාට ව්‍යවසායක අධ්‍යාපනයක් දී විරැකියාව නැති කරන බව කියන්නේ කුමක්ද? ශිෂ්ටම්චේව් එකක්ද? එවැනි සමාජ ව්‍යවසායක ක්‍රියාවක් නම් ප්‍රාග්ධනයේ කුලී කරුවන් නොවී ප්‍රාග්ධනයේ අයිතිකරුවන් කරන ක්‍රියාවට සමුපකාර භාවිතාවන් පරිවර්ථනය කරගත යුතුව ඇත.

එම පරිවර්ථනය 102 වන සමුපකාර දින සැමරීමට පෙර කරනනේ නම් අතුරු ව්‍යවස්ථාවේ සැරසිල්ලක් වශයෙන් එල්ලා ඇති සමුපකාර ජන සමාජය බිහිකරන ප්‍රවේශය එංගලන්තයේ සමුපකාර පක්ෂයෙන් බිහිකර ගැනීමට ලංකාවේද එකී පක්ෂය ගුරු කුලයට ගෙන දේශපාලන කරණයට අසුවී ඇති සමුපකාරය ඉන් මුදවා ගැනීම එයින් ආරම්භ කර අප මෙතෙක් කියා ඇති දේ එකින් එක ආරම්භ කළහැකිය. එහිදී සමුපකාර අධ්‍යාපනය හා පුහුණුව ලබා දෙන ආයතනවලට පැවරෙන්නේ පැරණි යල්පැනගිය දේ නිෂේධ කරන නව දේ අතට ගැනීමය. එමගින් විකිණීමට හෝ බදු දීමට යන සමුපකාර ආයතන රැකගැනීමට හැකිවනු ඇත. විශ්‍රාම ගියත් එසේ විශ්‍රාම යන සියළුම දෙනා වැඩ කර වැඩ කරන මිනිසුන් බවට පත්කරන සැබෑ නිෂ්පාදන මාදිලියක් 21 වන සියසේ බිහිකරමු. එමගින් සමුපකාරය දේශපාලන කරණයෙන්ද? වාණිජ කරණයෙන්ද? ත්‍රීමාන නිලධාරී වාදයෙන්ද? ධන සංහත සමාගම් කරණයෙන්ද? බඩ ගෝස්තරකරණයෙන්ද? මුදවාගෙන ගෝලීයකරණයට එරෙහි ගෝලීයකරණ ක්‍රියාවක් වශයෙන් ගෝලීය දූගීකම, ගෝලීය සූරා කෑම, ආදීවශයෙන් අද දවසේ මුළු ලෝකයේම කතා කරන නොගැලපෙන ක්‍රියා නිෂේධ කර සමුපකාර ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජන රජයක් බිහි කරගත හැකිය. ඒ සඳහා උණ්ඩය මෙන්ම ඡන්දය ද භාවිතාකර කළ හැකි නිර්මාණයක් නොවේ. සිවිල් සමාජ පුරවැසියන් බලගන්වන ක්‍රියාවක් තුළින් සාමූහිකත්වය පදනම් කරගෙන දැන් සමුපකාර මාදිලිය ආරම්භ කරමු.

7

# Global Challenges in the Co-operative Movement: Overcoming Obstacles for a Sustainable Future

**Dinusha Dissanayake**

The Co-operative movement has a rich and diverse history that spans several centuries. In early Roots of 18th-19th century, the Co-operative movement traces its origins to the industrial revolution, a period of significant social and economic change in Europe. In response to harsh working conditions and exploitation, workers began organizing themselves into mutual aid societies and self-help groups. One of the earliest notable examples is the Rochdale society of equitable pioneers, founded in England in 1844, which established the Rochdale Principles that became fundamental to the Co-operative movement. Accordingly, the Co-operative movement gained momentum in the late 19th century Co-operative principles and values were codified. The principles emphasized democratic decision-making, equitable distribution of benefits, voluntary membership and education. Co-operative movements spread across Europe and North America, leading to the formation of various types of Co-operatives, such as agricultural cooperatives, consumer cooperatives, and credit unions.

Hence, in 1895, the International Cooperative Alliance (ICA) was established to promote the cooperative movement globally. The ICA developed Co-operative principles, organized international conferences, and facilitated collaboration and knowledge sharing among Co-operatives worldwide. It continues to be a key organization representing and supporting Co-operatives on a global scale. Moreover, Throughout the 20th century, the Co-operative movement continued to grow and diversify. Co-operatives expanded into sectors such as housing, healthcare, insurance, and worker-owned enterprises. Notable examples include the Mondragon Corporation in Spain, which grew into a large federation of worker Co-operatives, and the Co-operative movement in Kerala, India, known for its success in various sectors.

Further, the history of the Co-operative movement is extensive and complex, with numerous regional variations and contributions from different countries and cultures. It has played a significant role in empowering individuals, promoting economic democracy, and fostering community development. Today, Co-operatives continue to be a vital part of the global economy, with millions of members and a wide range of sectors they operate in.**The Co-operative Movement in Sri**

**Lanka: Empowering Communities for Progress**

The Co-operative Movement in Sri Lanka has a rich history that spans over a century. It has played a significant role in empowering communities, promoting economic development, and fostering social cohesion across the island nation. Co-operatives have emerged as vital institutions, fostering self-reliance, equity, and sustainable development. The origin of the Co-operative Movement in Sri Lanka can be traced back to the late 19th century during the British colonial era. The movement gained momentum with the formation of the first co-operative society in 1906, known as the "Sinhala Bauddha Sahayaka Sabha" in Colombo. The primary objective was to alleviate poverty and empower rural communities by encouraging collective action and pooling resources. Consequently, during the post-independence period, the government recognized the potential of Co-operatives as an effective tool for socio-economic development. It actively promoted the formation of Co-operative societies across various sectors, including agriculture, fisheries, housing, consumer goods, and credit unions. The Co-operative Department was established in 1948, played a crucial role in providing guidance, support, and regulatory oversight to co-operatives throughout the country.

At the heart of the Co-operative Movement in Sri Lanka are the internationally recognized Co-operative principles, which guide the functioning of Co-operative societies. These principles include voluntary and open membership, democratic control, equitable distribution of benefits, autonomy, education and training, and concern for the community. Thus, Co-operative societies operate on the principle of "one member, one vote," ensuring equal participation and decision-making power for all members. They prioritize the welfare and interests of their members, promoting inclusive development and social justice. Co-operatives also provide valuable training and educational programs to enhance members' skills, knowledge, and capacity for self-governance.

On the other hand, the Co-operative movement in Sri Lanka has made significant contributions to the socio-economic landscape of the country, particularly in rural areas including Agriculture and rural development, micro financing, retail business, housing and infrastructure, social welfare and empowerment. Agricultural co-operatives have played a crucial role in improving farming practices, enhancing productivity, and ensuring fair prices for farmers. They have facilitated access to credit, agricultural inputs, and modern technologies, empowering farmers and boosting rural livelihoods.

The Co-operative credit unions, commonly known as "Thrift and Credit Societies," have provided financial services to underserved communities, enabling access to affordable credit, savings facilities, and insurance. These

initiatives have helped reduce dependency on exploitative moneylenders and promote financial resilience among low-income individuals. Besides, Consumer co-operatives have focused on ensuring fair prices, quality products, and essential commodities for their members. By eliminating intermediaries, co-operatives have brought down costs and provided access to affordable goods, benefiting both urban and rural consumers. Also, housing co-operatives have facilitated affordable housing solutions for low-income families. These initiatives have provided secure housing options, improved living conditions, and promoted community development through collective efforts. In the meantime, Co-operatives have also contributed to social welfare programs, including healthcare, education, and women's empowerment. They have supported initiatives such as healthcare clinics, scholarships, vocational training centers, and women's co-operatives, creating avenues for economic independence and social mobility. While the Co-operative Movement in Sri Lanka has achieved commendable success, it continues to face challenges. Some of these include inadequate financial resources, limited access to markets, governance issues, and insufficient infrastructure.

**Global Challenges in the Co-operative Movement**

The Co-operative Movement, as a global phenomenon, has made significant contributions to economic, social, and environmental development. However, despite its accomplishments, co-operatives face various challenges that hinder their growth and potential impact. This article examines some of the key global challenges confronting the Co-operative Movement and explores strategies to overcome them, ensuring a sustainable future for co-operatives worldwide. Accordingly, the Co-operative movement faced various challenges over the years, including economic downturns, legal barriers, and ideological conflicts. However, Co-operatives demonstrated resilience and adaptability with many continuing to thrive and contribute to local economies and communities.

In recent decades, the Co-operative movement has adapted to a changing economic landscape. Co-operatives have embraced technology, digital platforms, and social media to enhance their operations, communication, and member engagement. They have also focused on sustainability, social impact, and innovation to remain relevant and address emerging challenges.

**Financial Sustainability**

One of the primary challenges faced by Co-operatives is ensuring financial sustainability. Limited access to capital, inadequate financial management and the need for constant reinvestment often pose significant obstacles. Co-operatives must focus on developing robust financial systems, exploring innovative financing mechanisms, and establishing partnerships with financial institutions to secure adequate funding for their operations

and growth.

**Market Access and Competitiveness**

Co-operatives often struggle to access markets and compete effectively with larger, conventional enterprises. Limited marketing expertise, inadequate infrastructure and difficulties in meeting quality and certification standards can hamper Co-operatives' ability to penetrate local and international markets. Strengthening market linkages, investing in market research, enhancing product quality and branding and promoting fair trade practices can help co-operatives overcome these challenges and become more competitive.

**Governance and Management**

Effective governance and management are crucial for the success and sustainability of Co-operatives. Issues such as lack of transparency, frauds, political influence, weak accountability mechanisms and insufficient leadership development can undermine the functioning of co-operatives. It is imperative to promote good governance practices, provide training and capacity-building opportunities for members and managers and establish clear structures for decision-making, ensuring accountability, and fostering responsible management.

**Technological Advancements**

In an era of rapid technological advancements, Co-operatives face the challenge of adapting to new technologies to remain relevant and efficient. Embracing digital tools, such as e-commerce platforms, data analytics, and supply chain management systems can help co-operatives streamline operations, enhance productivity, and reach a wider customer base. Governments, co-operative support organizations, and stakeholders must collaborate to provide technical assistance, infrastructure, and training to ensure co-operatives can harness the benefits of technology.

**Advocacy and Recognition**

Co-operatives often struggle with a lack of recognition and support from policymakers, leading to limited access to resources, legal protections, and favorable policies. Advocacy efforts should focus on raising awareness about the unique contribution of co-operatives to socio-economic development, influencing policy formulation, and ensuring a supportive legal and regulatory environment. Building alliances with like-minded organizations, engaging in dialogue with policymakers, and showcasing successful co-operative models can help gain recognition and support for co-operatives.

**Sustainability and Climate Change**

In the face of global challenges such as climate change and environmental degradation, co-operatives have a crucial role to play in promoting sustainable practices and fostering resilience. Co-operatives can encourage eco-friendly production methods, renewable energy initiatives, waste management systems, and sustainable agriculture practices. Collaboration with

environmental organizations, promoting green certification, and integrating sustainability into the core values and operations of co-operatives are essential steps towards addressing these challenges.

**Potential future trends that might shape the cooperative movement**

1. Technological Integration
   Co-operatives are likely to adopt and leverage emerging technologies to enhance their operations and reach. This could involve utilizing blockchain for transparent governance and supply chain management, employing artificial intelligence and automation to streamline processes or utilizing digital platforms for improved member engagement and participation.

2. Sustainability and Ethical Practices
   With the growing awareness about environmental and social issues, there is a rising demand for sustainable and ethical practices. Co-operatives are expected to prioritize sustainability initiatives such as renewable energy projects, fair trade partnerships, and eco-friendly production methods, aligning their values with those of environmentally conscious consumers.

3. Collaborative Networks
   Co-operatives might increasingly collaborate with each other to strengthen their collective impact. This could involve forming cooperative alliances or networks to share resources, knowledge, and best practices. Collaborative efforts can help co-operatives tackle common challenges, improve economies of scale, and enhance their overall influence.

4. Digital Platforms and Member Engagement
   The use of digital platforms and online tools can facilitate member engagement and participation. Co-operatives may establish interactive online platforms, enabling members to connect, vote, provide feedback, and access information easily. This can lead to increased transparency, inclusivity, and democratic decision-making within co-operatives.

5. Diverse Membership and Inclusion
   Co-operatives may actively focus on diversifying their membership base and promoting inclusion. Efforts may be made to engage younger generations, minorities, and marginalized communities to ensure a broader representation within co-operatives. Inclusivity initiatives can help co-operatives remain relevant, innovative, and reflective of societal diversity.

6. Impact Investing and Social Enterprise
   Co-operatives might explore impact investing and develop social enterprise models. By attracting investments from individuals and institutions interested in generating social and environmental impact alongside financial returns, co-operatives can expand their capacity to address pressing societal challenges while

remaining economically sustainable.

7. Advocacy and Policy Influence
   Co-operatives may seek to strengthen their advocacy efforts and influence policies that support their growth and development. By actively engaging with policymakers and participating in public debates, co-operatives can raise awareness about their contributions to the economy, employment and community development, leading to more supportive legislative frameworks.

These are potential trends that may shape the future of the Co-operative movement. However, it's important to note that the future is uncertain and actual developments may differ. To get the most up-to-date and accurate information recommend referring to recent research and industry publications further.

**Conclusion**

The Co-operative Movement is a global phenomenon which has demonstrated its potential for inclusive and sustainable development, global challenges persist. Financial sustainability, enhancing market access, strengthening governance and management, embracing technology, advocating for supportive policies and sustainability were the most dominant challenges faced by the Co-operative movement at present. Further, governments, international organizations, co-operative support networks, and stakeholders must collaborate to create an enabling environment for co-operatives, empowering them to thrive and contribute to a more equitable and sustainable world.

8

# ජාත්‍යන්තර සමුපකාර සංධානය සහ ජාත්‍යන්තර සමුපකාර දිනය (ICA & CoopsDay)

චරිත් අමරසේකර

**1. හැඳින්වීම**

ජාත්‍යන්තර සමුපකාර සංධානය වර්ෂ 1895 අගෝස්තු මස 18 වෙනි දින පිහිටවන ලදී. එහි පළමු සම්මේලනය එංගලන්තයේ ලන්ඩන් නගරය පවත්වන ලදී. එහි පළමු සභාපතිවරයා වූයේ ඇල්බර්ට් හෙන්රි ජෝර්ජ් (Albert Henry George) මහතාය. පළමු ලේකම්වරයා ලෙස ආචාර්ය හැන්ස් මුලර් (Dr. Hans Muller) මහතා කටයුතු කරන ලදී. එවකට මෙහි මුලස්ථානය ස්විස්ටර්න්තයේ ජිනිවා නුවර තෝරා ගන්නා ලදී. වර්ෂ 2013 දී බෙල්ජියමේ බ්‍රසල්ස් නුවර ජාත්‍යන්තර සමුපකාර සංධානයේ මූලස්ථානය බවට පත් කර ගන්නා ලදී. වර්ෂ 2022 වනවිට මෙහි සමාජික සංවිධාන 318 කි. වර්තමාන සභාපතිවරයා වන්නේ ආජන්ටිනාවේ Ariel Guarco මහතාය. පහතින් දැක්වෙන්නේ වර්ථමානයේදී ලෝකයේ විවිධ කලාපවල හා රටවල් වල සාමාජිකත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් රූප සටහනකි.


**2. සංවිධාන ව්‍යුහය**

ජාත්‍යන්තර සමුපකාර සංධානයේ ආයතනික ව්‍යුහය ප්‍රධාන කොටස් 5කින් සැදුම්ලත් වේ. එනම් මහා සම්මේලනය(General Assembly), අධ්‍යක්ෂක මණ්ඩලය (Board of Directors), කලාපීය සම්මේලනය (Regional Assembly), කලාපීය අධ්‍යක්ෂක මණ්ඩලය (Regional elected board of directors) ආංශික සංවිධාන (Sectoral Organizations) සහ තේමා කමිටු




මූලාශ්‍රය : ජාත්‍යන්තර සමුපකාර සංධානය

(Thematic Committees) යනුවෙනි. මහා සම්මේලනය(General Assembly) නැවතත් අංශ කිහිපයකට පහත ආකාරයෙන් බෙදී යයි.




මූලාශ්‍රය : ජාත්‍යන්තර සමුපකාර සංධානය

### 3. ජාත්‍යන්තර සමුපකාර සංධානය පිහිටුවීමේ අරමුණු

* ලොව සියලු සංවිධාන වල විශ්ව නියෝජිතයා ලෙස කටයුතු කිරීම.
* සමුපකාර ප්‍රතිපත්ති හා ආචාර ධර්ම ලොව පුරා ප්‍රචලිත කිරීම.
* සමුපකාර සංකල්පය ලොව සෑම රටකටම ව්‍යාප්ත කරවීමට පියවර ගැනීම.
* විවිධ සමුපකාර සංවිධානවල අයිතීන් සුරැකීම.
* ජාත්‍යන්තරව පවතින සංවිධාන අතර සුහද සම්බන්ධතා හා සහයෝගීතාවය ගොඩනැගීම.
* ජාත්‍යන්තර වශයෙන් සමුපකාර සංවිධාන අතර මිත්‍රත්වය හා ආර්ථික සම්බන්ධතා වර්ධනය කිරීම.
* ලොව සාමය හා ආරක්ෂාව උදෙසා කැපවීම.
* ලොව සමුපකාර ආයතනවල සේවය කරන සමුපකාර සේවකයින්ගේ ආර්ථික, සමාජ, සංස්කෘතික අභිවෘද්ධිය තහවුරු කිරීමට පියවර ගැනීම.

### 4. සමුපකාර සංධානයේ කලාපීය කාර්යාල

මෙම සංධානයේ කලාපීය කාර්යාල, කලාප 4ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම් අප්‍රිකානු කලාපය, ඇමෙරිකානු කලාපය, ආසියා - පැසිෆික් කලාපය හා යුරෝපා කලාපය ලෙසයි.




මූලාශ්‍රය : ජාත්‍යන්තර සමුපකාර සංධානය

ඊට අමතරව මෙම සංධානය ආංශික සංවිධාන (Sectoral Organizations) 8කින් යුක්ත වේ. එනම් ජාත්‍යන්තර සමුපකාර කෘෂිකර්ම සංවිධානය, ජාත්‍යන්තර සමුපකාර බැංකු ආයතනය, ලෝක ව්‍යාප්ත පාරිභෝගික සමුපකාරය, ජාත්‍යන්තර සමුපකාර ධීවර සංවිධානය, ජාත්‍යන්තර සමුපකාර සෞඛ්‍ය සංවිධානය, ජාත්‍යන්තර සමුපකාර නිවාස සංවිධානය, ජාත්‍යන්තර සමුපකාර අන්‍යෝන්‍ය රක්ෂණ සම්මේලනය සහජාත්‍යන්තර සමුපකාර කර්මාන්ත, කලාත්මක හා සේවා නිෂ්පාදන සංවිධානය ලෙසයි.

### 5. ජාත්‍යන්තර සමුපකාර දිනයේ සැමරුම


වර්ෂ 1923 සමුපකාරිකයින් සඳහා විශේෂ හා වැදගත් වර්ෂයක් ලෙස සැලකීම් යුක්ති සහගතය. ඒ සඳහා හේතුවන කරුණු කිහිපයකි. එනම්,

- සමුපකාර දිනය ප්‍රකාශයට පත් කිරීම.
- ජුලි මස පළමු සෙනසුරාදා

- දේදුණු වර්ණ සමුපකාර කොඩිය හඳුන්වා දීම
- සමුපකාර දිනය සඳහා තේමා පාඨයක් හඳුන්වා දීම.

1923 හඳුන්වා දුන් සමුපකාර දිනය 1995දී ෂෂ්ඨි ශත සංවත්සරයේදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. ජාත්‍යන්තර සමුපකාර දිනය (CoopsDay) වාර්ෂිකව ජූලි පළමු සෙනසුරාදා සමරනු ලැබේ. 2022 සැමරුම 100 වැනි ජාත්‍යන්තර සමුපකාර දිනය වේ. ජාත්‍යන්තර සමුපකාර දිනයේ පළමු සැමරුම වර්ෂ 1923 ජූලි 7 වෙනිදාට යෙදී තිබුණු අතර මෙය සමුපකාර ව්‍යාපාරයේ වාර්ෂික සැමරුමක් බවට පත්වීමට මාවත විවෘත කළ අතර එය සෑම වසරකම ජූලි මාසයේ පළමු සෙනසුරාදා දින සමරනු ලැබේ.

**සමුපකාර දිනය සැමරුම**



Manchester, Saturday, July 7, 1923.

OUR FIRST

"CO-OPERATORS' DAY."

SIGNIFICANCE OF A NEW FESTIVAL: FAITH THAT MOVES MOUNTAINS.

Co-operation has added one more to the innovations it has brought into the lives of the massed millions of the world's workers.

It has created a new festival and added a new joy to life.

To-day, throughout the world, the first Co-operators' Day is being celebrated. There is scarcely a national flag which does not fly over territory upon which stand native co-operative establishments owned by those who are linked by bonds of fraternity with the working men and women of these islands in the International Co-operative Alliance, which rallies to the cause of humanity forty million members of co-operative societies.

To more than forty millions this new festival is a Joy Day. Our own four-and-a-half million members in Great Britain and Ireland do not exhaust the numbers who regard the co-operative movement as a factor which influences their lives and homes and prospects. The members have wives or husbands; they have

SATURDAY, JULY 7th, 1923.

From the Co-operators of Great Britain and Ireland to Co-operators throughout the world. Greetings of Love and Joy on this First Co-operators' Day!

which the workers of the world unite to demonstrate the solidarity of the workers as a class, to talk of their common sufferings and their

trol by the people themselves of the necessaries of life and the industries by which these are obtained. Already, through co-operation, working people of the British Isles own £118,000,000, hold to their credit in the co-operative stores. Offices, factories, mills, wharves, creameries, coal mines, ships, shops, farms, cinema theatres, tea and cocoa estates, with their necessary equipment, to the value, at a moderate estimate, of £86,000,000, and employing 290,000 persons, are the property of working people, some of them the poorest in the land. Co-operative libraries, reading-rooms, class-rooms and a college, concert halls, dancing halls, recreation grounds—including bowling greens and tennis courts—choirs, guilds, newspapers, and magazines all provided through the co-operative movement, and maintained by co-operators, exist for the education and amusement of the common people. The trade turnover of British societies alone amounts to £334,383,138, which yields dividend and interest amounting to £22,000,000

මූලාශ්‍රය : ජාත්‍යන්තර සමුපකාර සංධානය

**6. ජාත්‍යන්තර සමුපකාර සංධානයේ තේමාවන්**

වර්ෂ 1995 සිට, ICA සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සමුපකාර ප්‍රවර්ධනය සහ දියුණුව සඳහා වූ කමිටුව (COPAC) හරහා සමුපකාර දිනය (CoopsDay) සැමරීම සඳහා ඒකාබද්ධව තේමාව සකසා ඇත. පහතින් දැක්වෙන්නේ වර්ෂ කිහිපයකදී සමුපකාර දිනය වෙනුවෙන් භාවිතා කළ තේමාවන් කිහිපයකි.

2022: Cooperatives Build a Better World

2021: Rebuild better together

2020: Cooperatives for Climate Action

2019: COOPS 4 DECENT WORK

2018: Sustainable consumption and production

2017: Cooperatives ensure no one is left behind

2016: Cooperatives: The power to act for a sustainable future.

2015: Choose cooperatives, choose equality

2014: Cooperative enterprises achieve sustainable development for all.

2013: Cooperative enterprise remains strong in time of crisis.

2012: Cooperative enterprises build a better world.

2011: Youth, the future of co-operative enterprise

2010: Cooperative Enterprise Empowers Women

2009: Driving Recovery through Cooperative Enterprise

2008: Confronting Climate Change through Cooperative Enterprise

2007 Cooperative Values and Principles for Corporate Social responsibility

2006 Peace-building through Cooperatives

2005: Microfinance is OUR business! Cooperating out of poverty

2004: Cooperatives for Fair Globalization: Creating Opportunities for All

2003: Cooperatives Make Development Happen: The contribution of co-operatives to the United Nations Millennium Development Goals

2002: Society and Cooperatives: Concern for Community

2001: The Cooperative Advantage in the Third Millennium

2000: Cooperatives and Employment Promotion

1999: Public Policy and Cooperative Legislation

1998: Cooperatives and the Globalization of the Economy

1997: The Cooperative Contribution to World Food Security

1996: Cooperative Enterprise: Empowerment for People-centred Sustainable Development

1995: The ICA Centennial and the Next 100 Years of International Cooperation

මූලාශ්‍රය: International Co-operative Day,wikipedia.org/wiki/International_Co-operative_Day

## 6.1 වර්ෂ 2023 ජාත්‍යන්තර සමුපකාර දින තේමාව

මෙවර ජාත්‍යන්තර සමුපකාර දිනය 2023 ජූනි 01 වෙනිදා පැවැත්වේ. එහි තේමාව වන්නේ "සමුපකාර : කඩිනම් තිරසාර සංවර්ධනය සඳහා හවුල්කරුවන්" (Co-operatives : partners for accelerated sustainable development) යන්නය.







මෙහිදී සමුපකාර ආචාර ධර්ම, සාරධර්ම හා ප්‍රතිපත්ති පදනම් කරගනිමින් තිරසාර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals) සාක්ෂාත් කර ගැනීම අරමුණු කර ගෙන ඇත. ලොව විශාලතම ව්‍යාපාරික ජාලයන්ගෙන් එකක් වන සමුපකාර ව්‍යාපාරය, තිරසාර සංවර්ධන ඉලක්ක පිළිගෙන එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හවුල්කරුවෙකු ලෙස කටයුතු කිරීමට උනන්දුවෙන් පසු වේ.

9

# සමුපකාර ග්‍රාමීය බැංකු සඳහා මහජන සම්බන්ධතා වැදගත් වන්නේ කෙසේද?

එම්. උදිත නිලංග ගමගේ


මහජන සම්බන්ධතා යනු විෂයක් ලෙස මෙන්ම වෘත්තියක් ලෙස ද මෑත කාලීනව සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල භාවිතා වන ක්ෂේත්‍රයකි. මෙයින් ඕනෑම ක්ෂේත්‍රයක පුළුල් මහජන සම්බන්ධතාවක් ගොඩනැගීම සඳහා දායකත්වයක් සපයයි.එය එක් ක්ෂේත්‍රයක පමණක් සීමා නොවූ පුළුලුල්ව ව්‍යාප්තව පවතින්නකි.

ඇමරිකා එක්සත් ජනපදය තුළ 1920 වන විට ඇන්ඩෘ ජැක්සන් ජනාධිපති වරයාගේ ජනාධිපති වරණයේදී ප්‍රථමවරට දේශපාලනයේ දී මහජන සම්බන්ධතාවයේ ඇති වැදගත්කම පෙන්වාදී ඇති අතර 20 වන සියවසයේ දී එඩ්වඩ් එල් බර්න්ස් විසින් " Public Relationship නම් කෘතිය රචනා කිරීමත් සමග මහජන සම්බන්ධතා පිළිබඳ වැඩි වශයෙන් සාකච්ඡාවට භාජනය වී තිබේ.

1930 දී මානුෂීයව සේවකයන් දෙස බැලීමෙන් ගොඩනගා ගන්නා සම්බන්ධතා තුළින් නිෂ්පාදනය ඉහළ නංවාගත හැකි බව මාරි ෆොලට් විසින් මතයක් ඉදිරිපත්කරන ලදී.

සරළව හැඳින්වීමේ දී මහජන සම්බන්ධතාවය යනු හොඳ හිත වර්ධනය කිරීමයි. එනම් පුද්ගලයෙක් ආයතනයක් හෝ කිසියම් භාණ්ඩයක් පිළිබඳ යහපත් ආකල්පයක් ඇති කිරීමයි. කිසියම් ආයතනයක් භාණ්ඩයක් හෝ සේවාවක් හා බැඳී සිටින මහජන කොට්ඨාශයක් සමග නිරන්තර සම්බන්ධතා පවත්වාගෙන යාම එහි පැවැත්ම කෙරෙහි අත්‍යවශ්‍ය සාධකයක් වේ. මේ හේතුවෙන් ආයතනය කෙරෙහි හොද හිත,මහජන ප්‍රතිරූපය නිර්මාණය කිරීම ,සන්නිවේදන කළමනාකරණ ක්‍රමෝපායන් සහ වැඩසටහන් පවත්වාගෙන යාම මහජන සම්බන්ධතා නමින් හැඳින්වේ.

මහජන සම්බන්ධතාව සිදුවන ආකාරය පහත පරිදි දැක්විය හැක.




මහජන සම්බන්ධතාව පිළිබඳ නිර්වචන ඉදිරිපත්කළ පිරිස අතර පුද්ගලයින් මෙන්ම ආයතන ද පවතී.

- එඩ්වඩ් එල් බර්න්ස්

  මොහු විසින් මහජන සම්බන්ධතා පිළිබඳව පහත නිර්වචනය ඉදිරිපත්කර ඇත.

  1. මහජනයා වෙත කරනු ලබන තොරතුරු සම්පාදනය.
  2. මහජනයාගේ ආකල්ප සහ ක්‍රියාකාරකම් නවීකරණය කිරීම සඳහා ඍජුවම ඔවුන් කෙරෙහි කෙරෙන පෙළඹවීම.
  3. ආයතනික ආකල්ප සහ ක්‍රියාවන් එහි මහජනතාව සමග එක්කිරීමත් ජනතාවගේ ආකල්ප සහ ක්‍රියාවන් එම ආයතන සමග

එක් කිරීමටත් දරනු ලබන උත්සාහයයි.

- සෑම් බ්ලැක්
  ප්‍රායෝගික මහජන සම්බන්ධතාව වනාහී මහජන සම්බන්ධතාව සඳහා උත්සාහ කරනු ලබන කිසියම් සමාගමක, සංවිධානයක පුද්ගලයකුගේ සාර්ථකත්වය සහ සුබසාධනය දියුණු කරලීමයි.

- චාර්ල්ස් ප්ලැකාඩ්
  මහජන සම්බන්ධතාවය යනු හොඳ හිතකින් ගලා එන පැහැදිලි අදහස් සමූහයකි.

- ලන්ඩනයේ මහජන සම්බන්ධතා පිළිබඳ ආයතනය.
  යම්කිසි සංවිධානයක් සහ එහි ජනතාව අතර අන්‍යෝන්‍ය අවබෝධය ගොඩනගනු පිණිසත් එය පවත්වාගෙන යාම සඳහාත්, සියුම් ලෙස සැලසුම් කළ අඛණ්ඩ උත්සාහය මහජන සම්බන්ධතාව නම් වේ.

- ෆ්‍රැන්ක් ජෙෆ්කින්
  අන්‍යෝන්‍යයන් තේරුම් ගැනීම හා සම්බන්ධ විශේෂ අරමුණු කරා ළඟාවීම සඳහා ආයතනයක් එහි ජනතාවත් අතර සිදුවන සියලුම සැලසුම් සහගත සන්නිවේදන මාර්ග මහජන සම්බන්ධතා වෙයි.

මහජන සම්බන්ධතාව යන්න බටහිර පහළවූ මෑත කාලීන නව විෂය ක්ෂේත්‍රයක් වුවද එහි භාවිතයන් හා කාර්යන් සාම්ප්‍රදායික සමාජය තුළ තිබූ බව පැහැදිලිය.

මෙරට අතීත රාජාවලිය විමසීමේ දී අතීත රජවරු සිය රාජ්‍ය කාලය තුළ රටේ ජනතාව සතුටින් කාලය ගතකරයි ද යන්න නිශ්චිතවම දැනගැනීම සඳහා රාත්‍රී කාලයේ දී වෙස් වලාගෙන ජනතාව අතරට ගිය වග ප්‍රවාදවල සඳහන් වෙයි. පසු කාලීනව විදෙස් පාලකයින්ද සිය පාලනය පිළිබඳ ජනතාවගේ මතය දැනගැනීමටත්, සිය මතය ජනතාව වෙත රැගෙන යාමටත් විවිධ රාජ්‍ය නිලධාරීන් පත්කරන ලදී. 1948 සෝල්බරි කොමිෂන් නිර්දේශ මත රාජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පිහිටුවීම සිදු වන ලදී.

සම්ප්‍රදායික සමාජ තුළ සිදුකෙරුණු විවිධ කාර්යන් වෙනුවෙන් ද මහජන සම්බන්ධතා ක්‍රමවල අවශ්‍යතා පැවති බව දක්නට ලැබුණි. මේ අනුව ඔවුන් විවිධ මහජන සම්බන්ධතා ක්‍රම විධි යොදාගෙන තිබුණ. විවාහ මංගල්‍ය, අවමංගල්‍ය, ගෙට ගෙවදීම්, මල්වර උත්සව, අළුත් අස්වැන්න නෙළීම සහ විවිධ ආගමික උත්සවවල දී මේ ආකාරයේ පිළිගත් මහජන සම්බන්ධතා විධික්‍රම යොදාගෙන ඇත. මෙම ක්‍රම ජාති,ආගම් සහ ප්‍රදේශ අනුව වෙනස්වන බව පැවසිය හැක.

නවීන සංවිධාන තුළ ද මහජන සම්බන්ධතාවයේ අවශ්‍යතාවය එක ලෙස පවතී. නමුත් ඒ සඳහා යොදාගනු ලබන විධි ක්‍රම සහ උපායමාර්ගවල වෙනස්කම් පවතී. යම් ආයතනයක් සිය භාණ්ඩ හෝ සේවා අළෙවිකරණයේ දී ඉහළ පාරිභෝගික සම්බන්ධතාවයක් පවත්වාගත යුතුය. ආයතනයක් සිය ප්‍රවර්ධන කටයුත්තක් ලෙස ද මහජන සම්බන්ධතා යොදාගනී. මහජනයා කිසියම් ව්‍යාපාරයක් කෙරෙහි ප්‍රසන්න හැඟීමෙන් යුක්ත නම්, එය ව්‍යාපාරයේ දියුණුවට හේතු වෙයි. මේ නිසා මහජන සම්බන්ධතා තුළ එවැනි ප්‍රසන්න හැඟීම් පවත්වාගෙන යාමට විවිධ මහජන සම්බන්ධතා උපක්‍රම භාවාතා කරයි.

බර්ට්‍රන්ඩ් රසල් විසින් රචිත Wisdom of the west කෘතියට අනුව මහජන සම්බන්ධතා ඉතිහාසය ගෝත්‍රික යුග දක්වා ඈතට දිව යයි.

මෙම යුග තුළ ඒක පාර්ශවීය සන්නිවේදන ක්‍රමයක් ක්‍රියාත්මක වූ බැවින් ඒ තුළ සියසට සියයක මහජන සම්බන්ධතාවක් ක්‍රියාත්මක වූ බව පැවසිය නොහැක. එසේ සිදුවීම කෙරෙහි නායකයන් තුළ පැවති අත්තනෝමතික අදහස් සහ පාලන ක්‍රම බලපා ඇත.

කාර්මීකරණය සමග කර්මාන්තශාලා හිමිකරුවන් සහ පාලක පක්ෂය සමග උැතිවූ අරගලය සමථයකට පත්කිරීමට පුද්ගල කණ්ඩායම් පත්කරන ලදී. මෙය මහජන සම්බන්ධතාවල මූලික අවස්ථාව ලෙස පිළිගැනේ. මේ සඳහා පුරෝගාමී පුද්ගලයා වූයේ අයිවි ලී නම් තැනැත්තා වූ අතර ඔහු මහජන සම්බන්ධතා පිළිබඳව පියා ලෙසින් ද හඳුන්වනු ලබයි. කෙසේ වුවත් 1923 දී එඩ්වඩ් එල් බර්න්ස් විසින් රචනා කළ Crystalizing Public Opinion කෘතිය සහ Public Relation නම් කෘතිය හේතුවෙන් මහජන සම්බන්ධතාව පිළිබඳ වැඩිවශයෙන් සාකච්ඡා කර ඇත.

මහජන සම්බන්ධතාව සන්නිවේදන ක්ෂේත්‍රය තුළ ප්‍රභලත්වයක් ආරෝපණය කරගෙන ඇත. මහජනයා යන යෙදුමෙන් අර්ථ ගැන්වෙන්නේ පුළුල් වූත් විවිධාකාර වූත්, නිර්නාමික වූත්, විවිධ අපේක්ෂා ඇති පිරිසක් වන නිසා ඔවුන් සමග සම්බන්ධතා පැවැත්වීමට සන්නිවේදනය අවශ්‍ය වන නිසාය. කෙසේ වුවත් මහජන සම්බන්ධතාවයේ දී අර්ථ ගන්වන මහජනයා Public යනු පොදු මහජනයා නොවේ. ඔවුන් පොදු මහජනයා අතරින් තෝරාගත් පිරිසකි. එනම් කිසියම් ආයතනයකට හෝ සංවිධානයකට අයත් පිරිසකි. එම පිරිස ප්‍රධාන කොටස් දෙකකි එනම්

- ❖ අභ්‍යන්තර මහජනයා
- ❖ බාහිර මහජනයා

සෑම සංවිධානයකටම තෝරාගත් මහජන පිරිසක් සිටී. අභ්‍යන්තර මහජනයා යනු එම ආයතනයේ ඇතුළත සිටින පිරිසයි. බාහිර මහජනයා යනු ආයතනයේ භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ අදහසින් ආයතනය සමග පිටත සිට සම්බන්ධ වන පිරිසයි. එක් සංවිධානයකට අයත් මහජන පිරිස තවත් සංවිධානයකට අයත් මහජන පිරිසෙන් වෙනස් වේ.

මේ අනුව අප සමුපකාර ව්‍යාපාරයකට අයත් සංවිධානයක මහජනතාව යනු කවුරුන්දැයි හඳුනාගනිමු.

1. සිය සමිති බල ප්‍රදේශයේ සාමාජිකයින්.
2. මහසභා නියෝජිතයින්.
3. අධ්‍යක්ෂ මණ්ඩලය.
4. ආයතනයේ සේවකයින්.
5. තැන්පත්කරුවන්.
6. ගනුදෙනුකරුවන්.
7. සැපයුම්කරුවන්.
8. ගැණුම්කරුවන්.
9. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.

**අභ්‍යන්තර මහජන සම්බන්ධතාව.**

යම් ආයතනයක් අභ්‍යන්තර සේවකයන් සමග ඇතිකරගනු ලබන සම්බන්ධතාව මෙහි දී ක්‍රියාත්මක වේ. ආයතනයක අභිවෘද්ධිය අරමුණු කරා ගමන් කිරීම සහ ඒවා ජය ගැනීම සඳහා සේවකයින්ගේ මනා කැපවීම අත්‍යවශ්‍ය සාධකයකි. මනා සේවක සම්බන්ධතාව තුළින් සේවක උනන්දුව සහ කැපවීම අපේක්ෂා කළ හැක. ඒ සඳහා සේවක අභිප්‍රේරණය ආයතනය තුළ සිදුකරමින් ඔවුන් සමග වෙන්ම ඔවුන්ගේ පවුලේ ඥාතින් සමග ද සම්බන්ධතා ගොඩනගා ගනිමින් ද, සේවකයින්ගේ දක්ෂතා සහ කුසලතා ඔප්නැංවීමට අවස්ථා සැලසීම තුළින් යහපත් අභ්‍යන්තර මහජන සම්බන්ධතාවක් පවත්වාගත

හැකි වේ.

**සංස්ථාපිත මහජන සම්බන්ධතා**

සෑම ආයතනයකටම සංවිධානයකටම දැක්මක් (Vision) සහ මෙහෙවරක් (Mission) පැවතීම එහි අභිවෘද්ධියට පිටුවහලක් වන්නේය. ආයතනය පොදු සමාජය තුළ සන්නාමයක්, ලාංඡනයක්, ප්‍රතිපත්ති, නීති සහ රෙගුලාසි සහිතව පෙනී සිටීම එහි සංවිධානානාත්මක බව සහ මනා කළමනාකාරිත්වය පිළිබඳ සුබවාදී හැඟීම් ඇති කරයි.

උදාහරණ -

- ග්‍රාමීය බැංකුවේ තේමාව "ජනතාවට වඩාත්ම සමීපතම බැංකුව"
- ආයතනික ධූරාවලිය.
- වාර්ෂික විගණන වාර්තා.
- ප්‍රකාශිත ගිණුම් වාර්තා.

**පොදු මහජන සම්බන්ධතා.**

නිෂ්පාදන හෝ සේවා සපයන ඕනෑම ආයතනයකට සිය පාරිභෝගිකයා හෝ සේවා දායකයා සමග ඇතිකරගනු ලබන සම්බන්ධතාවය ඉතා වැදගත්ය. නිදසුන් ලෙස ගත්විට සමුපකාර ආයතනයක් සිය බල ප්‍රදේශය තුළ විසිරී සිටින මහජනතාව සමග සම්බන්ධතා ගොඩනගා ගැනීම ඉතා වැදගත් වේ. එහි දී තම නව සේවා පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට මාධ්‍ය සම්බන්ධතා භාවිතා කළ හැකිය. විශේෂයෙන් නව අවුරුදු සමය තුළ සිය තැන්පතු රැස්කිරීම සඳහා ග්‍රාමීය බැංකුව විවිධ මාධ්‍ය භාවිතා කරන අතර පාරිභෝගික භාණ්ඩ අළෙවිසැල් පාරිභොගික වට්ටම් සාමාජික ගනුදෙනු කරුවන්ට ලබාදෙන විශේෂ සේවා පිළිබඳ ප්‍රචාරය කරනු ලබයි.

උදාහරණ ලෙස රූපවාහිනී දැන්වීම්, ගුවන්විදුලි දැන්වීම්, පුවත්පත් දැන්වීම්, අත්පත්‍රිකා, අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ආදිය දැක්විය හැක.

**ප්‍රජා සම්බන්ධතා**

තම පාරිභෝගික සමාජයෙන් තෝරාගත් කණ්ඩායමක් උදෙසා ඔවුන්ගේ ප්‍රධාන අවශ්‍යතා හඳුනාගෙන, විවිධ පහසුකම් සැලසීම තුළින් ගොඩනගාගනු ලබන මහජන සම්බන්ධතා මේ නමින් හැඳින්වේ. නිදසුන් ලෙස තම සමිති බලප්‍රදේශයේ පාසලක පුස්තකාලයකට පොත් පරිත්‍යාගයක් කිරීම, තම ආයතනයේ නම්, දැන්වීම් සඳහන් බස් නැවතුමක් ඉදිකිරිම, පොදු ස්ථානවල බීමට ජලය ලබාගන්නා ජල පෙරණ සවිකිරීම ආදිය දැක්විය හැක.

**ආයෝජක සම්බන්ධතා**

තම ආයතනය වෙනුවෙන් මුදල් යොදවා ඇති පුද්ගලයින් හෝ සංවිධාන සමග හොඳ සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම ආයතනයකට ඉතා වැදගත් වේ. මෙහිදී සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයක් උදාහරණ ලෙස ගත්විට ඔවුන් විසින් සිය ආයෝජනයන් කළ සාමාජික සමිති දිරිගැන්වීමට විවිධ ක්‍රියාකාරකම් සිදුකරයි. මේ අනුව වාර්ෂික ලාභාංශ ප්‍රතිදානය කිරීම, සාමාජික සමිති නියෝජිතයින් නිළධාරීන් සඳහා විවිධ දේශීය විදේශීය චාරිකා සංවිධානය කිරීම, වාර්ෂික නව අවුරුදු ත්‍යාග ලබාදීම, සුබපැතුම් පත්, දින දර්ශන සහ දින පොත් ලබාදීම ආදිය දැක්විය හැක.

**සමුපකාර ආයතනයකට මහජන සම්බන්ධතා පැවැත්විය හැකි ක්‍රම.**

වර්තමානයේ මහජන සම්බන්ධතා විවිධ ක්‍රම මගින් ක්‍රියාත්මක් කරනු ලබයි. ඒ අනුව සමුපකාර ග්‍රාමීය බැංකුවකට සිය මහජන සම්බන්ධතා පහත පරිදි පවත්වාගෙන යා හැකිය.

- ප්‍රදර්ශන.

  සමුපකාර ආයතනයකට සිය සේවා පිළිබද දැනුවත් කිරීමට ප්‍රදර්ශන පුවරු සවිකළ හැකිය. මෙම පුවරු මුද්‍රිත හෝ ඩිජිටල් විය හැකිය.

- අනුග්‍රාහකත්වය.

  තම සේවා පුළුල් කිරීම වෙනුවෙන් විවිධ අවස්ථා හෝ ආයතනයන් වෙත අනුග්‍රාහකත්වයන් දැක්විය හැකිය. විශේෂයෙන් තම බල ප්‍රදේශයේ පාසලක වානිජ දිනයකට අනුග්‍රහය දැක්වීම.

- දායකත්වය.

  ප්‍රදේශයේ පුණ්‍ය ආයතනයක ඉදිකිරිමකට හෝ පූණ්‍ය කටයුත්තකට දායකත්ව දැක්වීම.

- සම්මන්ත්‍රණ.

  ද්විතීක මට්ටමේ සමුපකාර සංවිධානයක් සිය සාමාජික සමිති කාර්ය මණ්ඩල සංවර්ධනය වෙනුවෙන් විවිධ පුහුණු වැඩසටහන් සම්න්ත්‍රණ සංවිධානය කිරිම. උදාහරණ ලෙස උකස් පුහුණු වැඩසටහන්, ණය පුහුණු වැඩසටහන්, පාරිභෝගික සත්කාර වැඩසටහන් දැක්විය හැක.

- වෙළඳ කුටි.

  සිය ප්‍රදේශයේ වානිජ ප්‍රදර්ශනයක තම ආයතනය වෙනුවෙන් වෙළඳ කුටියක් පවත්වාගෙන යාම.

- සුබ පැතුම් පත්.

  නව වර්ෂය ආරම්භවීමේ දී, සිංහල හින්දු අලුත් අවුරුදු සමයේදී, සිය ගනුදෙනු කරුවන් ඇතුළු සියලු පාර්ශව වෙත සුබපැතුම්පත් යැවීම.

- නිවේදන.

  මහජනයා හා පොදු සමාජය වෙත වැදගත් වන කරුනු සහිතව නිකුත් කරණු ලබන දැන්වීම්. උදාහරණ ලෙස ඩෙංගු රෝගය, කොවිඩ් රෝගය වැනි තත්වයන් පාලනය කරගැනීමට මහජනයා වෙත කරනු ලබන උපදේශාත්මක නිවේදන.

- පොත් පිංච

  සිය ආයතනයේ පවතින විවිධ මූල්‍ය සේවා පිළිබද තොරතුරු ඇතුළත් කුඩා පොත් පිංචක් සකස් කර ගනුදෙනුවන් කරුවන් හරහා බෙදා හැරීමට සැලැස්වීම.

- වාර්ෂික චාරිකා.

  සිය ආයෝජකයින්, සේවකයින් වෙනුවෙන් සංවිධානය කරනු ලබන වාර්ෂික විනෝද චාරිකා.

- සමරු කලාප.

  බාහිර ආයතන වලින් මෙන්ම විවිධ අවස්ථා සඳහා නිර්මාණය වන සමරු කලාප වෙත සිය ආයතනයේ සේවා ඇතුළත් සුබ පැතුම් දැන්වීම් සැපයිම.

- වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය ජාල භාවිතය.

  වර්තමානයේ බොහෝ සමුපකාර සංවිධාන වෙබ් අඩවි, සමාජ මාධ්‍ය ජාල භාවිතා කරයි. එමගින් සිය පාරිභෝගික සේවා වඩාත් පුළුල් ලෙස ප්‍රචාරය කරනු ලබන අතර ඕනෑම පුද්ගලයකුට ඒ සඳහා ප්‍රවේශ වීමට අවස්ථා සැලසිම.

වෙළඳ ක්‍රමෝපායන් සැලසුම් හා සන්නිවේදන විද්වතෙකු වන පිලිප් ජේ කිවන් විසින් රචිත “Public relationship and Practices” කෘතියේ මහජන සම්බන්ධතාවන් හි වැදගත්කම පිළිබඳ පහත කරුණු දක්වා ඇත.

1. මහජන සම්බන්ධතා මගින් කිසියම් කළමනාකරණ කාර්යයක් ඉටු කරයි.

2. මෙමගින් ක්‍රියාකාරකම් සහ අරමුණු රැසක් ප්‍රායෝගිකව පුළුල් ලෙස ක්‍රියාවට නංවයි.

3. මහජන සම්බන්ධතා ද්වීපාර්ශවික හෝ අන්‍යෝන්‍ය වශයෙන් ක්‍රියාත්මක වේ.

4. ආයතනයක් මහජන සම්බන්ධතා පවත්වන්නේ තනි පුද්ගලයකු සමග නොව පුද්ගල සමූහයක් සමගයි.

5. මෙමගින් ඇතිකරගනු ලබන සම්බන්ධතා දීර්ඝ කාලින වූවකි.

මීට අමතරව මහජන සම්බන්ධතාව පිළිබඳ පහත සඳහන් කරුනු ද වැදගත් ලෙස සැලකේ.

6. යම් ආයතනයක් හා එහි මහජනතාව අතර සම්බන්ධතා ගොඩනැගීමේ ක්‍රමවේදයක් වෙයි.

7. අන්‍යෝන්‍ය අවබෝධය සහ හොඳ හිත වර්ධනය කිරීමේ කලාව හෝ විද්‍යාව ලෙස හැඳින්වේ.

8. මහජන රුචිකත්වය සහ ආයතනික ප්‍රතිපත්ති ක්‍රියාත්මක විය යුතු ආකාරය හඳුනාගත හැකි ක්‍රමයක් වෙයි.

9. මහජනතාව යම් කරුණක් සන්නිවේදනය කරන ක්‍රමයකි.

සමුපකාර ව්‍යාපාරයේ ද ග්‍රාමීය බැංකුවක් සිය විකුණුම් සේවා පුළුල්කර ගැනීම සහ පවත්නා සබඳතා ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වෙයි. ඒ සඳහා සිය ව්‍යාපාරයට සම්බන්ධ මහජනතාව සමග සාර්ථක සම්බන්ධතාවක් ගොඩනගාගෙන පවත්වාගෙන යාම, ඒ සඳහා වඩා යෝග්‍යතම උපක්‍රම හඳුනාගැනීම සහ ක්‍රියාත්මක කළ යුතුබව මේ අනුව පෙනී යයි.

**ආශ්‍රිත ග්‍රන්ථ -**

මහජන සම්බන්ධතා - දර්ශන මාපා පතිරණගෙ

10

# සමුපකාර සමිතියක් දෙපයින් නැගී සිටිමට කොටස් ප්‍රාග්ධනය අවම වශයෙන් ප්‍රශස්ත මට්ටමින් වර්ධනය කරගත යුතුයි.

ජයලත් දිසානායක

ව්‍යාපාර ලෝකයේ ඕනෑම ව්‍යාපාරයක් ආරම්භ කිරිමට සහ ව්‍යාපාරය තරගකාරිව ඉදිරියට ක්‍රියාත්මක කිරිමට කාලීනව ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් අවශ්‍යව ඇත. සමුපකාර සමිතියක්ද ආරම්භ කිරිමට සහ ඉදිරියට ක්‍රියාත්මකව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් අවශ්‍යව ඇත. ගමේ කුඩා වෙලදසැළක් කරගෙන යන මුදලාලි මෙම තත්වය මුලින් අවබෝධකර ගෙන වෙලද සැල හොදින් තරගකාරිව පවත්වාගෙන යයි.

එදා එංගලන්තයේ රොච්ඩේල් පුරෝගාමින් 28 දෙනෙක් එකතුවී එක් සාමාජිකයෙක් පවුම් 1 බැගින් පවුම් 28 ආයෝජනය කර 1844 වර්ෂයේදි පාරිභෝගික සමුපකාර සමිතිය ආරම්භ කරන ලදී. එදා සිට අදට වර්ෂ 179 ඉක්මවා ගොස් ඇත. 1992 අංක 11 දරණ සංශෝධිත සමුපකාර සමිති පනතට අනුව සමුපකාර සමිතියක එක් සාමාජිකයෙකුගේ අවම කොටස් ප්‍රාග්ධනය රු.100 ලෙස සදහන් කර ඇත ශ්‍රී ලංකාවේ ඉහත කී පනත සංශෝධනය වී වසර 30ක් ඉක්මවා ඇත. අපේ රටේ නෛතික විධි විධාන කාලීනව වෙනස් නොවී ඇත. සමහර සමුපකාර සමිති රු.100 කොටස් කිපයක් ලබාගෙන කොටස් ප්‍රාග්ධනය වර්ධනය කරගෙන ඇත. තවත් සමහර සමුපකාර සමිති සාමාජිකයෙකු වීමට අවම කොටස් වටිනාකම රු.100 ඉක්මවූ වටිනාකමක් සමිතියේ අතුරු ව්‍යවස්ථාව තුළින් පිළිගෙන ඇත.

එදා 1995 එංගලන්තයේ මැන්චෙස්ටර්හිදි ඡාත්‍යන්තර සමුපකාර සංධානයේදි පිළිගත් සමුපකාර සමිති 7න් තෙවෙනි ප්‍රතිපත්තිය වන "සාමාජිකයන්ගේ ආර්ථික සහභාගිත්වය" පිළිබදව ප්‍රතිපත්තිය පිලිගෙන ඇත. එදා ලෝක සමුපකාර නායකයින් මෙම ප්‍රතිපත්තිය පුලුල් ලෙස සාකච්ඡා කර ඇත. මෙම ප්‍රතිපත්තිය තුළින් සමුපකාර සමිතියකට බැදුණු සාමාජිකයාගේ ආර්ථික සහභාගිත්වය සමිතිය පවත්වාගෙන යාමට ලබාදෙන ප්‍රමාණවත් දායකත්වය සහ සාමාජිකයා එම සමිතියට ලබාදෙන දායකත්වය තුළ ආර්ථික සහභාගිත්වය තුළ කරුණු විග්‍රහ කරගත හැකිය. ඒ අනුව සමුපකාර සමිතිය පවත්වාගෙන යාමට හැකි ප්‍රමාණවත් කොටස් ප්‍රාග්ධනයක් සාමාජිකයා විසින් සමිතියට ලබාදිය යුතු අතරම සමිතිය විසින් ප්‍රමාණවත් සාධාරණ පොළියක් (ලාභාංශයක්) සාමාජිකයාට ලබාදීය හැකිය.

ශ්‍රී ලංකාවේ සමුපකාර සමිතිවල මූල්‍ය තත්ව ප්‍රකාශයේ (ශේෂ පත්‍රයේ Balance sheet) හිමිකම් කොටස් විග්‍රහ කිරිමේදි අයිතිකරුවන්ගේ ඇල්ම හෙවත් කොටස් ප්‍රාග්ධන දායකත්වය විග්‍රහ කරගත හැකිය. 1995 අංක 15 දරණ ගිණුම් හා විගණන ප්‍රමිති පනතට අනුව සමුපකාර සමිතියක් සකස් කළ යුතු ගිණුම් ප්‍රකාශනයන් අනුව ස්කන්ධය වෙනස් විමේ ප්‍රකාශය සමුපකාර සමිතියක් විසින් සකස් කර කොමසාරිස්වරයාට ඉදිරිපත් කළයුතු වේ. සමහර සමුපකාර සමිති ගිණුම් ප්‍රමිත පනතට අනුව ගිණුම් ඉදිරිපත් කිරිම පිළිගෙන ඇත. ස්කන්ධය වෙනස් විමේ ප්‍රකාශය

පුළුල් ලෙස විග්‍රහ කිරීමේදී සාමාජික කොටස් වටිනාකම සමුපකාර සමිතියේ මුලු වත්කම් වටිනාකමින් 10% අවම දායකත්ව වටිනාකමක් තිබිය යුතු බව පිලිගෙන ඇත. එසේ වුවත් ශ්‍රී ලංකාවේ බොහෝ සමුපකාර සමිති ඉහත ප්‍රශස්ථ මට්ටම ළගා කරගෙන නැති බව නිරික්ෂණය විය.

සාමාජික කොටස්වල අවම දායකත්වයක් වටිනාකම නොමැති හෙයින් බොහෝ සමුපකාර සමිති පහත මූල්‍ය දුෂ්කරතා මෙන්ම සංවිධානයේ ගැටලුකාරී තත්වයන්ට මුහුණදෙති.

1. මූල්‍ය අවශ්‍යතා සදහා ණය ප්‍රාග්ධනය වශයෙන් බාහිර මූල්‍ය ආයතනවලින් ලබාගැනීම.

2. මූල්‍ය පොළී වියදම සමුපකාර සමිතිවලට දැරීමට සිදුවීම.

3. සමුපකාර සමිතියක් කෙටි කාලීන අයිරා ණය ලබාගැනීමට සිදුවීම තුළින් අධික අයිරා පොලියක් බාහිර පාර්ශවයන්ට ගෙවීමට සිදුවීම.

4. කලට වේලාවට නිසි මූල්‍ය තීරණ ගැනීමට නොහැකි වීම.

5. සාමාජික සේවාවන් සහ පාරිභෝගික සේවන් ලබාදීමට නොහැකි වීම.

6. සමුපකාර සමිතියේ අඛන්ඩ පැවැත්මට බලපෑමක් සිදුවීම.

7. ව්‍යාපාරයේ ශුද්ධ වත්කම්වල අඩුවීමක් සිදුවීම.

8. වගකීම් පියවීමට මූල්‍ය ශක්තියක් නොමැති වීම.

9. කාරක ප්‍රාග්ධන ඌණතාවයන් ඇතිවීම.

10. ප්‍රබල මානව සම්පත් ගැටලු මතුවීම.

මෙම ප්‍රාග්ධන අවශ්‍යතා සම්පූර්ණ කිරීමට පහත සදහන් උපාය මාර්ග කිපයක් මෙසේ ඉදිරිපත් කරමි.

- කවුරු කැමැති වුනත් නැතත් වර්තමාන සමුපකාර පනතේ ඇති අවම කොටස් වටිනාකම රු.1000/- කිරීම. එම වටිනාකම 100 කොටස් 10ක් ගෙවා කොටස් ප්‍රාග්ධන වටිනාකම සම්පූර්ණ කිරීමට සාමාජිකයාට අවස්ථාව ලබාදීම.
- සමුපකාර සමිතියේ ව්‍යාපාරික ධාරිතාව අනුව අතුරු ව්‍යවස්ථානුකූලව කොටස් ප්‍රාග්ධනය වැඩිකර ගැනීමට යෝජනා කරමි.
- සමුපකාර සමිතිවල සාමාජික නොවන තැන්පත් කරුවන් සාමාජික කර ගැනීමට සමුපකාර සමිතිවල නිසි ඉලක්ක වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම.
- සමුපකාර සමිතියක් විවිධ ණය කලඹ ක්‍රියාත්මකව ඇත. සාමාජිකයෙකුට ණයක් ලබාදීමේදී ලබාදෙන ණය මුදලට සාපේක්ෂව 0.5% කොටස් ප්‍රාග්ධන ලබාගැනීම.
- වෙනත් රටවල ක්‍රියාත්මක වන පරිදි සේවකයනගේ තනතුරුවලට අදාළව කොටස් ප්‍රාග්ධන දායකත්වයක් ලබාගැනීම.
- සමුපකාර සමිතියක අනුමත කොටස් වටිනාකම අනුව පත්වන කාරක සභාවට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වූ පසු ඔවුන්ගේ කොටස් ප්‍රාග්ධන වටිනාකම තනතුරට පත්වී

මාස 3 ඇතුළත තනතුරට සාපේක්ෂව කොටස් වටිනාකමක් වැඩිකර ලබාගැනීමට යෝජනා කරමි. උදා ් නැමැති සමුපකාර සමිතියේ සභාපතිවරයාගේ කොටස් ප්‍රාග්ධනය රු ලක්ෂයක් කිරිම. උප සභාපතිවරයාගේ කොටස් වටිනාකම රු.50000/- කිරිම. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජීක කොටස් වටිනාකම 25000/-ක් කිරිම. කුඩා සමිතිවල ඉහත දායකත්වය අඩු කොටස් වටිනාකමකින් සම්පුර්ණ කිරිමට ඔවුන්ගේ එකගතාවය ලබාගැනීම.

ඉන්දියාව වගේ රටක සමුපකාර සමිතිවලට මධ්‍යම රජය මගින් හෝ පළාත් සභා මගින් කොටස් ප්‍රාග්ධනය සමුපකාර සමිතිවලට යොදවා ඇති ආදර්ශය ලබාගෙන ක්‍රියා කිරිම.

- බොහෝ සමුපකාර සමිතිවලට කොටස් ප්‍රාග්ධනය වර්ධනය කරගැනීමේ කඩිනම් ඉලක්ක ගත වැඩ සටහනක් දියත් කිරිම කොටස් ප්‍රාග්ධන ඌනතා ඇති සමුපකාර සමිතිවල සමුපකාර නායකයින් විසින් කල යුතු බව පෙන්වා දෙමි. එමෙන්ම ඉහත පරිදි කොටස් ප්‍රාග්ධනය වර්ධන කිරිම සඳහා සමුපකාර සමිතිවල නායකයින් බල ගැන්වීම සමුපකාර සමිතිවලට මග පෙන්වන සංවිධාන විසින් කළ යුතු බව වැඩිදුරටත් පෙන්වා දෙමි.

- මෙම ලිපිය ප්‍රේක්ෂකයින්ගේ විවාදයකට තුඩුදිය හැකි නම් කොටස් ප්‍රාග්ධනය වර්ධනය කරගෙන සමුපකාර සමිති දෙපයින් නැගී සිටිමට ඔබේ යෝජණාද ඉදිරිපත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි

**11**

(උපුටා ගැනීම: සමුපකාර සිසු හැගුම්: ප්‍රථම කලාපය, 1958 මැයි-අගොස්තු

මං ලද අත්දැකීම්

# අර්ධ ශත සංවත්සරයක සමුපකාර දියුණුව දැමේ!



ආර්. බී. පරණගම විසිනි

එක්සාලීස් වසක සමුපකාර
ඉතිහාසයක් ඇති මේ කුඩා දිවයි
නේ නොඑක් ප්‍රදේශවල ගම්
වතීවල සමුපකාර සමිති බිහි
වෙද්දී බොහෝ දෙනා එයින් ප්‍රයෝ
ජන ලබද්දී කිසියම් පෙදෙසක
සමුපකාර යන ඉම්හිරි වචනය
පවා අසන්නට නොලැබෙන්නේ
නම් ඒ පුදුමයෙකි. මට හමු වූ
එවැනි අඳුරු පෙදෙසක තොර
තුරුය මෙහි එන්නේ.

ආර්ථික වශයෙන් ඉතා
දුප්පත් එපෙදෙසැ හොනා ජන
ගහනයක් ඇත. රට අභ්‍යන්තර
ය යෙහිවූ පළාතකට අයත් වූ
හෙයින් දෝ. එහි ගමනා ගමන
පහසුකම් ඉතා අඩුය. පාසලක
සිට තවත් පාසලකට සැතපුම්
අට නමයක දුරය. එහෙයින් ම
වයස අවුරුදු පහෙන් හයෙන්
පාසල් යන දරුවන්
එහි නැත. අවුරුදු
අටෙන් දහයෙන්
පාසල් යාම අරඹන දරුවෝ නියම
අධ්‍යාපනයක් නොලැබ එයින්
අස්වී ගොවිතැන ජීවිකා වෘත්තිය
කරගත් සිය වැඩිහිටියන් සමග
හේනට හෝ කුඹුරට බසිති. ඔව්හු
දිවා රෑ දෙක්හි ගොවිතැන ගැනම
වෙහෙසෙති. වියළි කලාපය ට
අයත් එහි පස සරුය. කලට
වැසි ලැබුණොත් ගොඩමඩ ගොවි
තැනින් සෑහෙන අස්වැන්නක්
නොලැබෙන්නේ නොවේ
එහෙත් ඔවුන් නිපද
වන ගොවිද්‍රව්‍ය සාධාර
ණ මිලකට අලෙවි කර ගැනීමේ
පහසුකම් එහි නැත. ඒවා අලෙවි
කර ගැනීමට ඇති එකම මග ඉඩෝ
හෝ බද්දා වෙළඳාම් නොලැයි.

බඩු මිළදී ගැනීමට එහි පැමිණෙන වෙළෙන්දන් ගොවීන් නිපදවන ද්‍රව්‍ය ගෙනයන්නේ ඉතා අසාධාරණ මිල ගණන් වලට බව පරීක්ෂාකාරීව බලන අපට පෙනේ. වෙළෙන්දන් ඉල්ලූ මිලකට දෙනවා විනා වෙන කළ හැකි දෙයක් නැත යනු ඔවුන්ගේ අවසාන නිගමනයවූවා මෙනි. ඉතා දුකසේ ගොවිතැනින් ද්‍රව්‍ය නිපදවන ගොවීන් හැමදා ණය බරින් මිරිකෙත්දී ඔවුන්ගේ ද්‍රව්‍ය මිලදී ගන්නන් දිනෙන් දින දියුණු වන බව පෙනේ.

අසරණ ගොවි ජනතාව මෙසි වෙළෙන්දාට සදා ණයගැතිය. හේන් ගොවිතැනින් හෝ කුඹුරු ගොවිතැනින් අස්වැන්න ලැබෙන තෙක් ගමේ සිල්ලර කඩකාරයාගෙන් ඔව්හු ණය ගනිති. යැපීමට අවශ්‍ය දේ මෙන්ම නිපදවීමට අවශ්‍ය දේ ද ණයට ලබාගනිති. අවශ්‍ය දේ ද්‍රව්‍ය වලින් දෙනවා මිස වෙළෙන්දා මුදලින් ණය දෙන්නේ කලාතුරකිනි. ඒ කෙසේ ණය දුන්නත් මේ හැම ණය මුදලක්ම නිපදවන ද්‍රව්‍ය වලින් විශේෂයෙන් වී අස්වැන්නෙන්ම ආපසු ලබාගැනීමට ගමේ සිල්ලර වෙළෙන්දා පසුබටවන්නේ නැත. තමන් ලැබූ අස්වැන්න ණය වෙනුවෙන් කඩකාරයාට නොදෙවා සිටීම සිදු නොවන්නේ ඊළඟ වප් යේ යැපීම හා ගොවිතැන් කිරීම සඳහා ණය ලබාගැනීමට ඇති එකම මඟ ගමේ කඩකාරයා බව ඔවුන් දන්නා හෙයිනි.

කෙසේ හෝ තමන් ලැබූ අස්වැන්න ණය පියවීමට දී තවත් ණය ඉතුරු වෙද්දී හිස් අතින් ගෙවලට යන ගොවීන් එහි එමටය. ඉතාමත් අසාධාරණ මිලගණන් වලට එදිනෙදා අවශ්‍යවන ආහාරද්‍රව්‍ය සපයන මෙසි වෙළෙන්දන්ගේ ක්‍රියා කලාපය හෙලාදුටු එක්තරා පිරිසක් එපෙදෙසෙහි සමුපකාර කඩ සමිතියක් ආරම්භ කිරීමට දැනට අවුරුදු අටකට පමණ ඉහත දැරූ ප්‍රයත්නය සිහිනයක් බඳු විය. ආත්මාර්ථකාමී වෙළෙන්දෝ ඔවුන්ගේ එම ප්‍රයත්නය ලෙහෙසියෙන්ම කඩාකප්පල්කර දැමූහ.

එහෙත් වැඩි කලක් ගෙවී යන්නට ප්‍රථම ගොවීන් ඉතා ස්වල්ප දෙනෙකුට තමන් නිපදවන ද්‍රව්‍ය සඳහා ලැබෙනමිල සාධාරණ නොවන බව පෙනෙන්නට විය. වරෙක් අධෛර්යයට පත් ඔවුන්ට කිසිවකුගේ මඟපෙන්වීමක් නොවූයෙන් නැවතරටත් ඉවසා සිටින්නට සිදුවිය. මෙහිදී රජයේ එක්තරා උසස් නිලධාරියෙකුගේ මඟ පෙන්වීම ඔවුන්ට විශේෂ වරප්‍රසාදයක් විය. ඔහු සමුපකාර නිලධාරියෙකු නොවේ. එහෙත් සාමාජිකවරුන් සුළු ගණනකින් ගොවිද්‍රව්‍ය නිපදවීමේ හා අලෙවි කිරීමේ සමුපකාර සමිතියක් ඇති කිරීමට ඔහු සමත් විය. රජයේ සහතික මිල යෝජනා ක්‍රමයද ක්‍රියාත්මක වූයෙන් මෙම සමිතිය ඉතා ශීඝ්‍ර වශයෙන් දියුණු විය. එසේ

පුරුදු පරිදි පුද්ගලික වෙළෙන්දන්ගේ බලපෑම් වලින් මිදෙන්නට හෝ ඔවුන් සමග පැවති සදා ණය ගැති තත්වයෙන් මිදෙන්නට හෝ තවමත් නොහැකිව ගොවියෝ ළතැවෙති.

ප්‍රදේශය තුළ සිටින වෙළෙන්දෝ ආර්ථික සේවාවක් කරනා මුවාවෙන් දුප්පත් ගොවීන්ගේ ශ්‍රම ශක්තියෙන් අයුතු ප්‍රයෝජන ලබති. මෙසේ ගොවීන් සදා ණය ගැති වීමට ප්‍රධාන හේතුව යැපීමට අවශ්‍ය දේ සඳහා අධික මිලක් ගෙවීමට සිදුවීමත් ඔවුන්ගේ ගතානුගතිකත්වයත්ය. සමුපකාර සමිති පහළොහක් හෝ විස්සක් පමණ ඇති කිරීමට තරම් සෑහෙන එපෙදෙසෙහි දැනට ඇත්තේ අර්ධ වශයෙන් ක්‍රියාත්මකවූ ලදරුවියේ එකම ණයදෙන සමිතියක් හා ක්‍රියාත්මක නොවූ ණයදෙන සමිති දෙකකුත් අන්ත පිරිහීමට පත් එකම කඩ සමිතිය තුත්ය.

[illegible] ප්‍රථම නිවාඩුවාලත් ගොවිද්‍රව්‍ය නිපදවීමේ හා අලෙවි කිරීමේ සමුපකාර සමිතිය වේ නොබෝදා, විවිධසේවා සමුපකාර සමිතියක් හැටියට පරිවර්තනය කළ අතර තවත් එකම විවිධ සේවා සමුපකාර සමිතියක් එහි ආරම්භ කරන ලදී. ආර්ථික තත්වයෙන් හා අධ්‍යාපන තත්වයෙන් ගුණහීන වීමෙන්ම නිපදවන දෙය ඉතා අඩු මිලකට විකුණමින් යැපීමට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය නියම මිලකට හොඳ තත්වයෙන් ලබා ගැනීමට නොහැකිව ඒ සඳහා අසාධාරණ මිල ගණන් ගෙවමින් තුළ වෙළෙන්දන්ට සදා ණයගැති ව ජීවිතයත් මරණයත් අතර බලවත් සටනක් කරන ගොවීන්ගෙන් පිරි මෙවැනි පෙදෙස් වල සමුපකාර කටයුතු පතළ කර හැරීමටත් එමගින් ඔවුන් එම අනාථ දුගී තත්වයෙන් මුදවා ගැනීමටත් රජයේත් විශේෂයෙන් සමුපකාර දෙපාර්තමේන්තුවේත් මගපෙන්වීම අවශ්‍ය බව මගේ හැඟීමයි.

එහි සමුපකාර සමිති ඇති කළත් ඒවා පවත්වාගෙන යාමට තරම් දැනීමක් ඇති පුද්ගලයින් සොයා ගැනීම පවා පහසු නොවේ. ඒ කෙසේ වුවද සමුපකාර ක්‍රම මෙරට ආරම්භවී පනස් වර්ෂයක් පමණ ගෙවී ගියමුත් එයින් එපෙදෙස ජනයාගේ ආර්ථික සමාජ තත්වයේ කිසිදු දියුණුවක් ඇතිවී නැති බව මගේ අත්දැකීමයි.

—— // ——